# 8

# මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව

## 8.1 සමස්ත නිරීක්ෂණ

2017 වසරේ දී අනුගමනය කෙරුනු විචක්ෂණශීලි ක්‍රියාමාර්ග හේතුවෙන් මූල්‍ය පද්ධති ස්ථායිතාව අඛණ්ඩව පවත්වා ගැනීම සමඟම මූල්‍ය අංශයේ වැඩිදියුණු වූ කාර්ය සාධනයක් දක්නට ලැබුණි. මෙම ඉහළ කාර්ය සාධනය පුළුල්ව ව්‍යාප්ත වූ අතර, ඒ සඳහා බැංකු, තැන්පතු බාර ගන්නා අනෙකුත් ආයතන සහ ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන ප්‍රධාන වශයෙන්ම දායක වන ලදී.

වසර තුළදී කාලෝචිත සහ යෝග්‍ය නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ වැඩිදියුණු වූ අවදානම් කළමනාකරණ ක්‍රමවේද හා ව්‍යාපාර මෙහෙයුම් යොදා ගැනීම තුළින් බැංකු අංශය අඛණ්ඩව ප්‍රසාරණය විය. දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය සහ එමගින් ඇති කළ ඉහළ වෙළෙඳපොළ පොලී අනුපාතිකවල ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශයේ වත්කම් වර්ධනය වසරේ දෙවන භාගයේදී මන්දගාමී වුව ද, ඉහළ අගයක පැවතියේය. තවද, අක්‍රීය ණය අනුපාතවල පහත වැටීමත් සමඟ බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ ගියේය. මෙම අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතික සහ ද්‍රවශීලතා අනුපාතික යහපත් මට්ටම්වල පැවතියේය. බැංකු අංශයේ ප්‍රසාරණය සඳහා තැන්පතු මගින් අරමුදල් රැස් කළ අතර මෙම කාලපරිච්ඡේදය තුළ දී ණය ගැනීම්වල සිදුවූ සැලකිය යුතු අඩු වීම හේතුවෙන් බැංකු අංශයේ අවදානම් දරාගැනීමේ හැකියාව වර්ධනය විය. පද්ධතියේ ඇති විය හැකි අවදානම් අවම කර ගැනීමට අවශ්‍ය වන සම්පත්වල ඉහළ යෑම පිළිබිඹු කරමින්, වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ මගින් නිරූපණය වූ බැංකු අංශයේ ලාභදායිත්වය ද ඉහළ ගියේය. සමස්තයක් ලෙස ගත් කල, වැඩිදියුණු වූ බැංකු සේවා සහ වැඩි පාරිභෝගික ප්‍රජාවක් වෙත සේවා සපයමින් රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නංවමින් සිදු වූ බැංකු ශාඛාවල ව්‍යාප්තිය පුළුල් වීම හරහා ආර්ථික සංවර්ධනයට බැංකු අංශය අඛණ්ඩව දායක විය.

අඩු ණය වර්ධනය, පහළ ලාභදායිත්වය සහ ඉහළ යන අක්‍රීය ණය මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්ය සාධනය මන්දගාමී විය. රථ වාහන ආනයනය අඩු කිරීමට ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය සහ සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ආර්ථිකයේ සිදුවූ මන්දගාමී වර්ධනය සහ 2017 වසර තුළදී පැවති ගංවතුර හා නියං තත්ත්ව වැනි ස්වාභාවික ව්‍යසන මෙම මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ ලාභදායිත්වය ඇතුළුව මෙම අංශයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක ධනාත්මකව පැවතුණි. දුර්වල මූල්‍ය තත්ත්ව සහිත සමාගම් නඟා සිටුවීම පිළිබඳව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන විචක්ෂණ ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. තැන්පතුකරුවන් සහ මූල්‍ය අංශයේ දිගු කාලීන ස්ථායිතාව සුරක්ෂිත කිරීමේ අරමුණින් පීඩාවට පත් මුදල් සමාගම් වසා දැමීමට හෝ ඒවායේ මූල්‍ය ව්‍යාපාර කටයුතු සීමා කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. සිය සාමාජිකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දෙමින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල ප්‍රමුඛ ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. රක්ෂණ අංශය, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික

අලෙවිකරුවන් සහ ඒකක භාර අංශය ඇතුළු මූල්‍ය අංශයේ අනෙකුත් උප අංශ ස්ථායිතාව සම්බන්ධ සැලකිය යුතු ගැටලුවලින් තොර ධනාත්මක ව්‍යාපාර කාර්ය සාධනයක් වාර්තා කරන ලදී.

වෙනස්වන දේශීය හා විදේශීය ආර්ථික තත්ත්ව අනුව හැඩ ගැසෙමින් මූල්‍ය වෙළෙඳපොළවල් 2017 වසරේදී වෙනස්වන සුලු ස්වාභාවයක් දැක්වීය. වසරේ පළමු භාගයේදී ක්‍රමයෙන් පහත වැටුණු මුදල් වෙළෙඳපොළේ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව වසරේ දෙවන භාගය තුළ දී ඉහළ අගයක් ගන්නා ලදී. වෙනස්වන ද්‍රවශීලතා තත්ත්ව හේතුවෙන් කෙටි කාලීන පොලී අනුපාතික මත ඇතිවන අනවශ්‍ය පීඩනය ක්‍රියාකාරී විවට වෙළෙඳපොළ කටයුතු හරහා මහ බැංකුව විසින් අවම කරන ලදී. විනිමය අනුපාතිකය තීරණය කිරීම සම්බන්ධයෙන් වැඩි නම්‍යශීලීතාවයක් ලබා දීමත් සමඟ වසර තුළදී එ. ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය විය. ඇමෙරිකානු එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීම සම්බන්ධයෙන් පැවති අපේක්ෂා සමඟ රජයේ භාණ්ඩාගාර සුරැකුම්පත්වල සිදු කර තිබූ විදේශීය ආයෝජන මෙරටින් ආපසු ගලායෑම 2017 වසරේ පළමු මාස කිහිපයක තුළ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට හේතු විය. කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත්වල සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ විදේශ ආයෝජන ඉහළ යෑම සහ අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවට විස්තීර්ණ ණය පහසුකම තවදුරටත් ලබාදීම හේතුවෙන් වසරේ දෙවන භාගයේදී මෙම අවප්‍රමාණය වීමේ ප්‍රවණතාව වෙනස් විය. රටෙහි ආර්ථික ක්‍රියාකාරකම් ඵලදායීව සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා ගෙවීම්වල පහසුව සහ සුරක්ෂිතභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ගෙවීම් සහ පියවීම් පද්ධති කාර්යක්ෂමව සහ පද්ධතිමය බාධාවකින් තොරව ක්‍රියාත්මක විය. ජාතික ගෙවීම් පද්ධතියේ නියාමකයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වසර තුළදී නියාමන සහ අධීක්ෂණ කටයුතු පුළුල් කරන ලදී. ගෙවීම් සහ පියවීම් පද්ධති ආශ්‍රිත අවවදානම් අවම කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහ ශක්තිමත්භාවය තහවුරු කරලීම මෙහි අරමුණ විය.

ශ්‍රී ලාංකීය මූල්‍ය අංශයේ සුරක්ෂිතභාවය සහ අවදානම් දරා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් විචක්ෂණ ක්‍රියාමාර්ග හඳුන්වාදෙමින් මූල්‍ය පද්ධතියට බල පැවැත්වෙන නියාමන රාමුව වසර තුළදී තවදුරටත් ශක්තිමත් කරන ලදී. විනිවිදභාවය, ප්‍රාග්ධන අවශ්‍යතා, මූල්‍ය පහසුකම් සඳහා ඇති ඉඩප්‍රස්තා, ද්‍රවශීලතා සහ අවදානම් කළමනාකරණ රාමු වැඩිදියුණු කිරීම මෙම විචක්ෂණ ක්‍රියාමාර්ගවල ප්‍රධාන අරමුණු විය. මීට අමතරව, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවට



**8.1 සංඛ්‍යා සටහන**

**මූල්‍ය අංශයේ සමස්ත වත්කම්**

| | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය | රුපියල් බිලියන | ප්‍රතිශතය |
| බැංකු අංශය | **10,575.8** | **69.5** | **11,897.4** | **69.8** |
| මහ බැංකුව | 1,529.2 | 10.1 | 1,604.8 | 9.4 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 7,843.3 | 51.5 | 8,926.4 | 52.3 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 1,203.2 | 7.9 | 1,366.2 | 8.0 |
| තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | **1,246.7** | **8.2** | **1,370.4** | **8.0** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,112.1 | 7.3 | 1,227.5 | 7.2 |
| සමූපකාර ග්‍රාමීය බැංකු | 122.2 | 0.8 | 132.7 | 0.8 |
| සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති | 12.4 | 0.1 | 10.2 | 0.1 |
| විශේෂිත මූල්‍ය ආයතන | **335.4** | **2.2** | **388.9** | **2.3** |
| විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | 99.8 | 0.7 | 127.5 | 0.7 |
| ප්‍රාථමික අලෙවිකරුවන් (ඇ) | 77.1 | 0.5 | 77.3 | 0.5 |
| කොටස් තැරැව්කරුවන් | 10.1 | 0.1 | 9.1 | 0.1 |
| ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම් | 106.7 | 0.7 | 131.7 | 0.8 |
| වෙළෙඳපොළ අතරමැදියන් (ඈ) | 30.8 | 0.2 | 28.7 | 0.2 |
| ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් | 11.0 | 0.1 | 14.6 | 0.1 |
| ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන | **3,058.1** | **20.1** | **3,395.8** | **19.9** |
| රක්ෂණ සමාගම් | 521.4 | 3.4 | 559.2 | 3.3 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,841.5 | 12.1 | 2,066.3 | 12.1 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 248.9 | 1.6 | 279.0 | 1.6 |
| අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් | 398.6 | 2.6 | 437.3 | 2.6 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 47.7 | 0.3 | 53.9 | 0.3 |
| **එකතුව** | **15,261.0** | **100.0** | **17,052.5** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකක බලපත්‍රලාභී වාණිජ බැංකු යටතේ වාර්තා වන බැවින් එම ඒකකවල වත්කම් ඇතුළත් කර නොමැත.
(ඈ) ආයෝජන කළමනාකරුවන්, ආන්තික සැපයුම්කරුවන්, ප්‍රාරක්ෂකයින් සහ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
සණස මහා සංගමය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්

අහිතකර බලපෑමක් නොවන පරිදි පීඩාවට පත් මුදල් සමාගම්වල ගැටලු නිරාකරණය කඩිනම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

## 8.2 බැංකු අංශයේ කාර්ය සාධනය

මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 60.3 ක ප්‍රමාණයක් පවත්වා ගනිමින් බැංකු අංශය තවදුරටත් ප්‍රමුඛස්ථානයක පවත්වා ගත් අතර එහි කාර්ය සාධනය 2017 වසර තුළදී ශක්තිමත්ව පැවතුණි. කාලානුරූපී සහ සුදුසු නියාමන ක්‍රියාමාර්ග දියත් කිරීම

සහ වැඩිදියුණු කරන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග යොදා ගැනීම, අවදානම් (ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ අනෙකුත්) පාලනය කළ හැකි මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය. තවද, එවැනි විචක්ෂණ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස අනවශ්‍ය ලෙස ණය සංකේන්ද්‍රණය අඩු වූ අතර, බැංකු අංශයේ මෙහෙයුම් කාර්ය සාධනය සහ අවදානම් දරා ගැනීමේ හැකියාව තවදුරටත් වර්ධනය විය. ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම තුළින් බැංකු අංශයේ වත්කම්වල වර්ධනය වසරේ මුල් භාගයේදී වේගවත් වූ අතර, දෙවන භාගය වනවිට එය ක්‍රමයෙන් මන්දගාමී ස්වභාවයක් පෙන්විය. වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු වීම නිසා අක්‍රිය ණය අනුපාත පහළ යෑමක් දක්නට ලැබුණි. 2017 වසරේ බැංකු අංශයේ ලාභදායිත්වය පෙර වසරට සාපේක්ෂව ඉහළ යෑම වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ යන අනුපාත දෙකෙහි වර්ධනය තුළින් පිළිබිඹු කෙරුණි. සමස්තයක් ලෙස ගත්කල මෙම වසර පුරා ප්‍රමාණවත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවරෝධක පවත්වා ගනිමින් බැංකු අංශය ක්‍රියාත්මක විය.

## ව්‍යාපාර වර්ධනය

**(අ) ව්‍යාප්තිය:** 2017 වසර අවසානය වනවිට බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු 25 කින් සමන්විත වූ අතර, එය විදේශීය බැංකු ශාඛා 12 ක් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 ක් ද ඇතුළත් විය. බැංකු අංශ සිය ශාඛා ජාලය දිවයින පුරා ව්‍යාප්ත කර ගනිමින්, මූල්‍ය පහසුකම් සඳහා ඇති ප්‍රවේශයන් වැඩිකර ගනිමින් අඛණ්ඩව ආර්ථික වර්ධනය වෙනුවෙන් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය සඳහා වසර පුරා දායක විය. මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සඳහා 2017 වසර තුළදී තාක්ෂණිකමය උපකරණ/සේවාවන් බැංකු කිහිපයක් විසින් හඳුන්වා දෙන ලදී. තවද, නව බැංකු ඒකක 43 ක් (ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර) සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 684 ක් පිහිටවූ අතර, ඒ අනුව 2017 වසර අවසානය වනවිට බැංකු අංශය, බැංකු ව්‍යාපාර 6,227 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4,416 ක් දක්වා ඉහළ නැංවුණි.

**(ආ) වත්කම්:** බැංකු අංශයේ වත්කම් පදනම 2017 වසර අවසානය වනවිට රුපියල් ට්‍රිලියන 10 ඉක්මවමින් සියයට 13.8 ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එකී වර්ධනය 2016 වසරේ වාර්තා වූ සියයට 12.0 හා සැසඳීමේදී වැඩි අගයක් විය. 2016 වසරේදී පහත වැටුණු වත්කම්වල වර්ධනය 2017 වසරේ පළමු මාස 6 තුළදී ඉහළ ගිය නමුත් 2017 අවසන් කාර්තුවේදී මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වන ලදී. ණය හා අත්තිකාරම්වල

**8.2 සංඛ්‍යා සටහන**

**බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය**

| වර්ගීකරණය | 2016 අවසානයට (අ) | 2017 අවසානයට (ආ) |
|---|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | | |
| i. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව | **25** | **25** |
| දේශීය බැංකු | 13 | 13 |
| විදේශීය බැංකු | 12 | 12 |
| ii. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව | **5,397** | **5,508** |
| ශාඛා (ඇ) | **2,841** | **2,869** |
| දේශීය බැංකු | 2,788 | 2,816 |
| විදේශීය බැංකු | 53 | 53 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | **2,556** | **2,639** |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **3,531** | **4,083** |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | | |
| i. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව | **7** | **7** |
| ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු | 1 | 1 |
| ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකු | 1 | 1 |
| නිවාස ණය ආයතන | 2 | 2 |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 3 | 3 |
| ii. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව | **710** | **719** |
| ශාඛා (ඇ) | **683** | **691** |
| ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු | 265 | 265 |
| ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකු | 255 | 259 |
| නිවාස ණය ආයතන | 63 | 64 |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 100 | 103 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | **27** | **28** |
| මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **320** | **333** |
| බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව | **6,107** | **6,227** |
| මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | **3,851** | **4,416** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ධනය මුළු වත්කම්වල වර්ධනයට මූලික වශයෙන් බලපෑ අතර එය 2017 අවසානය වනවිට මුළු වත්කම් වලින් සියයට 62.5 ක අගයක් ගන්නා ලදී. 2017 මාර්තු මසදී අනුගමනය කල දැඩි මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම එම වසර අගදී ණය වර්ධනයෙහි මන්දගාමීත්වය මගින් පෙන්නුම් කෙරුණි. 2017 වසරේ මුල් භාගයේදී ණය වර්ධනය ස්ථායී අගයක් ගනිමින් 2016 වසර අග සිදුවූ සියයට 17.5 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ ජුනි මස වනවිට සියයට 20.1 ක වර්ධනයක් පෙන්නුම් කල අතර එය 2017 වසර අවසානයේදී සියයට 16.1 ක මන්දගාමී අගයක් ගන්නා ලදී. 2017 වසර තුළ ණය හා අත්තිකාරම්, ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ වෙත ප්‍රදානය කර ඇත. අත්තිකාරම්වල වැඩිවීම මූලික වශයෙන් නිෂ්පාදන (සියයට 21.9), වෙළෙඳ (සියයට 19.8), ඉදිකිරීම් (සියයට 19.5) හා පාරිභෝජන හා වෙනත් (සියයට 15.8) යන අංශ වෙත යොමු වී ඇත. බැංකු කටයුතු වර්ග අනුව සළකා බැලීමේදී, කාලීන ණය හා අයිරා පිළිවෙළින් සියයට 16.5 කින් හා සියයට 21.2 කින් වර්ධනය වූ අතර, එය මුළු ණයවල සිදුවූ

8

**8.3 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය**

| අයිතමය | 2016 (අ) | | 2017 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය | රුපියල් බිලියන | ප්‍රතිශතය | 2016 (අ) | 2017 (ආ) |
| **වත්කම්** | | | | | | |
| ණය සහ අත්තිකාරම් | 5,540.8 | 61.2 | 6,430.9 | 62.5 | 17.5 | 16.1 |
| ආයෝජන | 2,270.5 | 25.1 | 2,554.4 | 24.8 | -3.3 | 12.5 |
| වෙනත් (ඇ) | 1,235.3 | 13.7 | 1,307.3 | 12.7 | 21.8 | 5.8 |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | 6,295.6 | 69.6 | 7,399.0 | 71.9 | 16.5 | 17.5 |
| ණය ගැනුම් | 1,696.4 | 18.8 | 1,607.1 | 15.6 | -3.5 | -5.3 |
| ප්‍රාග්ධන අරමුදල් | 707.3 | 7.8 | 867.0 | 8.4 | 11.1 | 22.6 |
| වෙනත් | 347.3 | 3.8 | 419.6 | 4.1 | 24.4 | 20.8 |
| **මුළු වත්කම්/වගකීම්** | **9,046.6** | **100.0** | **10,292.6** | **100.0** | **12.0** | **13.8** |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ධනයට පිළිවෙළින් සියයට 58.4 කින් හා සියයට 17.3 කින් දායක විය. කල් බදු පහසුකම් 2016 වසරේ උකස් ණය කළඹෙහි වූ සියයට 2.4 ක පහත වැටීමට සාපේක්ෂව 2017 වසරේ සියයට 15.2 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කල් බදු පහසුකම්, 2016 වසරේ ජනවාරි මස හඳුන්වා දුන් ණය වටිනාකම් අනුපාතය හේතුවෙන් 2015 වසරේ වාර්තා වූ සියයට 52.9 ක ඉහළම වර්ධනය 2016 වසර අවසානය වනවිට සියයට 3.3 කට අඩු වූ අතර එය 2017 වසරේ දී සියයට 5.8 කින් වර්ධනය විය. 2016 වසරේ දී සියයට 3.3 කින් පහත වැටුණු ආයෝජන 2017 වසරේ දී සියයට 12.5 කින් වැඩිවූ අතර එයද මෙම වසරේ වත්කම්වල සිදුවූ වර්ධනයට දායක විය. 2017 වසර තුළදී කල්පිරෙන තෙක් රඳවා ගන්නා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන හා ගනුදෙනු කිරීමේ අරමුණින් පවත්වා ගන්නා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන පිළිවෙළින් රුපියල් බිලියන 91 කින් හා රුපියල් බිලියන 122 කින් වැඩිවී ඇත. ඒ අතර, 2017 වසර තුළදී කල් පිරෙන තෙක් රඳවා ගන්නා භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 16 කින් වැඩිවූ අතර ගනුදෙනු කිරීමේ අරමුණින් පවත්වා ගන්නා භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 9 කින් අඩුවිය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන, සලකා බලන වසර තුළදී රුපියල් බිලියන 67 කින් වැඩිවී ඇත. මෙම වසර තුළදී මුදල් හා බැංකු වලින් අයවිය යුතු අගයන් රුපියල් බිලියන 35 කින් (සියයට 3.5 කින්) වැඩිවී ඇත.

**(ආ) වගකීම්:** බැංකු අංශයේ වගකීම් පදනම ප්‍රධාන වශයෙන් තැන්පතු හා ණය ගැනීම් වලින් සමන්විත වූ අතර 2017 වසර අවසානය වනවිට තැන්පතු හා ණයගැනීම් පිළිවෙළින් බැංකු අංශයේ සමස්ත අරමුදල් සම්පාදනයෙන් සියයට 71.9 ක් සහ සියයට 15.6 ක් විය.

8

**8.4 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයේ තැන්පතු සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) | 2016 (අ) | 2017 (ආ) |
| ඉල්ලුම් තැන්පතු | 479.2 | 496.0 | 7.6 | 6.7 |
| ඉතුරුම් තැන්පතු | 1,858.1 | 2,032.3 | 29.5 | 27.5 |
| ස්ථාවර තැන්පතු | 3,812.5 | 4,704.3 | 60.6 | 63.6 |
| වෙනත් තැන්පතු | 145.8 | 166.4 | 2.3 | 2.2 |
| **මුළු තැන්පතු** | **6,295.6** | **7,399.0** | **100.0** | **100.0** |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2016 වසර අවසානය වනවිට සියයට 16.5 ක පැවති වාර්ෂික ගනුදෙනුකාර තැන්පතු වර්ධන වේගය 2017 වසර මුල් භාගය තුළ වැඩි වර්ධන වේගයක් පවත්වා ගනිමින් 2017 ජුනි මස අග වන විට සියයට 20.6 ක් දක්වා වර්ධනය වූ අතර, 2017 වසර අවසානය වන විට තැන්පතු වර්ධන වේගය සියයට 17.5 ක අගයක පැවතුණි. 2017 වසර තුළ දී කාලීන තැන්පතු මුළු තැන්පතුවල ප්‍රතිශතයක් ලෙස 2016 වසර අවසානයේ පැවති සියයට 60.6 සිට 63.6 දක්වා ඉහළ ගිය අතර ඉතුරුම් තැන්පතු මුළු තැන්පතු වල ප්‍රතිශතයක් ලෙස 2016 වසර අග පැවති සියයට 29.5 සිට සියයට 27.5 දක්වා පහළ ගොස් ඇත. කෙසේ වෙතත්, කාලීන තැනපතුවල වාර්ෂික වර්ධනය 2016 වසර අවසානයේ පැවති සියයට 23.8 සිට 2017 වසර අවසානය වනවිට සියයට 23.4 දක්වා පහළ ගොස් ඇති අතර ඉතුරුම් තැන්පතුවල වාර්ෂික වර්ධනය 2016 වසර අවසානයේ වාර්තා කළ සියයට 7.4 සිට 2017 වසර අවසානය වන විට සියයට 9.4 දක්වා ඉහළ ගොස් ඇත. පොලී අනුපාතික ඉහළ යෑම හේතුවෙන් ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය 2016 වසර අවසානයේ පැවති සියයට 37.1 සිට 2017 වසර අවසානය වන විට සියයට 33.2 දක්වා අඩු වී ඇත. 2017 වසර තුළදී දේශීය මුදල් වලින් ණය ගැනීම් රුපියල් බිලියන 66 (සියයට 9.9) කින් අඩු වූ අතර විදේශීය මුදල් වලින් ණය ගැනීම් එ. ජ. ඩොලර් මිලියන 290.7 (සියයට 4.2) කින් අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසර අවසානය වනවිට සමස්ත ණය ගැනීම් අගය රුපියල් බිලියන 1,607 ක් දක්වා (සියයට 5.3) කින් අඩු විය.

**(ඇ) ශේෂ පත්‍ර නොවන අනාවරණ:** විදේශ විනිමය ඉදිරි ගනුදෙනුවල පහළ යෑම නිසා බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අනාවරණවල වාර්ෂික වර්ධනය 2016 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 9.1 සිට 2017 වසර අවසානය වන විට සියයට 5.6 කින් රුපියල් බිලියන 3,874 දක්වා පහත වැටුණි. ශේෂ පත්‍ර නොවන අනාවරණවලට විශාලතම දායකත්වය දැක්වූයේ ණයවර ලිපි වන අතර, එහි දායකත්වය සියයට 28.5 ක් ලෙස වාර්තා විය. විදේශ විනිමය මිලදී ගැනුම් (සියයට 17.9) හා විදේශ විනිමය විකුණුම් (සියයට 13.8) ලෙස ශේෂ පත්‍ර නොවන අනාවරණවලට සියයට 31.7 කින්

**8.1 රූප සටහන**

**බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2017 අවසානයට)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.2 රූප සටහන**

**බැංකු අංශයේ අක්‍රීය ණය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

දායක විය. ඇපකර හා බැඳුම්කර, ණයවර ලිපි, ප්‍රතිග්‍රහණ සහ ව්‍යුත්පන්න, ඉතිරි ශේෂ පත්‍ර නොවන අනාවරණ වලට දායකත්වය දැරීය. විදේශ විනිමය අනාවරණ සහ ව්‍යුත්පන්න පිළිවෙළින් රුපියල් බිලියන 32 (සියයට 2.6) කින් හා රුපියල් බිලියන 8.7 (සියයට 48.6) කින් පහත වැටුණු අතර, ඉතිරි සියලු ශේෂ පත්‍ර නොවන අනාවරණ, 2017 වසර තුළදී වර්ධනය විය.

## බැංකු අංශයේ අවදානම්

**(අ) ණය අවදානම:** 2017 වසරේ වාර්තා වූ අක්‍රීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 18.3 කින් ඉහළ යෑම මධ්‍යයේ වුවද, බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවයේ වර්ධනයක් දළ අක්‍රීය ණය අනුපාතය 2016 වසරේදී තිබූ සියයට 2.6 අගයේ සිට 2017 වසරේ අග වනවිට සියයට 2.5 දක්වා පහත වැටීම මගින් පිළිබිඹු විය. 2017 වසරේදී අක්‍රීය ණය සඳහා වූ මුළු වෙන්කිරීම් රු. බිලියන 10 කින් වර්ධනය වූ අතර ඉන් සියයට 55.3 ක්ම විශේෂිත වෙන්කිරීම් සඳහා විය. අක්‍රීය ණයවල වර්ධනය නිසා, විශේෂිත වෙන්කිරීම් හා මුළු වෙන්කිරීම් ආවරණ අනුපාත, 2016 වසරේදී පැවති සියයට 52.1 හා සියයට 71.8 සිට 2017 වසරේදී පිළිවෙළින් සියයට 49.6 ක් සහ සියයට 69.9 ක් දක්වා පහත වැටුණි.

2017 වසරේදී බැංකු අංශයේ ණය කළඹ, ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවලට විසිරී තිබුණි. 2017 වසර අවසානය වනවිට පරිභෝජන හා වෙනත් (සියයට 20.7), ඉදිකිරීම් (සියයට 18.4), වෙළෙඳ (සියයට 14.5), නිෂ්පාදන (සියයට 11.2) සහ කෘෂිකර්ම හා ධීවර (සියයට 8.6) යන ප්‍රධාන ක්ෂේත්‍ර පහකට මුළු ණය ප්‍රමාණයෙන් සියයට 70 කට වැඩි ප්‍රතිශතයක් ලබා දී තිබුණි.

**(ආ) වෙළෙඳපොළ අවදානම**

**පොලී අනුපාතික:** 2017 වසරේ දෙවන භාගය තුළ භාණ්ඩාගාර බැඳුම්කර එළදා අනුපාතික අඩුවීම මධ්‍යයේ බැංකු අංශය විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල කරන ලද ආයෝජන තුළින් රුපියල් බිලියන 4.8 ක ශුද්ධ ප්‍රාග්ධන ලාභයක් වාර්තා කරන ලදී. බැංකු අංශයේ අනුපාත සංවේදී පරතරය, එනම් වසරක් දක්වා බැංකු අංශයේ පොලී අනුපාතික වලට සංවේදී වත්කම් සහ වගකීම් අතර පරතරය, වසරක් දක්වා බැංකු අංශයේ පොලී අනුපාතිකවලට සංවේදී වත්කම්වලට දක්වන අනුපාතිකය, 2016 වසරේ පැවති සෘණ සියයට 30.7 ක සිට 2017 වසර අවසානය වනවිට සෘණ සියයට 34.1 ක් දක්වා පුළුල් විය. මීට හේතු වූයේ වසරකට වඩා අඩු පරිණත කාලයක් සහිත මුදල් තැන්පතුවල වූ වැඩිවීමයි.

**8.3 රූප සටහන**

**බැංකු අංශයේ අක්‍රීය ණය සඳහා වෙන් කිරීම්**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.4 රූප සටහන**

**බැංකු අංශයේ ණය සංයුතියෙහි ආංශික දායකත්වය (2017 අවසානයට)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**කොටස් මිල:** බැංකු අංශය කොටස් වෙළෙඳපලට අනාවරණය වීම දිගින් දිගටම අවම මට්ටමක පැවතීම මගින් කොටස් වෙළෙඳපොළ අවදානම අඩුවීම නිසා බැංකු අංශය කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කොටස්වල කළ ආයෝජන රුපියල් බිලියන 26 ක් වූ අතර එය 2017 වසර අවසානය වනවිට බැංකු අංශයේ මුළු ආයෝජන සහ මුළු වත්කම්වලින් පිළිවෙළින් සියයට 1.0 ක් සහ සියයට 0.2 ක් විය.

**විනිමය අනුපාතික:** විදේශ විනිමය සුරැකුම්පත්වල කරන ලද ආයෝජනවල වැඩිවීම හේතුකොට ගෙන බැංකු අංශයේ විදේශ විනිමය අවදානම් ඉහළ යෑමක් දක්නට ලැබුණි. බැංකු අංශයේ දේශීය බැංකු ඒකක විසින් 2017 වසර අවසානය වනවිට රුපියල් බිලියන 21 ක අතිරික්ත විදේශ විනිමය අනුපාත අනාවරණයක් වාර්තා කරන ලද අතර මෙය 2016 වසර අවසානය වනවිට රුපියල් බිලියන 16 ක් විය. 2017 වසර අවසානය වනවිට දේශීය බැංකු ඒකකවල සමස්ත අතිරික්ත විදේශ විනිමය අනාවරණය, එහි නියාමන ප්‍රාග්ධනයේ සහ ශේෂ පත්‍ර වත්කම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 2.3 ක් සහ සියයට 0.2 ක් ලෙස වාර්තා විය. තවද, බැංකු අංශය 2017 වසර තුළදී රුපියල් බිලියන 8.6 ක ප්‍රත්‍යාගණන ලාභයක් වාර්තා කළේය.

**(ඇ) ද්‍රවශීලතා අවදානම:** 2017 වසරේදී බැංකු අංශය විසින් ඉහළ ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යනු ලැබීය. දේශීය බැංකු අංශයේ ද්‍රවශීල වත්කම් අනුපාතය 2016 වසරේ පැවති සියයට 29.9 සිට 2017 වසර අවසානය වනවිට සියයට 31.3 ක් දක්වා වැඩිවූ අතර මෙය සියයට 20.0 ක් වන ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා මට්ටම් අනුපාතයට වඩා වැඩි මට්ටමක පවත්වා ගන්නා ලදී. මේ අතර, අක්වෙරළ බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 34.6 ක් විය. බැංකු කිහිපයක ප්‍රාග්ධන මට්ටමේ වැඩිවීම සහ ණයදීමේ අඩු වර්ධනය බැංකු අංශයේ ද්‍රවශීලතාවයේ වැඩිවීමට හේතුවිය. තවද, වසර තුළදී ණය සහ තැන්පතු අතර අනුපාතිකය පදනම් අංක 208 කින් ඉහළ යන ලදී. වසර තුළදී ද්‍රවශීල වත්කම් හා සමස්ත වත්කම් අතර අනුපාතය සහ ද්‍රවශීල වත්කම් හා තැන්පතු අතර අනුපාතය පිළිවෙළින් පදනම් අංක 130 කින් සහ පදනම් අංක 56 කින් ඉහළ ගියේය.

2017 වසර අවසානය වන විට බැංකු අංශයේ **සමස්ත ද්‍රවශීල වත්කම් රුපියල් බිලියන 474 (සියයට 19.2) කින් රුපියල් බිලියන 2,939 ක් දක්වා වැඩි** විය. 2017 වසර තුළදී වාර්තා වූ ද්‍රවශීල වත්කම්වල වැඩිවීමෙන් සියයට 88.1 ක් සඳහා භාණ්ඩාගාර සුරැකුම්පත්වල කරන ලද ආයෝජන හේතුවූ අතර මෙය 2017 වසර අවසානය වන විට පැවති මුළු ද්‍රවශීල වත්කම්වලින් සියයට 75.5 ක් විය.

2016 වසර අවසානය හා සැසඳීමේදී දින 30 ට අඩු **පරිණත කාලයක් සඳහා බැංකු අංශයේ සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සමුච්චිත පරිණත කාල පරතරය,** 2017 වසර අවසානය වන විට වැඩි විය.

**8.5 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්වල සංයුතිය**

| අයිතමය | 2016 (අ) | | 2017 (ආ) | | වෙනස (රු. බිලියන) | |
|---|---|---|---|---|---|---|
| | රු. බිලියන | ප්‍රතිශතය | රු. බිලියන | ප්‍රතිශතය | 2016 (අ) | 2017 (ආ) |
| භාණ්ඩාගාර බිල්පත් | 506.6 | 20.5 | 742.4 | 25.3 | -176.5 | 235.9 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 843.0 | 34.2 | 960.3 | 32.7 | 162.6 | 117.3 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 451.7 | 18.3 | 515.6 | 17.5 | -11.4 | 63.8 |
| මුදල් | 122.0 | 4.9 | 165.5 | 5.6 | 5.9 | 43.5 |
| ඒක්ෂණ මුදල් | 114.8 | 4.7 | 109.8 | 3.7 | -27.0 | -5.0 |
| විදේශ බැංකු ගිණුම්වල ශේෂයන් | 322.2 | 13.1 | 307.7 | 10.5 | 93.1 | -14.5 |
| වෙනත් | 105.6 | 4.3 | 138.1 | 4.7 | -7.7 | 32.5 |
| **ද්‍රවශීල වත්කම්වල එකතුව** | **2,465.9** | **100.0** | **2,939.4** | **100.0** | **39.0** | **473.6** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.5 රූප සටහන**

**බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනෙක් පරිණත කාල පරතරයන් හි වූ වෙනස්වීම නොසැලකිය හැකි මට්ටමක විය.

**බැංකු අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය වන සියයට 80.0 ට වඩා ඉතා ඉහළ මට්ටමක පැවතිණි (බැංකු විසින් මෙම අනුපාතය 2018 ජනවාරි 01 වනවිට සියයට 90.0 ක සහ 2019 ජනවාරි 01 වනවිට සියයට 100 ක අගයක පවත්වා ගෙන යායුතු වේ).** සියලු විනිමය අවශ්‍යතා සඳහා බැංකු අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2016 වසර අවසානයේ පැවති සියයට 152.6 ක සිට 2017 වසර අවසානය වනවිට සියයට 155.6 ක් දක්වා වැඩි විය. මේ අතර, රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා බැංකු අංශයේ රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2016 වසර අවසානයේ පැවති සියයට 200.8 ක සිට සියයට 187.1 ක් දක්වා අඩුවිය.

## සම්පත්

**(අ) ලාභදායිත්වය:** පොලී ආදායමේ (සියයට 28.3) වර්ධනයට සාපේක්ෂව පොලී වියදමෙහි (සියයට 39.1) වූ ඉහළ වර්ධනය හේතුවෙන් 2016 වසරේ සියයට 3.6 ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2017 වසර තුළදී සියයට 3.5 ක් දක්වා සුළු වශයෙන් පහළ ගොස් ඇත. විදේශ විනිමය ආදායමෙහි රුපියල් බිලියන 2 ක පහළයෑමක් සිදුවුවද පොලී නොවන ආදායම, 2016 වසරට සාපේක්ෂව 2017 වසර තුළදී රුපියල් බිලියන 19 කින් වැඩිවී ඇත. පසුගිය වසර සමඟ සැසඳීමේදී පොලී නොවන වියදම් රුපියල් බිලියන 7 කින් ඉහළ ගිය අතර සේවක පිරිවැය මෙම වැඩිවීමෙන් සියයට 62.6 කට දායක විය. අක්‍රීය ණය, අලාභ කාණ්ඩයට වර්ගීකරණය කිරීම හේතුවෙන් පසුගිය වසරට

**8.6 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයේ ලාභදායිත්වය**

| අයිතමය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | වටිනාකම (රු. බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස |
| **ශුද්ධ පොලී ආදායම** | **304.3** | **3.6** | **341.6** | **3.5** |
| පොලී ආදායම | 757.5 | 8.9 | 971.9 | 9.9 |
| පොලී වියදම | 453.2 | 5.3 | 630.2 | 6.5 |
| **පොලී නොවන ආදායම** | **102.9** | **1.2** | **122.3** | **1.3** |
| විදේශීය හුවමාරු ආදායම | 25.9 | 0.3 | 23.5 | 0.2 |
| **පොලී නොවන වියදම** | **197.2** | **2.3** | **204.8** | **2.1** |
| සේවක පිරිවැය | 98.4 | 1.2 | 103.1 | 1.1 |
| **අක්‍රීය ණය මත වෙන් කිරීම්** | **10.5** | **0.1** | **19.8** | **0.2** |
| **බදු පෙර ලාභය (එකතු කළ අගය මත බදු අඩු කළ පසු)** | **165.0** | **1.9** | **194.8** | **2.0** |
| **බදු පසු ලාභය** | **116.5** | **1.4** | **138.9** | **1.4** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාපේක්ෂව, අක්‍රීය ණය වෙන්කිරීම් 2016 වසරේ දී පැවති රුපියල් බිලියන 10.5 ක සිට 2017 වසරේ දී රුපියල් බිලියන 9 කින් රුපියල් බිලියන 19.8 ක් දක්වා ඉහළ ගොස් ඇත.

**බැංකු අංශයේ බදු පසු ලාභය 2016 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 116.5 ක සිට 2017 වසර තුළදී රුපියල් බිලියන 139 ක් දක්වා සියයට 19.2 කින් වර්ධනය විය.** ලාභදායිත්වයෙහි සිදුවූ ඉහළයෑම, හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය පදනම් අංක 28 කින් වර්ධනය වී සියයට 17.6 ක් දක්වාත් වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) පදනම් අංක 6 කින් වර්ධනය වී සියයට 1.4 ක් දක්වාත් ඉහළ යෑම මගින් පෙන්නුම් කෙරේ. පරිශ්‍ර හා ස්ථාපිත වියදම්හි ඉහළයෑම හේතු කොට ගෙන අදායම් මත වූ පිරිවැය අනුපාතය 2016 වසරේ පැවති සියයට 75.6 සිට 2017 වසරේදී සියයට 76.3 ක් දක්වා පහත වැටුණු අතර කාර්යක්ෂමතා අනුපාතය 2017 වසර තුළදී පදනම් අංක 358 කින් සියයට 45.7 ක් දක්වා වර්ධනය විය.

**8.6 රූප සටහන**

**සමුච්චිත පරිණත කාලය බැංකු අංශයේ සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 8.7 රූප සටහන
### බැංකු අංශයේ ලාභදායිත්ව දර්ශක




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 8.7 සංඛ්‍යා සටහන
### බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) | 2016 (අ) | 2017 (ආ) |
| **ප්‍රථම ස්ථරය** | **633.7** | **706.2** | **100.0** | **100.0** |
| කොටස් ප්‍රාග්ධනය | 185.5 | 246.0 | 29.3 | 34.8 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 40.8 | 41.7 | 6.4 | 5.9 |
| නොබෙදූ ලාභ | 249.2 | 270.0 | 39.3 | 38.2 |
| පොදු හා අනෙකුත් සංචිත | 188.8 | 176.9 | 29.8 | 25.1 |
| වෙනත් | -4.9 | 8.6 | -0.8 | 1.2 |
| නියාමක ගැලපීම් | -25.7 | -37.0 | -4.0 | -5.2 |
| **දෙවන ස්ථරය** | **153.4** | **165.0** | **100.0** | **100.0** |
| ප්‍රත්‍යාගණන සංචිත | 13.9 | 15.2 | 9.1 | 9.2 |
| උපකාරක ණය | 133.3 | 126.6 | 86.9 | 77.0 |
| පොදු වෙන්කිරීම් සහ වෙනත් | 23.9 | 27.8 | 15.6 | 16.9 |
| නියාමක ගැලපීම් | -17.7 | -5.3 | -11.5 | -3.2 |
| **සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම** | **787.1** | **870.5** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**(ආ) ප්‍රාග්ධනය:** 2017 ජූලි 01 දින සිට බාසල් III ප්‍රාග්ධන සම්මත බැංකු අංශයට හඳුන්වා දුන් අතර, බැංකු අංශය, ඕනෑම ආකාරයක අහිතකර කම්පන අවශෝෂණය කර ගැනීමට හැකිවන පරිදි බාසල් III යටතේ ප්‍රාග්ධන අනුපාත යහපත් මට්ටමක පවත්වා ගෙන යෑමට සමත්විය. 2017 වසර සඳහා තක්සේරු කරන ලද ලාභය ඇතුළත් කිරීමෙන් පසු මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, 2017 වසරේ දෙසැම්බර් මස අවසානය වනවිට පිළිවෙළින් සියයට 12.4 ක් හා සියයට 15.2 ක් විය. අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම උදෙසා වැඩි කරන ලද ප්‍රාග්ධනය පළමු පෙළ ප්‍රාග්ධනය ඉහළයෑමට සහ සමස්ත නියාමන ප්‍රාග්ධනයට පළමුපෙළ ප්‍රාග්ධනය දක්වන අනුපාතය 2016 වසරේ පැවති සියයට 80.5 සිට 2017 වසර අවසානයේදී සියයට 81.1 ක් ලෙස ඉහළයෑමටත් විශාල වශයෙන් ඉවහල් වී ඇත. බැංකු අංශයේ දෙවන පෙළ ප්‍රාග්ධනය, 2017 වසර අවසානයේ දෙවන පෙළ ප්‍රාග්ධනයෙන් සියයට 77.0 ක් පමණවන උපකාරක ණයවලින් මූලික වශයෙන් සමන්විත විය. බාසල් III යටතේ ඉහළ නංවන ලද ප්‍රාග්ධන අවශ්‍යතා හා 2020 වසර අවසානය වනවිට තවදුරටත් වැඩිදියුණු කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා ළඟාකර ගැනීම උදෙසා රඳවාගත් ලාභ වැඩිකර ගැනීම හා නව ප්‍රාග්ධනය යෙදවීම මගින් බැංකු අංශයේ ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 8.8 රූප සටහන
### බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**බැංකු අංශයේ අවදානම මත බරතැබූ වත්කම් 2016 වසරේ වාර්තා කළ සියයට 17.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසර තුළදී සියයට 13.0 කින් පමණක් ඉහළ යෑම සඳහා මන්දගාමී ණය වර්ධනය හේතුවිය.** 2016 වසර අවසානයේ සියයට 86.6 ක්ව පැවැති මුළු අවදානම මත බර තැබූ වත්කම්හි අන්තර්ගතවන ණය අවදානම් මත බර තැබූ වත්කම් ප්‍රමාණය, 2017 වසර අවසානය වනවිට සියයට 88.7 ක් දක්වා වැඩි වී ඇත.

## අධීක්ෂණ සහ නියාමන කටයුතුවල සංවර්ධනයන්

**2017 වසර තුළදී ද මහ බැංකුව විසින් බැංකු අංශයේ සුරක්ෂිත බව සහ අවදානම් දරා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා විචක්ෂණශීලී ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.** බැංකු අංශයේ අවදානම් දරා ගැනීමේ හැකියාව වැඩි කිරීමේ අරමුණින් සහ බාසල් III රාමුව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වනවිට, බලපත්‍රලාභී

**විශේෂ සටහන 9**

## ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 : මූල්‍ය උපකරණ ශ්‍රී ලංකාවේ බැංකු විසින් භාවිතය ඇරඹීම

### 1. පසුබිම

### 1.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 ශ්‍රී ලංකාවට හඳුන්වාදීම්

මෑතකාලීන ලෝක මූල්‍ය අර්බුදය සිදු වූ කාල වකවානුවේ දී, ආර්ථික අර්බුදය තීව්‍ර කිරීමට මූල්‍ය උපකරණ ගිණුම් තැබීමට සාධාරණ අගය මත පදනම් වූ ක්‍රමවේදයක් භාවිත කිරීම තුළින් ණය හානි හඳුනා ගැනීම ප්‍රමාදවීම බලපෑ බවට මතවාදයක් ගොඩ නැගිණි. අර්බුදයට පසුවිපරමක් ලෙස ඉහත තත්ත්වය විවිධ විශේෂඥ කණ්ඩායම් ඇගයීමකට ලක් කරන ලද අතර, එමගින් ඉදිරිය මත පදනම් වූ ණය වෙන් කිරීම් ක්‍රමවේදයක අවශ්‍යතාවය ඉස්මතු විය. තවද, මූල්‍ය උපකරණ වර්ගීකරණයට සහ අගය කිරීමට වඩා තාර්කික ක්‍රමවේදයක අවශ්‍යතාවයද එමගින් හුවා දක්වන ලද අතර අවසානයේ වඩා අනාගතවාදී හානි හඳුනා ගැනීමේ හා වැඩි දියුණු කළ අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම පිණිස අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 : මූල්‍ය උපකරණ ප්‍රමිතිය ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 (මින් ඉදිරියට ප්‍රමිතිය), 2018 ජනවාරි 01 වනදා සිට ආරම්භ වන කාලපරිච්ඡේදවල වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙළ කිරීමේදී සියලු ආයතන විසින් යොදා ගැනීම අනිවාර්ය වේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ප්‍රමිතිය බලපැවැත්වෙන පළමු මූල්‍ය වසරේදී පමණක් පිළියෙළ කරන මුල් කාර්තු තුනේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සඳහා මීට අදාළ පසුගිය ප්‍රමිතිය, එනම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 : මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා අගය කිරීම (මින් ඉදිරියට පසුගිය ප්‍රමිතිය) යටතේ ගිණුම්කරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය නම් අවස්ථාවක් ලබා දී ඇත.

නව ප්‍රමිතිය මූල්‍ය උපකරණ වාර්තා කිරීමට අදාලව වර්ගීකරණය, අගය කිරීම, හානිකරණය, ඉවත් කිරීම සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය පිළිබඳ මූලධර්ම ස්ථාපිත කරනු ලබයි. මෙම ප්‍රමිතිය අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් 2014 වසරේ ජූලි මස නිකුත් කළ අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 : මූල්‍ය උපකරණ, ප්‍රමිතියට අනුරූප වේ.

### 1.2 ප්‍රමිතිය මගින් හඳුන්වා දුන් ප්‍රධානතම වෙනස්කම්

ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව, පසුගිය ප්‍රමිතිය යටතේ පැවති අතීත තොරතුරු මත පදනම්ව ණය හානි ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේදය වෙනුවට ඉදිරිය මත පදනම් වූ ණය හානි ඇස්තමේන්තු කිරීමේ නව ක්‍රමවේදයක් මෙම ප්‍රමිතිය මගින් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමවේදය අනුව, ආයතන විසින් තම ව්‍යාපාර ආකෘතියට ප්‍රධානව බලපාන විචල්‍යයන් මෙන්ම ඉදිරියේ දී ඇතිවිය හැකි සාර්ව ආර්ථික තත්ත්වයන්ද හඳුනා ගෙන, ඉදිරියේ දී අපේක්ෂිත ණය හානි නිවැරදිව තක්සේරු කිරීම කළ යුතු වේ. තවද, මෙම ප්‍රමිතිය මූල්‍ය වත්කම් වර්ගීකරණයට නව පදනමක් මෙන්ම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමඟ අනුයාත වූ ඉදිරි රැකුම් ගිණුම්කරණ ක්‍රමවේදයක් ද හඳුන්වා දී ඇත.

### 2. ප්‍රමිතිය යටතේ මූල්‍ය උපකරණ වර්ගීකරණය

### 2.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය

පසුගිය ගිණුම්කරණ ප්‍රමිතිය යටතේ, මූල්‍ය වත්කම්; කල් පිරෙන තෙක් ලඟ තබා ගන්නා මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු දෑ, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස කාණ්ඩ 4 කට වර්ගීකරණය කරන ලදී. නව ප්‍රමිතිය යටතේ, මූල්‍ය වත්කම්; සාධාරණ අගය මත අගය කරනු ලබන ලබන මූල්‍ය වත්කම් හා ක්‍රමක්ෂිත පිරිවැය මත අගය කරනු ලබන මූල්‍ය වත්කම් ලෙස ප්‍රධාන කොටස් 2 කට වෙන් කරනු ලබයි. සාධාරණ අගය මත පදනම් වූ මූල්‍ය වත්කම්, තවදුරටත් අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගය හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය දක්වන මූල්‍ය වත්කම් ලෙස කොටස් 2 කට වෙන් කරනු ලබයි.

ප්‍රමිතිය යටතේ, ණය සුරැකුම්පත් වර්ගීකරණය, එම වත්කම්වලට අදාළ ව්‍යාපාර ආකෘතිය හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහවල ලක්ෂණ මත පදනම්ව කළ යුතු අතර, මෙමගින් ආයතනවලට තම හිතුමතය පරිදි මූල්‍ය උපකරණ වර්ගීකරණයට ඇති හැකියාව සීමා කරයි. මෙම ප්‍රමිතිය යටතේ ප්‍රාග්ධන ආයෝජන සැමවිටම සාධාරණ අගය මත අගය කළ යුතු අතර, පසුගිය ප්‍රමිතිය යටතේ එවැනි සීමාවක් දක්නට නොලැබුණි.

8

### 2.2 මූල්‍ය වගකීම් වර්ගීකරණය

මෙම ප්‍රමිතිය යටතේ මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ අගය කිරීම පසුගිය ප්‍රමිතියට සමාන වන මුත්, ආයතනයක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් ගිණුම්ගත කිරීමට තෝරා ගත් අවස්ථාවක දී එම තත්ත්වය වෙනස් වේ. එවැනි අවස්ථාවක දී, තමන්ගේම ණය අවදානම (own credit risk) වෙනස් වුවහොත්, එය ගැලපිය යුතු වන්නේ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයටයි.

## 3. ප්‍රමිතිය යටතේ ණය හානි වෙන්කිරීම්/හානිකරණය

### 3.1 නව ප්‍රමිතිය හා පසුගිය ප්‍රමිතිය යටතේ ණය වෙන්කිරීම්

පසුගිය ප්‍රමිතිය යටතේ පැවති ණය හානි හඳුනා ගැනීමේ ක්‍රමවේදය, වාර්තා කරන දිනට පැවති ණය හානි මත පදනම්ව සිදු වූ අතර එහිදී විය හැකි අනාගත හානි නොසලකා හරින ලදී. එනමුදු නව ප්‍රමිතිය යටතේ, ණය හානි කාලීනව වාර්තාගත කිරීම පිණිස අනාගත අපේක්ෂිත ණය අවදානම් ද සැලකිය යුතු වේ. නව ප්‍රමිතිය අනුව, සක්‍රීය සහ ඌන ක්‍රියාකාරී/අක්‍රීය වත්කම්වලට පිළිවෙළින්, මාස 12 ක අපේක්ෂිත ණය හානි වෙන් කිරීමක් සහ ණය ජීවිත කාලය පුරාවට ණය හානි වෙන්කිරීමක් සිදු කළ යුතුය.

### 3.2 නව ප්‍රමිතිය අනුව අදියර තුනකින් යුතු වෙන් කිරීම් ආකෘතිය

ණය ගුණාත්මකභාවය මත පදනම් වූ අදියර තුනකින් යුතු වෙන්කිරීම් ආකෘතියක් ප්‍රමිතිය හඳුන්වා දෙනු ලබයි (රූප සටහන 01). මුල්වරට හඳුනා ගැනීමේදී, සියලු සක්‍රීය ණය පහසුකම් පළමු අදියරේ සක්‍රීය ණය ලෙස සලකා බලා ඉදිරි මාස 12 සඳහා පමණක් අපේක්ෂිත ණය අවදානම වෙන් කළ යුතුය. ඉන්පසු ණය අවදානම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය අවස්ථාවක එම වත්කම් දෙවන හෝ තෙවන අදියරේ ණය පහසුකම් ලෙස වර්ග කොට මුළු ණය කාලසීමාවටම අපේක්ෂිත මුළු හානිය සඳහා වෙන් කිරීම කාලීනව සිදු කළ යුතු වේ.

**රූප සටහන වි.ස. 1**

**ප්‍රමිතිය යටතේ ණය හානි වෙන්කිරීමේ අදියරයන්**




තවදුරටත් මෙහිදී බැංකු තම පොලී ආදායමද ණයෙහි සක්‍රීය බව මත පදනම් ව ගිණුම්ගත කළ යුතුය. වත්කම, සක්‍රීය හෝ ඌණ ක්‍රියාකාරී තත්ත්වයක පවතින විට පොලී ආදායම වත්කමේ මුළු වටිනාකම මතද, වත්කම අක්‍රීය තත්ත්වයක පවතින විට පොලී ආදායම වත්කමේ අපේක්ෂිත ණය හානිය අඩු කළ වටිනාකම මතද හඳුනාගත යුතුවේ.

### 3.3 ආකෘතීන්, පරාමිතික සහ විනිශ්චයන් භාවිත කිරීම

ප්‍රමිතිය භාවිතය ඇරඹීමත් සමගම, අවදානම් ඇගයීමේ ආකෘති සහ එකී ආකෘතිවල විනිවිදභාවය වඩාත් වැදගත් වනු ඇතැයි අපේක්ෂිතය. අපේක්ෂිත ණය හානිය නිවැරදිව ඇස්තමේන්තු කිරීම සඳහා බැංකු විසින් ණය අවදානම ඉහළ යාම පිළිබඳ තම අත්දැකීම් මෙන්ම, තාර්කිකරණය කළ හැකි මෙන්ම විශ්වාසය තැබිය හැකි ඉදිරිය මත පදනම් වූ තොරතුරු භාවිතය අත්‍යවශ්‍ය වේ.

ආකෘති මත විශ්වාසය තබා, ගිණුම්කරණ කටයුතු සිදු කිරීමට වන නිසා, ණය අවදානම ඇගයීම සහ ගණනය කරනු ලබන ආකෘතිවල විශ්වාසනීයත්වය, නිවැරදිබව හා අපක්ෂපාතී ඇස්තමේන්තු අඛණ්ඩව ලබා දෙන බව තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් බැංකු පවත්වාගත යුතු වේ.

## 4. ගෝලීය නියාමන භාවිතාවන්

### 4.1 අනෙකුත් රටවල් මෙම ප්‍රමිතිය ක්‍රියාවට නංවන ආකාරය

ලොව පුරා විවිධ රටවල් තම ගිණුම්කරණ නියාමන ආයතනවල මග පෙන්වීම යටතේ මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම පිණිස එකිනෙකට වෙනස් ප්‍රවේශයන් භාවිත කොට ඇත. කෙසේ නමුත්, මෙම ප්‍රමිතිය තුළින් හඳුන්වාදෙන අපේක්ෂිත ණය අවදානම් ප්‍රවේශය හරහා වෙන් කිරීම් සිදු කිරීම තුළින් ණය හානි වෙන් කිරීම් ඉහළ යාම නිසා මූල්‍ය අංශයට සිදුවන විශාල බලපෑම නිසාවෙන්ම, ඇතැම් රටවල මූල්‍ය අංශ නියාමකයන් හා මහ බැංකු විසින් තම රටේ බැංකු වල මෙම ප්‍රමිතිය සුමටව හා ඒකාකාරීව ක්‍රියාවට නැංවෙන බව තහවුරු කර ගැනීම සඳහා මගපෙන්වීම් මේ වනවිට නිකුත් කොට ඇත.

බාසල් II/III නියාමනයන්ට අදාලව ණය වෙන්කිරීම් සිදු කිරීමේ දී යොදාගත හැකි ණය අවදානම ගණනය කරන ප්‍රමිතිගත ප්‍රවේශය (Standardised Approach)[1] සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් මත පදනම් ප්‍රවේශයන් (Internal Rating Based Approaches)[2] යටතේ නියාමන ණය වෙන්කිරීම් විධිවිධාන වෙනස් වේ. මෙම ප්‍රමිතියට මේ වන විට මාර්ගෝපදේශ නිකුත් කොට ඇති බොහෝ රටවල් ණය අවදානම්

1 බාසල් ප්‍රමිතීන් යටතේ කලින් නිර්වචනය කළ අවදානම් බර තැබීම් මත ණය අවදානම ගණනය කරන ප්‍රවේශය

2 බාසල් ප්‍රමිතීන් යටතේ බැංකු ණය පහසුකම් සඳහා ලබා දෙන අභ්‍යන්තර ණය ඇගයීම් යොදා ගෙන බැංකුවල ණය අවදානම් ගණනය කරන ප්‍රවේශයන්

ගණනය කිරීමට දියුණු ප්‍රවේශයන් (Advanced Approaches) අනුගමනය කරන රටවල් වේ. ශ්‍රී ලංකාව වැනි ප්‍රමිතිගත ක්‍රමවේදය අනුගමනය කරන රටවලට මෙම ප්‍රමිතිය භාවිතයේදී ප්‍රබල ලෙස සංකීර්ණ ණය වෙන්කිරීම් ආකෘති මත රඳා පැවතීමට සිදුවීම අභියෝගයක් වනු ඇත.

### 4.2 නියාමන ප්‍රාග්ධනය ගණනය කිරීමේ දී ගිණුම්කරණ වෙන්කරීම් සලකා බැලිය යුතු ආකාරය

ඉදිරිය මත පදනම් වූ ණය වෙන් කිරීම් ක්‍රමවේදයක් කරා ගමන් කරන විට බැංකු විසින් මෙම ප්‍රමිතිය භාවිතය අරඹන මුල් දිනයේදීම, එදිනට පවතින මූල්‍ය උපකරණවලට අදාළව බලපාන ණය වෙන්කිරීම ඍජුවම රඳවාගත් ලාභවලට ගැලපිය යුතු අතර, මෙය ප්‍රමිතියේ මුල් දින බලපෑම ලෙස පොදුවේ හඳුන්වනු ලබයි.

අන්තර්ජාතික පියවීම් බැංකුව (BIS) විසින් 2017 මාර්තු මාසයේදී නිකුත් කළ ‘ගිණුම්කරණ වෙන්කිරීම් සඳහා නියාමන විධිවිධානවල තාවකාලික ප්‍රවේශය සහ සංක්‍රාන්තික පෙළ ගැස්වීම්’ පිළිබඳ ප්‍රකාශනයේදී අපේක්ෂිත ණය හානිමත පදනම් ගිණුම්කරණය තුළින් ඉහළ යන ණය වෙන්කිරීම් හරහා බැංකුවල ප්‍රාග්ධනයට වන අහිතකර බලපෑම, නිශ්චිත කාල පරාස කිහිපයක් පුරා බෙදී හැරීමට යෝජනා කරනු ලබයි. මුල් දින බලපෑම බෙදා හැරීම තුලින්, බැංකුවල ප්‍රාග්ධනයට වන ආඝාතය අවම කරන අතර ප්‍රාග්ධනය නැවත ගොඩනැගීමට අවස්ථාව සලසා දෙනු ලබයි.

## 5. ශ්‍රී ලංකාවේ බැංකු අංශයට වන බලපෑම

### 5.1 බැංකුවල ප්‍රාග්ධන මට්ටමට වන බලපෑම

පවතින තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ණය හානි වෙන්කිරීම් වල මුල් දින බලපෑම සමස්තයක් ලෙස 20% - 40% සීමාවේ පවතින අතර මෙය එකිනෙක බැංකුවල පරිචයන් සහ ව්‍යාපාර ආකෘති අනුව වෙනස් විය හැකි වේ.

මුල් දින බලපෑමට අමතරව ගත්කල, මෙම ප්‍රමිතිය අනුව නව ණය පහසුකම් ලබාදෙන අවස්ථාවේදීම 1 වන අදියරේ ණය වෙන් කිරීමත්, ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු නිසා ඒ හරහා බැංකුවල ප්‍රාග්ධන මට්ටමට සහ වර්ධනය වීමේ හැකියාවට සැලකිය යුතු බලපෑමක් වනු ඇතැයි අපේක්ෂිතය. තවදුරටත්, මේ සමඟම බාසල් III යටතේ ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා වන කාල රාමුවට අනුගත වීමට සිදුවීම, වැඩි කරනු ලැබූ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සහ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත තෝලන අනුපාතය සමඟ ඇතැම් බැංකු වලට අවශ්‍ය ප්‍රාග්ධන මට්ටම පවත්වා ගැනීමේ දී සහ තිරසාර වර්ධනයක් තහවුරු කර ගැනීමේ දී අභියෝගීකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවනු ඇත.

### 5.2 ණය අවදානම ආකෘතිගත කිරීම

මේ වන විට, ශ්‍රී ලංකාවේ බැංකු ණය අවදානම ගණනය කිරීමට බාසල් III යටතේ ප්‍රමිතිගත ප්‍රවේශය යොදා ගනී. එනමුදු, මෙම ප්‍රමිතිය යටතේ අපේක්ෂිත ණය වෙන්කිරීම ගණනය කිරීමට සියලුම බැංකුවලට ආකෘති මත පදනම් වූ ක්‍රමවේදයනට යොමු වීමට සිදු වනු ඇත. මෙම ප්‍රමිතිය යටතේ අපේක්ෂිත ණය අවදානම ආකෘති ගත කිරීමට මේ දක්වා අවශ්‍ය නොවනු අමතර තොරතුරු රාශියක් අවශ්‍ය වන අතර, ඒ අනුව, බැංකුවලට තම කළමනාකරණ තොරතුරු පද්ධති වැඩි දියුණු කිරීමට ආයෝජනය කිරීමට සිදුවනු ඇත.

### 5.3 ණයවල ගුණාත්මකභාවය පහළ යන අවස්ථාව

මෙම ප්‍රමිතිය යටතේ, ණයගැතියා විසින් නියමිත දිනය ඉක්මවා දින 30 ක් යන තුරුත් නියමිත ගෙවීම් සිදු නොකළ විට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යන බවට බිඳ හෙලිය හැකි අනුමානයක් හඳුන්වා දෙන අතර, එවැනි ණය ඌණ ක්‍රියාකාරී ණය ලෙස සලකා ණයෙහි ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය හානි වෙන් කිරීමක් සිදු කළ යුතුය. පසුගිය ප්‍රමිතිය යටතේ හානිකරණය සඳහා ණය පහසුකම් තෝරා ගැනීමේ දී බැංකු සලකා බලන ලද එක් නිර්ණායකයක් වූයේ බැංකු අංශය පවතින නියාමන රෙගුලාසි වලට අනුයාත දවස් 90 ක ණය නොගෙවීම් සීමාවයි. කෙසේ වෙතත්, මෙම බිඳ හෙළිය හැකි අනුමානය, බිඳ දැමිය හැක්කේ, බැංකු වලට ණයගැතියන් දින 30 ක් පසු වී නියමිත ණය මුදල් ගෙවූවත් ණය අවදානම සැලකිය යුතු මට්ටමකින් ඉහළ නොගිය බව බැංකුවලට ඔප්පු කළ හැකි නම් පමණි. ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය අනුව මෙම අනුමානය බිඳ හෙළීම දුෂ්කර කාර්යයක් වනු ඇති බව බැංකු අංශය පිළිබඳ විද්වතුන්ගේ මතය වී ඇත.

## 6. ඉදිරි දැක්ම

### 6.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රවේශය

මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම හරහා බැංකු අංශයට වෙන බලපෑම සහ බැංකුවල සූදානම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වන විටත් ඇගයීමට ලක් කොට ඇති අතර, බැංකු අංශය පුරා මෙම ප්‍රමිතිය ඒකාකාරීව හඳුන්වා දීමට සහ ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම නියමිත පරිදි සිදුවීම තහවුරු කිරීමට අදාළව පුළුල් මාර්ගෝපදේශ ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිතයි. තවදුරටත්, ප්‍රමිතිය හා සම්බන්ධිත පාර්ශ්වයන් අතර සංවාදයක් ඇති කිරීමට මෙන්ම බැංකු සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය අතර කාර්යක්ෂම සන්නිවේදන ප්‍රවාහයක් ඇති කොට ප්‍රමිතිය ඒකාකාරීව ක්‍රියාවට නැංවීමට පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වේ.

8

අන්තර්ජාතික පියවීම් බැංකුව (BIS) ඉදිරිපත් කළ ආකාරයට සමාන අයුරකින් බැංකුවල ප්‍රාග්ධනය ප්‍රමාණාත්මතා අනුපාතයට මෙම ප්‍රමිතිය තුළින් ණය හානි වෙන් කිරීම් ඉහළයාම නිසා සිදුවන බලපෑම වසර කිහිපයක් පුරා බෙදා හැරීම පිළිබඳව සලකා බැලීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. තවදුරටත්, ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවල මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය ඇගයීමට මෙන්ම බැංකුව මීට අදාලව සිදු කරන ශක්‍යතා වර්ධනය කිරීමේ උත්සාහයන්ට පහසුකම් සැපයීමට අපේක්ෂා කරයි.

**6.2 නියාමන අපේක්ෂා**

ප්‍රමිතියට අදාළව බැංකුවල පවතින විශේෂඥ දැනුම සීමිත නිසාවෙන්, බොහෝ බැංකු මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියට මග පෙන්වීම සඳහා උපදේශක සේවාවන් ලබා ගන්නා ලදී. මේ නිසා, තම බැංකු තුල නිසි පුහුණු අවස්ථා සපයමින් සහ නිසි දැනුම හා අවශ්‍ය කුසලතා අත්පත් කර ගනිමින් ආයතනික ශක්‍යතාව වර්ධනය කර ගැනීමට බැංකු කටයුතු කරනු ඇතැයි අපේක්ෂිතය.

තවදුරටත්, ණය හානි වෙන් කිරීම ගණනය කිරීම සඳහා බැංකු නව ආකෘති හඳුන්වා දිය යුතු අතර, මෙම ආකෘතිවල සංකීර්ණ බව නිසා එම මෙම හඳුන්වාදීමේ ක්‍රියාවලියට සැලකිය යුතු කාලසීමාවක් සහ පෙර සූදානමක් අවශ්‍ය නිසාවෙන් බැංකුවල අභ්‍යන්තර අංශ අතර සමායෝජනය සහ සන්නිවේදනය ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙන්ම ඉහළ කළමනාකාරීත්වය විසින් බැංකුව තුල ඒකාකාරීව මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවෙන්නේ ද යන්න පිළිබඳව තම අවධානය යොමු කළයුතු අතර, ආකෘතිවල නිරවද්‍යතාවය මෙන්ම නිවැරදි තොරතුරු වාර්තාකරණ රාමුවක් පවතින්නේද යන්න ද තහවුරු කළ යුතුය. නිවැරදි වෙළඳපොළ භාවිතාවක් ඇති කිරීම පිණිස බැංකු විසින් නව ගුණාත්මක අනාවරණ රාශියක්ද මූල්‍ය වත්කම් හා ණය වෙන්කිරීමේ ක්‍රියාවලියේ යොදාගත් තීරණයන්ට අදාලව සිදු කරනු ඇතැයි අපේක්ෂිතය. බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල, විශේෂයෙන්ම බැංකුවල විගණන කමිටුව මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම අභිප්‍රේක්ෂණය කරනු ඇතැයි අපේක්ෂිත අතර ඔවුන් විසින් මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමේ ඇතිවන විවිධ අභියෝග, මෙන්ම නියාමන අවශ්‍යතා වලට නිසි පරිදි බැංකු වලට මුහුණ දීමට ප්‍රාග්ධන සැලසුම්කරණ ක්‍රියාවලිය, ආතති පරීක්ෂාව සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය යොමු කරනු ඇතැයි අපේක්ෂිතය. ඉදිරියේ දී බැංකු අංශයේ මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමේ දී භාවිත වන ආකෘතිවල, ආකෘති යෙදවුම්වල, භාවිත වන උපකල්පනවල හා බැංකු සිදු කරන අනාවරණවල ඒකාකාරී බවක් ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

**6.3 අනාගත ප්‍රතිලාභ**

මෙම අභියෝගයන් අතරතුර, කාලීනව මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම හරහා බැංකුවල කළමනාකරණ තොරතුරු පද්ධති වැඩි දියුණු වීම, ණය කළමනාකරණ පරිචයන් ශක්තිමත් වීම, නිරාවරණයන් වැඩි දියුණු වීම සහ සෑම ණය පහසුකමක්ම ලබාදුන් මොහොතේ සිටම සූක්ෂම නිරීක්ෂණය කිරීම යනාදිය සිදු වනු ඇත. මේ අනුව, තවදුරටත් මෙම ප්‍රමිතිය හරහා බැංකු අංශයේ ණයවල ගුණාත්මක තත්ත්වය ඉහළයාම, ණය පහසුකම්වල ක්‍රියාකාරීත්වය මැන බලන දියුණු පද්ධති බිහිවීම, අවදානම් දරා ගැනීමේ හැකියාව වර්ධනය වීම හා විචක්ෂණශීලී බව සහ අවදානම් කළමනාකරණය වර්ධනය වීම ද අපේක්ෂිතය.

මූලාශ්‍ර:
අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව යනාදිය ප්‍රමිතිය පිළිබඳ නිකුත් කළ ප්‍රකාශයන් සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු වලින් ලබාගත් තොරතුරු

බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් ඉහළ නංවන බව දැනුම් දෙන ලදී. ඒ අනුව, දැනට මෙරට සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා රුපියල් බිලියන 20 ක්, රුපියල් බිලියන 100 ක් දක්වා වත්කම් සහිත විදේශීය බැංකු සඳහා රුපියල් බිලියන 5 ක් සහ රුපියල් බිලියන 100 ඉක්මවූ වත්කම් සහිත විදේශීය බැංකු සඳහා රුපියල් බිලියන 10 ක් ලෙස අවම ප්‍රාග්ධන මට්ටම් පවත්වාගත යුතුවේ. බලපත්‍රලාභී විශේෂිත බැංකු රුපියල් බිලියන 7.5 ක් පවත්වාගත යුතුවේ. මෙම ඉහළ දැමූ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාග්ධන සැලසුම් ඉදිරිපත් කිරීම ද අවශ්‍ය පරිදි බැංකු විසින් සිදු කළ යුතු වේ. බලපත්‍රලාභී බැංකු මෙම අවශ්‍යතා සමඟ අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවන්හි දී එම බැංකු විසින් කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම, ලාභ නැවත සිය රටට යැවීම හෝ ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් අඩුවීමට හේතුවන ක්‍රියාමාර්ග ගැනීම අදාළ බැංකු විසින් යළි අනුකූලතාවයට එළඹෙන තුරු අත්හිටුවනු ලැබේ.

**තවද, මෙරට සංස්ථාපිත ඕනෑම නව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් පිළිවෙළින් රුපියල් බිලියන 20 ක සහ රුපියල් බිලියන 7.5 ක ප්‍රාග්ධනයක් බැංකු අංශයට පිවිසීමේදී රැගෙන ආ යුතුය.** විදේශීය බැංකු රුපියල් බිලියන 10 ක ප්‍රාග්ධනයක් රැගෙන ආ යුතුය.

8

බාසල් III රාමුව යටතේ **තෝලන අනුපාතය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදේශන පත්‍රිකාවක් බැංකු වෙත නිකුත් කරන ලදී.** ඒ අනුව, 2017 වසරේ මාර්තු 31 වන දින සිට අධීක්ෂණ කටයුතු සඳහා බැංකු විසින් තෝලන අනුපාතය සෑම කාර්තුවක් අවසන්වී දින 30 ක් ඉක්මවා යෑමට පෙර වාර්තා කළ යුතුවේ. තෝලන අනුපාතය මගින් බැංකු අංශයේ අධික තෝලන වර්ධනය සීමා කෙරෙන අතර එයින් පුළුල් මූල්‍ය පද්ධතිය සහ ආර්ථිකයට ඇතිවන අහිතකර බලපෑම් මැඩ පවත්වයි. බාසල් III රාමුවට අදාළ තෝලන අනුපාතය සම්බන්ධයෙන් විධාන 2018 වසරේ දෙවැනි භාගයේ දී නිකුත් කෙරෙනු ඇත. බාසල් III රාමුව යටතේ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය අනුව බැංකු තම වත්කම් සංයුතිය සහ ශේෂ පත්‍ර නොවන කටයුතු සම්බන්ධයෙන් ස්ථායී අරමුදල් ප්‍රමාණයක් පවත්වා ගත යුතු වේ. ඒ අනුව, බාසල් III රාමුව යටතේ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය සම්බන්ධයෙන් අදහස් විමසා උපදේශන පත්‍රිකාවක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කෙරුණු අතර, ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය සඳහා විධානයන් 2018 වසරේ දෙවැනි භාගයේදී නිකුත් කෙරෙනු ඇත.

**ව්‍යුත්පන්න ගනුදෙනුවලදී ඇතිවන අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු වෙත මූල්‍ය ව්‍යුත්පන්න සඳහා බැංකු පනත යටතේ විධානයන් නිකුත් කෙරිණ.** මේ අනුව, සියලුම බැංකු විසින් ව්‍යුත්පන්න ගණුදෙනු නිරීක්ෂණය කිරීම සඳහා සහ එමගින් පැන නගින්නා වූ අවදානම් කළමනාකරණය කිරීම සඳහා එකී අවදානම් හඳුනාගැනීමට, එම අවදානම් වල නිරාවරණ තක්සේරු කිරීමට හා ප්‍රමාණය තීරණය කිරීමට අවශ්‍ය ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්ති මාලාවන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද සහිතව නිර්මාණය කර තිබිය යුතුවේ.

බැංකු විසින් ලබාගන්නා විදේශ ව්‍යවහාර මුදල් **ණය සම්බන්ධයෙන් වන අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් ඒ සඳහා නව ප්‍රතිපත්ති මාලාවක් 2018 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇත.** බැංකු විසින් විශාල වශයෙන් විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් නිසා මෙරට විදේශ විනිමය සංචිත සහ විනිමය අනුපාතිකයන්ට වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් මෙම ප්‍රතිපත්ති හඳුන්වාදෙනු ලැබීය.

මෝටර් රථ මිලදී ගැනීම සඳහා ලබාදෙන ණය **හේතුවෙන් බැංකු ක්ෂේත්‍රයේ ඇතිවන අධික ණය වර්ධනය සීමා කිරීමේ සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ගයක්** වශයෙන් රථ වාහනයක් මිලදී ගැනීමට හෝ භාවිතයට ගැනීම සඳහා අවසාන පරිභෝජකයන් හට ලබාදෙන මූල්‍ය කල්බදු, කුලී සින්නක්කර හෝ වෙනත් ඕනෑම ආකාරයේ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය **අනුපාත සීමා අනුගමනය කිරීමට සියලුම බලපත්‍රලාභී බැංකු හට උපදෙස් ලබාදෙන ලදී.** කෙසේ නමුත්, මෙම ණය සීමා සංචාරක ක්ෂේත්‍රයේ සහ/හෝ ප්‍රවාහන/ගමනාගමන ක්ෂේත්‍රයේ නියුතු සමාගමක ප්‍රධාන ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට මෝටර් රථ ආනයනය කිරීමේදී අදාළ නොවන අතර එසේ මිලදී ගන්නා මෝටර් රථ වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීමට නොහැකි වේ.

**පසුගිය කාලසීමාව තුළදී ඉහළයැමක් දක්නට ලැබුණු නිශ්චල කෙටිකාලීන පුද්ගලික ණය, අක්‍රීය ණය සහ ඉහළ යන වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ දැමීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු විසින් ලබාදෙනු ලබන ණය පහසුකම් සඳහා අයකරනු ලබන පොලී අනුපාතික සහ දඩ පොලී අනුපාතික ඒ ඒ බැංකුවල ප්‍රතිපත්තීන් ට අනුව අය කිරීමට අවසර ලබා දෙන ලදී.** මෙහිදී අදාළ පොලී අනුපාතික සහ ඒවා ගණනය කිරීමේ පදනම එම වෙනස් කළ අනුපාතික අයකිරීම බලපවත්නා අවස්ථාවට ප්‍රථමයෙන් නිසි ලෙස දැනුම් දීම අවශ්‍ය වේ. මෙමගින් බැංකුවලට සිය ණය පහසුකම් සඳහා තරගකාරී පොලී අනුපාතික ලබාදීමට ඉඩ සැලසෙන අතර දඩ පොලී අයකිරීමේදී එම දඩපොලී හිඟහිටි ණය ප්‍රමාණය සහ හිඟහිටි කාලසීමාවට පමණක් අයකිරීමට බැංකුවලට උපදෙස් දී ඇත. තවද, බැංකු විසින් ණය උපකරණ ප්‍රචාරණයේදී ඒවා සඳහා බලපවත්නා පොලී අනුපාතික සහ දඩ පොලී අදාළ වන අවස්ථාවන්හිදී අදාළ අනුපාතික සහ ගණනය කිරීමේ පදනම පැහැදිලිව සියලුම අවස්ථාවන්හිදී කිසියම් හෝ මාධ්‍යක් තුළ එනම්, අවම වශයෙන් අදාළ බැංකුවේ වෙබ් අඩවිය තුළ හෝ ප්‍රසිද්ධ කලයුතු අතර, තත්කාලීන අනුපාතික නිරූපණය වන පරිදි නිරන්තරයෙන් යාවත්කාලීන කල යුතුවේ. ණය ගනුදෙනු පිළිබඳව ලියකියවිලි සම්පූර්ණ කිරීමට පෙර අදාළ පොලී අනුපාතික ණය ගැතියන් වෙත දැනුම් දෙන ලෙස බැංකුවලින් ඉල්ලීමක් කර ඇති අතර, ඉන්පසුව පොලී අනුපාතික වෙනස් කරන අවස්ථාවන් හිදී, එබඳු සංශෝධනයන් පවතින ණය පහසුකම් මත බලාත්මක කිරීමට ප්‍රථමයෙන් ඒ බැව් ගණුදෙනුකරුවන්ට දැනුම් දිය යුතු බවද පෙන්වා දෙන ලදී.

බැංකු මගින් සිදුකරනු ලබන **සින්නවූ උකස් කරන ලද රන් භාණ්ඩ වෙන්දේසි වලදී තොග වශයෙන් මිලට ගෙන රටින් පිට කිරීමේ ජාවාරම වලක්වාලීමේ අරමුණින් අදාළ වෙන්දේසි වලදී සිදුකරනු ලබන රුපියල් 500,000 ක් හෝ ඊට වැඩි රත්‍රං භාණ්ඩ මිලට ගැනීම් පිළිබඳ විස්තර මාසිකව වාර්තා කරන ලෙස බැංකු වලට උපදෙස් දෙමින් නිර්ණයක් බැංකු වෙත නිකුත් කරන ලදී.** තවද, වෙන්දේසිවල දී විශාල රත්‍රං

## විශේෂ සටහන 10
## තාක්ෂණය පාදක කරගත් අනාගත බැංකුකරණය

### බැංකුකරණයේ තාක්ෂණික ඉතිහාසය

භෞතික ව්‍යුහ මත තැණුනු (brick and mortar style) සාම්ප්‍රදායික බැංකුකරණයේ සිට ඩිජිටල් බැංකුකරණය දක්වා වූ ආගමනයේ දී, බැංකුකරණය තාක්ෂණය සමග මුහුවීම නිබඳවම සිදුවී තිබේ. ක්‍රි.පූ. 600 වැනි අතීතයක දී ප්‍රථම කාසිය ටංකනය කිරීමෙන් ඇරඹී මෙම ගමන් මග සංධිස්ථාන රැසක් පසු කරමින් ඉදිරියට ඇදී යන ලදී. ඒ අතරින් 1659 දී ප්‍රථම චෙක්පත නිකුතුව, 1920 දී ප්‍රථම ණයපත ඇරඹීම, 1978 දී ප්‍රථම හරපත නිකුතුව සහ 1984 දී ප්‍රථම අන්තර්ජාල සාප්පුකරණ ගනුදෙනුව සිදු කිරීම සුවිශේෂී වේ.

### ඩිජිටල්කරණ යුගය

තාක්ෂණික දියුණුව පාරිභෝගික අවශ්‍යතා සමග මුහුවීම නිසාවෙන්, සාම්ප්‍රදායික බැංකුකරණයේ නොතිබූ පහසුකම් විවර කරමින් බැංකු ඩිජිටල්කරණය සඳහා යොමු විය. මේ අනුව, ජංගම පසුම්බි (mobile wallets), විද්‍යුත් පසුම්බි (e-wallets), පෙර ගෙවුම් කාඩ්පත්, ස්පර්ශයකින් තොරව ක්‍රියාකරන (contactless) කාඩ්පත්, අත් පළඳනා මගින් සිදු කරනු ලබන ගෙවීම් (wrist band payments) සහ අනෙකුත් ඩිජිටල් විකල්පයන් සඳහා වැඩි ආකර්ෂණයක් ලැබීම සමග බැංකු වෙත පැමිණෙනු ලබන ගනුදෙනුකරුවන් සංඛ්‍යාව අඩු වේ. තාක්ෂණයේ සිදුවන නිරන්තර දියුණුව සහ පාරිභෝගිකයන් තාක්ෂණය කෙරෙහි තබන විශ්වාසය වැඩි වීම නිසා බැංකු සේවා සැපයීමේ වෙනස් ක්‍රමවේද වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම වනු ඇත.

### තාක්ෂණය පාදක කරගත් අනාගතය

මූල්‍ය තාක්ෂණික (fintech) සහ විදුලි සංදේශ සමාගම් විසින් මෑත අතීතයේ දී නව්‍යකරණ උපයෝගී කරගනිමින් මූල්‍ය පරිසර පද්ධතියේ විප්ලවීය වෙනසක් ඇති කරන ලදී. මෙම ආයතන ගනුදෙනුකරුවන්ගේ නිබඳ වෙනස් වන්නා වූ අවශ්‍යතා මත සහ ඩිජිටල් මූල්‍ය සේවා සඳහා ඇති ඉල්ලුම මත එකී තාක්ෂණයන්ට ලැදි ගනුදෙනුකරුවන් හට පුද්ගලාරෝපිත මූල්‍ය විසඳුම් ලබා දීම සිදු කරයි. මූල්‍ය සේවා ලබාගැනීම සඳහා වන බාධක අඩු කිරීම, තොරතුරු මත පදනම් වූ මූල්‍ය සේවාවල විශ්වාසනීයභාවය වැඩි කිරීම සහ නැගී එන නව ව්‍යාපාර ආකෘති ඉදිරියට ගෙන යාම යන කාර්යය සිදු කිරීම සඳහා මූල්‍ය තාක්ෂණික සහ විදුලි සංදේශ සමාගම් හට හැකියාව ඇත. මූල්‍ය තාක්ෂණික ආයතන සහ විදුලි සංදේශ සමාගම්වල මෙම වේගවත් වෙනස් වීම බැංකුවල ව්‍යාපාර ආකෘති වඩාත් තරගකාරී සහ අභියෝගාත්මක කර ඇත. මෙවන් නව තරගකරුවන් අභිබවාලීමට නම් බැංකු විසින් ඩිජිටල් ආර්ථිකයට පිවිස සිය ගනුදෙනුකරුවන්ගේ ජනවිකාසය වටහා ගනිමින් පිරිවැය සම්බන්ධව සකසුරුවම් විය යුතුය. කෙසේ නමුත්, ඩිජිටල් යුගයේ ඇති ඉඩ ප්‍රස්ථාවන්ගෙන් බැංකු උපරිම ඵල භුක්ති විඳීමට නම් එහිදී මුහුණ පාන්නට සිදුවන අවදානම් සැලකිල්ලට ගනිමින් තැනුණු ශක්තිමත් නියාමන රාමුවලට අනුකූලව ඉදිරියට යාමට හැකියාව තිබිය යුතුය.

### නැගී එන තාක්ෂණයන්

මෑත අතීතය තුළදී බැංකු ක්ෂේත්‍රයේ වඩාත් ආකර්ෂණයට ලක් වූ තාක්ෂණික ප්‍රවණතා මෙසේය:

**අ) විවෘත බැංකුකරණය (open banking)**

විවෘත බැංකුකරණයේදී තෙවන පාර්ශ්වයක යෙදවුම් වැඩසටහන් විසින් ගනුදෙනුකරුවන්ගේ අනුමැතිය මත යෙදවුම් ක්‍රමලේඛණ අතුරු මුහුණත් (Application Programming Interfaces; APIs) උපයෝගී කර ගනිමින් දත්ත පරිශීලනයට අවසර ලැබේ. මෙමගින් ගනුදෙනුකරුවන්ට තනි ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ආධාරයෙන් විවිධ බැංකු වෙත පිවිසිය හැකි අතර බැංකු කටයුතුවලදී ඉමහත් පහසුවක් සහ විකල්ප තෝරාගැනීමට අවස්ථාව සැලසේ.

**ආ) වළාකුළු පරිගණනය (cloud computing)**

වළාකුළු පරිගණනය යනු පරිගණක පිරිසැකසුම් සම්පත් උත්පාදනය, පරිභෝජනය සහ හවුලේ බෙදා ගැනීමේ ක්‍රියාවලියේ සිදු වූ වෙනස්වීමකි. මෙහිදී සේවා සම්පාදකයන් විසින් බැංකුවල ඉල්ලුමට සරිලන පිරිසැකසුම් සහ ගබඩා පහසුකම් සහිත දත්ත මධ්‍යස්ථාන ලබා දෙන නිසා බැංකු හට තමන්ගේ දත්ත මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පැන නොනගී. වළාකුළු පරිගණනය මගින් පිරිවැය කාර්යක්ෂමතාවය, මෙහෙයුම් සුනම්‍යතාවය සහ ඉහළ ආරක්ෂාව සැපයේ. එනමුත්, දත්තවල රහස්‍යභාවය, අඛණ්ඩ පහසුකම් ලබාගැනීම සහ ජාතික ආරක්ෂාව පිළිබඳ පැනනැගෙන ගැටලුකාරී තත්ත්ව වැනි දෑ මෙකී තාක්ෂණයන්ට යොමු වීමේදී සලකා බැලිය යුතුව තිබෙන කරුණු වේ.

**ඇ) ඉලෙක්ට්‍රොනික පිවිසීම (e-onboarding) සහ සත්‍යාපනය (authentication)**

වෙළඳ සබඳතාවයක් ඇරඹීමේදී මුහුණට මුහුණ හමුවීම බැංකුකරණයේ දී මෙතෙක් පැවති මූලික ලක්ෂණයක් වේ. එනමුත්, තාක්ෂණික විකල්ප සඳහා

8

බැංකු වඩාත් නැඹුරු වීම නිසා සහ එක වතාවක් හෝ බැංකුවකට පැමිණීමට ගනුදෙනුකරුවන් දක්වන මැලිකම හේතුවෙන් ඊ-පිවිසුම් පහසුකම් හරහා ගනුදෙනුකරුවන් හට බැංකු පහසුකම් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත. මෙහිදී ඇති ප්‍රතිලාභ මනාව පැහැදිලි මුත්, ඒ සඳහා වන අභියෝග වනුයේ ඵලදායී ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම (customer due diligence) යනාදී අවශ්‍යතා තහවුරු කිරීම වේ.

ඈ) **අප්‍රකාශිත විද්‍යුත් මුදල් (cryptocurrency)**

අප්‍රකාශිත විද්‍යුත් මුදල් යනු මහ බැංකුවක නියාමනයට ස්වාධීනව ගුප්ත ලේඛනකරණය (cryptography) උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක වන හුවමාරු මාධ්‍යයක් ලෙස භාවිත කිරීමට සැදූ ඩිජිටල් වත්කම් වේ. මෙහිදී ඇති විය හැකි මූල්‍යමය සංකූලතාවයන්, සමපේක්ෂාත්මක පීඩනයන් (speculative pressure), ආරක්ෂණ බිඳවැටීම් (security breaches), නියාමන හිඟකම, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම, බදු පැහැර හැරීම, වැනි අවදානම් නිසා නියාමන ආයතනයන් මෙම අප්‍රකාශිත විද්‍යුත් මුදල් පිළිබඳ වඩාත් පරීක්ෂාකාරී වී ඇත. මෙම නිසා ඇතැම් නියාමන ආයතන විසින් අප්‍රකාශිත විද්‍යුත් මුදල් භාවිතය සීමා කිරීමට පවා පියවර ගෙන ඇත.

ඉ) **විසිරි ලෙජර තාක්ෂණය (Distributed Ledger Technology, DLT) සහ කාණ්ඩදාම (Blockchain)**

විසිරි ලෙජර තාක්ෂණය යනු ජාලගතව බෙදා හරින ලද වත්කම් දත්ත ගබඩාවක් වන අතර එහි සහභාගී වන පිරිස් හට ලෙජරයේ සර්වසම පිටපතක් ලැබෙනු ඇත. කාණ්ඩදාම යනු මෙම විසිරි ලෙජර තාක්ෂණයේ ප්‍රභේදයක් වන අතර මෙහිදී කාණ්ඩ (blocks) යටතේ දත්ත ගබඩා කිරීම සිදු වේ. ඇතැම් රටවල් විසින් මෙම තාක්ෂණය, ණය තොරතුරු සම්පාදනය, ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ තොරතුරු (KYC) හුවමාරු කර ගැනීම, මුදල් විශුද්ධිකරණය සහ අනෙකුත් නීති විරෝධී මූල්‍ය ක්‍රම හඳුනා ගැනීම වැනි කාරණා සම්බන්ධයෙන් යොදා ගැනීමට ඇති හැකියාව සොයා බලමින් පවතී. කෙසේ නමුත්, නිසි ප්‍රමිතීන් නොමැතිකම සහ දත්තවල රහස්‍යභාවය සහතික කිරීමේ ප්‍රශ්න වැනි ගැටලු සහගත කරුණු විසිරි ලෙජර තාක්ෂණය සහ කාණ්ඩදාම සම්බන්ධයෙන් පැන නැගේ.

ඊ) **කෘතිම බුද්ධිය (Artificial Intelligence; AI) සහ තුමුල දත්ත විශ්ලේෂණය (big data analytics)**

කෘතිම බුද්ධිය විසින් පරිගණක වැඩසටහන් හට පරිශීලකයන් සමග ක්‍රියා කරමින් මීට පෙර මිනිස් මැදිහත්වීමකින් සිදු කරන ලද කාර්යයන් අධ්‍යයනය කිරීමටත් වඩාත් වේගවත් සහ නිවැරදි තීරණ ගනිමින් කටයුතු කිරීමටත් හැකියාව උදා කර ඇත. මෙමගින් ලබාගත හැකි ප්‍රධාන ප්‍රයෝජන නම්: වැඩි දියුණු කළ පාරිභෝගික පුද්ගලාරෝපකරණය (personalisation), ඵලදායීතා වර්ධනය, වංචා මැඩලීම් හා වඩා යහපත් භාණ්ඩ/සේවා නිර්දේශ කිරීම වේ. කෘතිම බුද්ධියේ සාර්ථකත්වයට සමාජ ජාල භාවිතයන්ගේ හැසිරීම් රටා, හඬපට වාර්තා, පින්තූර ආදී ව්‍යුහගත නොවන දත්ත විශ්ලේෂණයට මඟපාදන තුමුල දත්ත විශ්ලේෂණයේ සිදු වූ වර්ධනයද දායක වී ඇත.

**තාක්ෂණය මත ඇති අධික විශ්වාසය නිසා බැංකු ක්ෂේත්‍රයේ පැන නැගෙමින් ඇති අවදානම්**

අ) **මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සහ ගනුදෙනුකරු හඳුනා ගැනීම පිළිබඳ වන අවදානම්**

සාම්ප්‍රදායික බැංකුකරණය විප්ලවකාරී නව්‍යතා මඟින් ආදේශනය වීම නිසාවෙන් බැංකු සතු ඵලදායී ලෙස පරීක්ෂණය (surveillance) කිරීමේ හැකියාව හීන වී ඇත. මූල්‍ය තාක්ෂණික සහ ඊ-බැංකුකරණයේ දියුණුවත් සමග බැංකු හට ගනුදෙනුකරුවන් සඳහා ඊ-පිවිසුම් (e-onboarding) ලබා දීමට සිදු වී ඇති අතර මෙමගින් මුහුණට-මුහුණ සිදුවන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව ගිලිහී යන බැවින් ඉහත කී මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම හා ගනුදෙනුකරු හඳුනා ගැනීම වැනි කාරණා පිළිබඳ ඇති අවදානම් ඉහළ ගොස් ඇත.

ආ) **තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ සයිබර් සුරක්ෂිතතාවය**

බැංකු ක්ෂේත්‍රයේ දී ඩිජිටල්කරණය වෙත ඇති නොනවතින රැල්ල නිසා තාක්ෂණික සහ සයිබර් අවදානම් සඳහා නිරාවරණය වීම ඉහළ ගොස් ඇත. මෑත කාලයේ දී ගෝලීය මට්ටමින් වාර්තා වූ ඉහළ පෙළේ සයිබර් ප්‍රහාරයන් වැඩි විදග්ධතාවකින් (sophistication) සහ වැඩි තීව්‍රතාවයකින් වාර්තා වීම නිසා මූල්‍ය ක්ෂේත්‍රයේ ශක්තිමත්භාවය හා ස්ථායීතාවයට තර්ජනයක් වී ඇත.

8

**ඇ) පෞද්ගලිකත්වය හා දත්ත ආරක්ෂණය**

බැංකුවල නව පරිණාමිත මෙහෙයුම් පරිසරය තුළදී ඇතිවන අභියෝග හමුවේ, ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ දත්තවල ආරක්ෂාකාරී බව පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වේ. ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂා කිරීම නොකළහොත් ඒවා නොමනා පිරිස් අතට පත්විය හැකි බව ලොව පුරා වාර්තා වූ අනවසර දත්ත පිටවීම් මගින් ප්‍රත්‍යක්ෂ වී ඇත.

**ඈ) මානුෂීය සහ සවිංඥානික තීරණ ගැනීමේ හැකියාව ක්ෂය වීම**

තුමුල දත්ත විශ්ලේෂණය (bigdata analytics) සහ යාන්ත්‍රික ඉගෙනුම් (machine learning) ඇල්ගොරිතම ආශ්‍රයෙන් තීරණ ගැනීම බහුල වීම හේතුකොට ගෙන යාන්ත්‍රික පද්ධති තුළට ඇතුළත් කළ දත්ත පමණක් පදනම්ව කටයුතු කිරීමේ අවදානමක් ඇති වීම නිසා වර්තතමානයේදී බැංකු ක්ෂේත්‍රය සමාජයෙන් තවදුරටත් ඈත් වේ.

## අභියෝග

පහත විස්තර කෙරෙන පරිදි තාක්ෂණය මත මෙහෙය වෙන බැංකුරණයේදී මුහුණපාන ප්‍රධානතම අභියෝග යන් වන්නේ නීති හා නියාමන රාමුවල වෙනස්කම් සිදු කිරීම සහ බැංකුවල සහ මහ බැංකුවේ අභියෝගාත්මක භූමිකා යන ඒවාය.

**අ) නීති හා නියාමන රාමුවල වෙනස්කම් සිදුකිරීම**

තාක්ෂණයේ වේගවත් ප්‍රගමනය හේතුවෙන් පවතින නීති හා නියාමන රාමු නිරන්තරව යල් පැනීමට ලක්වන අතර නව නීති හා රෙගුලාසි හඳුන්වාදීම සඳහා පිළිපදින දීර්ඝ ක්‍රියාපටිපාටීන් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර කිරීමට හේතු සහගත වේ. මෙරට තත්ත්වය සැලකීමේ දී, තොරතුරු පද්ධති හා විද්‍යුත් ගනුදෙනු පිළිබඳව බලපැවැත්වෙන ප්‍රධානතම නීති වනුයේ පරිගණක අපරාධ පනත සහ විද්‍යුත් ගනුදෙනු පනතයි. මෙයට අමතරව, තොරතුරු සුරක්ෂිතතාවය, පද්ධතීන්හි උපයෝජ්‍යතාව, පාරිභෝගික ආරක්ෂණය වැනි ඒ ඒ විෂය සම්බන්ධයෙන් විශේෂ නියාමනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇත. එනමුත්, දත්ත ආරක්ෂණය, අප්‍රකාශිත විද්‍යුත් මුදල්, වළාකුළු පරිගණනය වැනි විෂය කාරණා සම්බන්ධයෙන් තවමත් ප්‍රමාණවත් නීති සහ නියාමනයන් සම්පාදනය විය යුතුව තිබේ.

**ආ) මහ බැංකුවේ අභියෝගාත්මක භූමිකාව**

සමාජය විසින් අප්‍රකාශිත විද්‍යුත් මුදල්, විසිරි ලෙජර තාක්ෂණය වැනි නවාංග තාක්ෂණයන් වැළඳගැනීම නිසා ඒ හේතුවෙන් මිල ස්ථායීතාව සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායීතාවය වැනි මහ බැංකුවල පරමාර්ථයන් හට තර්ජන ඇති වේ. තවද, තාක්ෂණික ප්‍රගමනය නිසි ලෙස නියාමනය යටතට ගෙන ඒමට අපොහොසත් වුවහොත් නියාමනය නොවූ මහා පරිමාණ වෛකල්පිත මූල්‍ය ක්ෂේත්‍රයක් පැවතීමේ හැකියාවක් ඇත.

**ඇ) බැංකුවල අභියෝගාත්මක භූමිකාව**

ඩිජිටල් යුගය තුළ ඉදිරියට යාමේ දී බැංකු නිරන්තරව විකාසය වන අභියෝගවලට මුහුණ දෙන අතර ඒ පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීම හා ඊට යෝග්‍ය ප්‍රතික්‍රියා මාර්ග ගැනීමට හැකි විය යුතුය. ව්‍යාපාර අභිමතාර්ථයන් සපුරා ගැනීමට සමාන්තරව බැංකු විසින් ඉහත තාක්ෂණික නවතාවයන් සමගින් පැනනගින ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම, මුදල් විශුද්ධිකරණය, ක්‍රමිකව විකාසය වන සයිබර් ප්‍රහාර, නව ලුහුඬුකම් හා අනෙකුත් නියාමනයන් සමග අනුකූල නොවීම් යනාදිය මගහරවා ගැනීමට පරීක්ෂාකාරී ආරක්ෂණ යාන්ත්‍රණ සිදු කළ යුතුය. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී බැංකු අධ්‍යක්ෂ මණ්ඩල හා ඉහළ කළමනාකාරිත්වය තාක්ෂණික අවදානම තේරුම් ගෙන කටයුතු කළ යුතු වේ.

## ඉදිරි ගමන

### පරීක්ෂාකාරීව තාක්ෂණය ප්‍රතිග්‍රහණය කිරීම

නව්‍ය තාක්ෂණය කෙරෙහි විශ්වාසය තබන බැංකු එකී තාක්ෂණය නිසා ඇතිවන නව අවදානම් නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටි සහ පාලනයන් ඵලදායී ලෙස පිහිටුවා තැබීම අවශ්‍ය වේ. තවද, බැංකු විසින් තාක්ෂණය මත පදනම් වූ මූල්‍ය සේවා ලබා ගැනීම සඳහා තෙවන පාර්ශ්ව සේවක ප්‍රතිපාදකයන් මත විශ්වාසය තැබීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති බැවින් එකී තෙවන පාර්ශ්වයන් විසින් ලබාදෙන සේවාවන්ගේ ප්‍රමිතිය එකී සේවාවන් බැංකුව විසින්ම ලබා දෙන්නේ නම් පවතින ප්‍රමිතියම පැවතීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය පාලන ක්‍රියාමාර්ග ගත යුතුය.

### තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව සහ දූරදර්ශී නායකත්වයක අවශ්‍යතාව

තොරතුරු තාක්ෂණයේ ඇති වැදගත්කම යටිතල පහසුකම් කළමනාකරණයෙන් හා ව්‍යාපාර කටයුතු සඳහා වන යෙදවුම් නඩත්තු කිරීමෙන් ඔබ්බට විහිදේ. තොරතුරු තාක්ෂණයේ ක්‍රියාකාරකම් උපායමාර්ගික හැඩගැසීමට අනුකූලවීම සහ තාක්ෂණික සහ සයිබර් අවදානම් දූරදර්ශීව කළමනාකරණය කිරීමේදී ඩිජිටල් සාක්ෂරතාවයෙන් සපිරි විචක්ෂණශීලී සහ දූරදර්ශී අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටීම වැදගත්ය.

**අනුවර්තී නියාමන පිවිසුම සහ නියාමනයේදී තාක්ෂණයේ භාවිතය (RegTech)**

විප්ලවකාරී තාක්ෂණයේ උපරිම ඵල සමාජයට ලබාදීම සහ එමගින් පැනනගින අවදානම්වලින් ආරක්ෂා වීම සඳහා සහයෝගීමත් සහ සවිඥානක නියාමන තන්ත්‍රයක් පැවැතීම අනිවාර්ය වේ.

තාක්ෂණික භාවිතය පිළිබඳව පැහැදිලිව නිර්ණය කළ නියාමන පැවතීම, නියාමනය නොවූ විශාල වෛකල්පිත මූල්‍ය ක්ෂේත්‍රයක් නැගී ඒමේ අවදානම මඟ හරවා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ආයක වේ.

**තාක්ෂණික අවදානම් සඳහා ඇති ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම**

මේ සම්බන්ධයෙන් බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණික අවදානම් සඳහා ඇති ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාර්ගෝපදේශන සංග්‍රහයක් පිළියෙල කර ඇත. එමගින් තාක්ෂණික අවදානම් පරීක්ෂාව, මූලික ආරක්ෂණ ප්‍රමිති (baseline security standards) සමග වන අනුකූලතා පිළිබඳ බාහිර පාර්ශ්ව විසින් කෙරෙන සහතික කිරීම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් පිළිබඳ ආරක්ෂණ සමාලෝචන, ඉහළ කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන්මාලා, තාක්ෂණික අවදානම් කළමනාකරණ නිලධාරීන් සඳහා වන සහතික පත්‍ර පුහුණු/සහතික පාඨමාලා, නම් කරන ලද සුදුසුකම් සහිත අවම තාක්ෂණික නිලධාරීන් සංඛ්‍යා සඳහා වන නියාමන සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ වෘත්තීය සුදුසුකම් ඇති නිලධාරීන් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයට යොදා ගැනීම සඳහා වන නියාමන වැනි අංශ ඇතුළත්ය.

මීට අමතරව, මහ බැංකුව විසින් ඉහළ නෛසර්ගික තාක්ෂණික අවදානමක් සහිත බැංකු සඳහා ඒ වෙනුවෙන් වෙන්වූ තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හෝ තෙවන පාර්ශ්වයක හවුල් තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයක සහාය ලබා ගැනීම අනිවාර්ය කිරීම සඳහා ඇති හැකියාව සොයා බලමින් පවතී. මේ ලෙසම ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය තාක්ෂණ පහසුකම් සහ වලාකුළු පරිගණනයට සම්බන්ධව බැංකුවලින් අපේක්ෂා කරන අවම නියාමනයන් නිර්වචනය කිරීම සහ බැංකු මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම සම්බන්ධව වන ප්‍රතිපත්ති රාමු විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සකසමින් පවතී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසු මූල්‍ය තාක්ෂණ නවතාවයන් තෝරා ගැනීම සහ කාණ්ඩදාම තාක්ෂණයේ භාවිතය පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ සහභාගිත්වයෙන් යුතු කමිටු දෙකක් පත් කරන ලදී. මෙකී ප්‍රවේශයන් මඟින් මූල්‍ය තාක්ෂණික සමාගම්වලට සහ බැංකුවලට සම මට්ටමක් තැනීම සඳහා අවශ්‍ය මූලික නීති හා නියාමන රෙගුලාසි රාමුව සකස් කරදීම සිදු වනු ඇත.

තොග මිලට ගැනීම සඳහා පාර්ශවයන් දෙකක් හෝ කිහිපයක් අතර සන්ධානයක් ඇති බවට සැක කටයුතු අවස්ථාවන්හි දී එබඳු තොරතුරු ද බැංකු මගින් වාර්තා කල යුතුය.

ගංවතුර සහ අයහපත් කාලගුණික තත්වයන් සහ ඊට අදාල සිද්ධීන් සම්බන්ධයෙන් හානියට පත් ව්‍යාපාර සහ සාමාන්‍ය කටයුතු යලි නගා සිටුවීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එකී හානියට පත්වූ ණය ලබාගත් ගණුදෙනුකරුවන් සඳහා ඒ ඒ අවස්ථානුකූලව සහනයක් ලබාදීමට බලපත්‍රලාභී බැංකු වලට උපදෙස් ලබාදුන් අතර එම තොරතුරු 2017 වසරේ ජුනි 30 වනවිට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂතුමා වෙත වාර්තා කිරීමටද උපදෙස් දෙන ලදී.

රජය මගින් මුලපුරන ලද මූල්‍ය කටයුතු සඳහා ප්‍රවේශ වැඩිදියුණු කිරීම සඳහා 2017 අයවැය යෝජනාවන්ට සහය දැක්වීමක් ලෙස හඳුනාගත් අංශ වෙත ණය පහසුකම් ලබාදීම ඉහළ නැංවීමට බැංකු වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව, කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත, අපනයන, සංචාරක සහ කෘෂිකාර්මික කටයුතු සඳහා බැංකුව ලබාදුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රතිශතයක් ද තරුණ සහ කාන්තා කටයුතු යන එක් එක් අංශ සඳහා වෙන වෙනම බැංකුවේ මුළු ණයදීම් වලින් සියයට 5 කට නොඅඩු ප්‍රතිශතයක් පවතින පරිදි ණය ලබාදිය යුතුය.

තවද, ආගමික නිවාඩු දිනයක් නොවන සතියේ දින 7 තුළම, යම්කිසි දිස්ත්‍රික්කයක් තුළ අවම වශයෙන් බැංකුවේ එක් ශාඛාවක් හෝ විවෘතව තැබිය යුතු බවට ද, රුපියල් මිලියන 5 ට අඩු ණය ලබාදීමේ ක්‍රියාවලිය වේගවත් කල යුතු බවටද, බැංකු ශාඛාවකින් ණය ලබාදීමේ දී, ලබාදෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 15 කට නොඅඩු ප්‍රතිශතයක් අදාළ බැංකු ශාඛාව ස්ථාපිත ප්‍රදේශය තුළ ව්‍යාපාර සංවර්ධනය සඳහා ලබා දිය යුතු බවට ද බලපත්‍රලාභී බැංකු වලට උපදෙස් දෙමින් බැංකු සේවාවන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2017 වසරේ ජූලි 01 දින සිට ඉහත සඳහන් කල පරිදි ලබා දෙන්නාවූ ණය පහසුකම් පිළිබඳව සෑම කාර්තුවක් තුළදීම තොරතුරු වාර්තා කිරීමට බැංකු වලට උපදෙස් දීම මගින් ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි බැංකු අධීක්ෂණය සඳහා කටයුතු කරන ලදී.

## 8.3 බැංකු නොවන මූල්‍ය ආයතනවල කාර්ය සාධනය

### බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

ණය වර්ධනයෙහි මන්දගාමී බව, ලාභදායිත්වය අඩුවීම සහ අක්‍රිය ණය වර්ධනය මධ්‍යයේ වුවද, වසර තුළ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, 2017 වසරේදී ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියෙන් සියයට 7.9 ක් නියෝජනය කරමින් වත්කම් වල සියයට 11.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ප්‍රාග්ධනය හිතකර මට්ටමක පවත්වා ගැනීමත්, අවම නියාමන මට්ටමට වඩා වැඩි ප්‍රමාණයක් ද්‍රවශීලතාව පවත්වා ගැනීමත් සමග මෙම අංශය ශක්තිමත් තත්ත්වයේ පැවැතිනි. පෙර වසරේ වාර්තා වූ ණය ගැනීම්වල ඉහළ වර්ධනයේ අඩුවීමක් පෙන්නුම් කල අතර, වර්ධනය වූ වත්කම් ප්‍රධාන වශයෙන්ම තැන්පතු හරහා මූල්‍යනය වීම මගින් අංශයේ මූල්‍යන මූලාශ්‍රයේ මාරුවීමක් පෙන්නුම් කෙරිනි. දුර්වල මූල්‍ය තත්වයක් සහිත සමාගම් යළි යථාතත්වයට පත් කරමින්, මෙම අංශයේ ස්ථායිතාවය පවත්වාගැනීම සඳහා වැඩි සැලකිල්ලක් යොමු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

#### ව්‍යාපාර වර්ධනය

(අ) ව්‍යාප්තියː 2017 වසර අවසානයේදී මෙම අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 45 කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 6 කින් සමන්විත විය. රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් සමග විලච් ෆිනෑන්ස් පීඑල්සී සමාගම ඒකාබද්ධ වීමත්, සෙන්ට්‍රල් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ් ඒකාබද්ධ වීමත් සමග වසර තුළදී ඒකාබද්ධවීමේ ගනුදෙනු 2 ක් සම්පූර්ණ විය. ගනුදෙනුකරුවන්ට සපයන සේවාවන් පුළුල් කිරීමෙන් සහ ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කිරීමෙන් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ආර්ථික කටයුතු හා සංවර්ධනය සඳහා වසර පුරාම තවදුරටත් දායක විය. 2017 වසර අවසන් වනවිට බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශාඛා 1,362 ක් සහ වෙනත් සේවා ස්ථාන 781 ක් පැවතිණි. ඉන් ශාඛා 920 ක් (සියයට 67 ක්) බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබිණි.

(ආ) වත්කම්ː 2017 වසර අවසානයට සමස්ත වත්කම් පදනම රුපියල් බිලියන 1,355 දක්වා රුපියල් බිලියන 143 ක මධ්‍යස්ථ වර්ධනයක් වසර තුළදී වාර්තා කල අතර, එය 2016 වසරේදී වාර්තා කල සියයට 21.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 11.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. වත්කම් පදනම ප්‍රධාන වශයෙන්ම ණය සහ අත්තිකාරම් වලින් සමන්විත වූ අතර, එය වත්කම් වලින් සියයට 78.0 ක් විය. වත්කම් වර්ධනයෙන්

**8.8 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ශාඛා ව්‍යාප්තිය - පළාත් අනුව**

| පළාත | 2016 දෙසැම්බර් අවසානයට | 2017 දෙසැම්බර් අවසානයට (අ) |
|---|---|---|
| බස්නාහිර | 424 | 442 |
| දකුණ | 144 | 148 |
| සබරගමුව | 105 | 111 |
| වයඹ | 136 | 147 |
| මධ්‍යම | 147 | 152 |
| ඌව | 66 | 68 |
| උතුරුමැද | 94 | 100 |
| නැගෙනහිර | 107 | 110 |
| උතුර | 81 | 84 |
| **එකතුව** | **1,304** | **1,362** |

(අ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**8.9 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය**

| අයිතමය | 2016 (අ) | | 2017 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | ප්‍රතිශතයක් ලෙස | 2016 (අ) | 2017 (ආ) |
| **වත්කම්** | | | | | | |
| ණය සහ අත්තිකාරම් (ශුද්ධ) | 962.7 | 79.4 | 1,057.1 | 78.0 | 21.0 | 9.8 |
| ආයෝජන | 111.7 | 9.2 | 118.1 | 8.7 | 12.1 | 5.7 |
| වෙනත් | 137.5 | 11.3 | 179.8 | 13.3 | 36.6 | 30.8 |
| **වගකීම්** | | | | | | |
| සමස්ත තැන්පතු | 530.7 | 43.8 | 686.7 | 50.7 | 10.4 | 29.4 |
| සමස්ත ණය ගැනීම් | 438.7 | 36.2 | 396.0 | 29.2 | 39.6 | -9.7 |
| ප්‍රාග්ධන මූලිකාංග | 146.1 | 12.1 | 169.7 | 12.5 | 18.7 | 16.1 |
| වෙනත් | 96.4 | 8.0 | 102.6 | 7.6 | 23.5 | 6.4 |
| **සමස්ත වත්කම්/වගකීම් (ශුද්ධ)** | **1,211.9** | **100.0** | **1,355.0** | **100.0** | **21.7** | **11.8** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

8

සියයට 66 ක් සඳහා ණයදීමේ කටයුතු මූලිකත්වය ගෙන ඇත. ණය සහ අත්තිකාරම් සඳහා වැඩි වශයෙන් දායක වූ මූල්‍ය කල්බදු, ණය සහ අත්තිකාරම් වලින් සියයට 50.0 ක් නියෝජනය කල අතර ඉතිරිය වෙනත් සුරක්ෂිත ණය (සියයට 40 ක්) නියෝජනය කරන ලදී.

2017 වසර තුළදී සමස්ත ණය ප්‍රමාණයේ ව්‍යාප්තිය මන්දගාමීවීමේ පැහැදිලි සලකුණු පෙන්නුම් කරන ලදී. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී ණය වර්ධනය මන්දගාමී වීමට, මෝටර් වාහන ආනයනය කිරීම හා මෝටර් වාහන වෙනුවෙන් ණය ලබාදීම සීමා කිරීම සඳහා ගන්නා ලද රාජ්‍ය හා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, 2017 වසර තුළ වාර්තා වූ අඩු ආර්ථික වර්ධනය සහ වෙළෙඳපොළෙහි පැවති ඉහළ පොලී අනුපාතයන් හේතු විය. 2016 වසර තුළදී වාර්තා වූ, ණය පහසුකම් වල සියයට 21.0 ක ඉහළ වර්ධනය හා සැසඳීමේදී 2017 වසරේදී ප්‍රදානය කරන ලද ණය පහසුකම් ප්‍රමාණය රුපියල් බිලියන 1,057.1 ක් දක්වා සියයට 9.8 (රුපියල් බිලියන 94) ක අඩු වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත්, ණය වර්ධනයෙන් සියයට 62.0 ක් මූල්‍ය කල්බදු මගින් සමන්විත වූ අතර සියයට 36.0 ක් සුරක්ෂිත ණය හා අත්තිකාරම් වලින් සමන්විත විය. වසර තුළදී කුලී සින්නක්කර කළඹ රුපියල් බිලියන 15.0 කින් (සියයට 35.6 කින්) සංකෝචනය විය. කෙසේ වෙතත්, 2016 වසරේදී මූල්‍ය කල්බදු කළඹෙහි වාර්තා වූ සියයට 17.0 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී එය සියයට 13.0 ක් විය.

කොටස්, ප්‍රාග්ධන වෙළෙඳපොළ ණය උපකරණ, රජයේ සුරැකුම්පත් හා දේපල වල ආයෝජන වලින් සමන්විත ආයෝජන කළඹෙහි වර්ධනය 2016 වසරේදී පැවති සියයට 12.1 කට සාපේක්ෂව 2017 වසරේදී සියයට 5.7 ක් දක්වා අඩුවිය. වසර තුළදී රජයේ සුරැකුම්පත්වල ආයෝජන සහ කොටස් වෙළෙඳපොළ ආයෝජන අඩුවූ අතර, ඒකක භාර වල ආයෝජනයන්හි සැලකිය යුතු වර්ධනයක් වසර තුළදී වාර්තා විය. බැංකු හා මූල්‍ය ආයතනවල පවත්වා ගෙන යන තැන්පතු ඉහළ යාම හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම මුදල්, බැංකු හා මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ශේෂයන්, වෙළෙඳතොග හා ස්ථාවර වත්කම්වලින් සමන්විත වෙනත් වත්කම් 2017 වසර තුළදී සියයට 30.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**8.9 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සේවාවන් අනුව සපයන ලද සමස්ත ණය පහසුකම්**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) වගකීම්:** වගකීම්වලින් ප්‍රධාන කොටසක් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් නියෝජනය කරන අතර එය අංශයේ සමස්ත වගකීම්වලින් සියයට 50.7 ක් විය. ණයගැනීම් සහ ප්‍රාග්ධනය පිළිවෙළින් සියයට 29.2 ක් හා සියයට 12.5 ක් විය.

මෙම අංශයේ ව්‍යාප්තිය විශාල වශයෙන් තැන්පතු රැස්කිරීම හරහා මූල්‍යනය වීමෙන්, අංශයෙහි මූල්‍යනය වීමේ මූලාශ්‍රයේ වෙනස්වීමක් පෙන්නුම් කරයි. 2016 වසරේ වාර්තා වූ සියයට 10.4 ක තැන්පතු වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී එය රුපියල් බිලියන 686.7 ක් දක්වා සියයට 29.4 කින් වර්ධනය විය. 2016 වසරේ වාර්තා වූ සියයට 11.1 ක කාලීන තැන්පතුවල වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී එය සියයට 29.2 කින් වර්ධනය වූ අතර පෙර වසරේ වාර්තා වූ සියයට 1.7 ක ඉතුරුම් තැන්පතුවල සෘණ වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී එය සියයට 35.3 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, සමස්ත තැන්පතු සඳහා ප්‍රධාන වශයෙන් දායක වන කාලීන තැන්පතු සමස්ත තැන්පතුවලින් සියයට 95.5 ක් නියෝජනය කරයි. මෙම අංශයේ 2016 වසර තුළදී වාර්තා වූ සියයට 39.6 ක ණයගැනීම් වල ඉහළ වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 396.0 ක් දක්වා සියයට 9.7 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. තැන්පතු මත රඳා පැවැත්මේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම, තැන්පතු පොලී අනුපාතයන් අඩුවීමේ ප්‍රවණතාවය හේතු වී ඇත.

**8.10 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ තැන්පතුවල සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | සංයුතිය % | |
|---|---|---|---|---|
| | 2016 | 2017 (අ) | 2016 | 2017 (අ) |
| ස්ථාවර තැන්පතු | 507.7 | 655.7 | 95.7 | 95.5 |
| ඉතුරුම් තැන්පතු | 22.2 | 30.0 | 4.2 | 4.4 |
| තැන්පතු සහතිකපත් | 0.9 | 1.0 | 0.2 | 0.2 |
| **මුළු තැන්පතු** | **530.7** | **686.7** | **100.0** | **100.0** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.10 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන්ම 2018 ජනවාරි 01 දින වනවිට රුපියල් බිලියන 1 ක මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලීම සඳහා සමාගම් විසින් සිය අවම මූලික ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ 2016/17 මූල්‍ය වසර තුළ සමාගම් අභ්‍යන්තරව උත්පාදනය කරන ලද ලාභ හේතුවෙන් ප්‍රාග්ධනය ඉහළ යෑම නිසා 2017 වසර අවසානය වන විට අංශයේ ප්‍රාග්ධන මූලිකාංග රුපියල් බිලියන 169.7 ක් දක්වා සියයට 16.1 කින් වර්ධනය විය.

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම්

**(අ) ණය අවදානම:** ප්‍රධාන වශයෙන්ම, 2017 වසරේ පළමු භාගයේදී ඇතිවූ ගංවතුර තත්වයත්, රටපුරා පැවති නියඟය සහ ආර්ථික කටයුතු මන්දගාමී වීමත් හේතුවෙන් දළ අක්‍රීය ණය ප්‍රමාණය 2017 වසරේදී රුපියල් බිලියන 65.9 ක් දක්වා රුපියල් බිලියන 12.9 කින් (සියයට 24 කින්) වර්ධනය විය. දළ අක්‍රීය ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සහ ණය කළඹෙහි වර්ධනය පහළ යෑම හේතුවෙන් 2016 වසරේ සියයට 5.3 ක්වූ දළ අක්‍රීය ණය අනුපාතය 2017 වසරේදී සියයට 5.9 දක්වා වර්ධනය විය. අක්‍රීය ණය සඳහා සිදුකරන ලද විශේෂිත වෙන්කිරීම් වල වර්ධනය හේතුවෙන් සමස්ත ණය අලාභ වෙන්කිරීම් ප්‍රමාණය රුපියල් බිලියන 42.2 ක් දක්වා රුපියල් බිලියන 7.4 කින් වර්ධනය විය. 2016 වසරේ සියයට 65.7 ක් වූ වෙන්කිරීම් ආවරණ අනුපාතයට සාපේක්ෂව 2017 වසරේදී එය සියයට 64.0 ක් දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමේ සලකුණු පෙන්නුම් කරමින් 2016 වසරේ සියයට 1.2 ක් ලෙස වාර්තා වූ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය 2017 වසරේදී සියයට 1.5 ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, අවදානම් අවම කිරීමේ උපක්‍රම නිසි ලෙස යොදාගැනීම හේතුවෙන් මෙම අංශයේ ණය අවදානම පාලනය කළ හැකි මට්ටමේ පැවතිණි.

**(ආ) වෙළෙඳපොළ අවදානම:** වෙළෙඳ කළඹ සහ විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනු සඳහා නිරාවරණය වීම අවම මට්ටමක පැවැතීම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වෙළෙඳපොළ අවදානම අවම මට්ටමක පැවැතිණි.

**පොලී අනුපාත අවදානම:** වසරේ දෙවන භාගයේදී පොලී අනුපාතයන්ගේ ක්‍රමානුකූලව සිදුවූ පහළ යෑමත් සමඟ මෙම අංශයේ පොලී අනුපාත අවදානම අඩු විය. අංශයේ පොලී සහිත වත්කම් හා වගකීම් වල පැවති කල්පිරීමේ ඍණ පරතරය, ශුද්ධ පොලී ආන්තිකය ධනාත්මකව පවත්වා ගැනීම සඳහා හේතු විය.

**කොටස් මිල:** මෙම අංශයේ සමස්ත වත්කම් වලින් සියයට 1.0 ක් පමණ වූ ලැයිස්තුගත කොටස් වල ආයෝජන රුපියල් බිලියන 14.2 ක අවම මට්ටමක පැවති නිසා කොටස් වෙළෙඳපොළ වෙත නිරාවරණය වීම ඉතා පහළ මට්ටමක පවතින බැවින්, වසර තුළ කොටස් වෙළෙඳපොළ හා සම්බන්ධ අවදානම අවම මට්ටමක පැවැතිණි.

**(ඇ) ද්‍රවශීලතා අවදානම:** 2017 වසර තුළ පැවති සමස්ත ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, අවම අවශ්‍යතාව වන රුපියල් බිලියන 91.1 ට වඩා රුපියල් බිලියන 35.5 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. මෙම අංශයේ ණයදීමේ කටයුතු සංකෝචනය වීම හේතුවෙන් 2016

8

**8.11 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේදී පැවති අතිරික්ත ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණය වන රුපියල් බිලියන 15.4 ට සාපේක්ෂව 2017 දී අතිරික්ත ද්‍රවශීලතා වත්කම්වල වර්ධනයක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් දක්වන අනුපාතය 2016 වසරේ පැවැති සියයට 7.1 සිට 2017 වසරේදී සියයට 8.9 දක්වා වැඩි විය. 2017 අවසානය වන විට තැන්පතුවලට ද්‍රවශීල වත්කම් දක්වන අනුපාතය, කාලීන තැන්පතු හා ණයගැනීම් සඳහා වන සියයට 10.0 ක සහ ඉතුරුම් තැන්පතු සඳහා වන සියයට 15.0 ක අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පැවතිණි.

**8.11 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ආදායම් සහ වියදම් සංයුතිය**

| අයිතමය | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු. බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | වටිනාකම (රු. බිලියන) | සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස |
| **ශුද්ධ පොලී ආදායම** | **92.1** | **7.9** | **102.7** | **7.7** |
| පොලී ආදායම | 188.9 | 16.1 | 231.5 | 17.3 |
| පොලී වියදම | 96.8 | 8.3 | 128.9 | 9.6 |
| පොලී නොවන ආදායම | 28.3 | 2.4 | 34.0 | 2.5 |
| පොලී නොවන වියදම | 65.6 | 5.6 | 80.0 | 6.0 |
| අක්‍රීය ණය සඳහා වෙන් කිරීම් (ශුද්ධ) | 7.6 | 0.6 | 13.5 | 1.0 |
| **බදු පෙර ලාභය** | **47.2** | **4.0** | **43.2** | **3.2** |
| **බදු පසු ලාභය** | **31.5** | **2.7** | **25.8** | **1.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ලාභදායීත්වය සහ ප්‍රාග්ධන සම්පත්

(අ) **ලාභදායීත්වය:** ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 102.7 ක් දක්වා සියයට 11.5 ක වර්ධනයක් වාර්තා කළ ද එය 2016 වසරට වඩා අඩු වර්ධන වේගයකි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සියයට 22.6 ක් පමණක් වූ පොලී ආදායමේ වර්ධනයට සාපේක්ෂව පොලී වියදම සියයට 33.1 කින් ඉහළ යෑමය. එහි ප්‍රතිඵලයක් ලෙස අංශයේ ශුද්ධ පොලී ආන්තිකය (ශුද්ධ පොලී ආදායම, සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස) 2016 වසරේදී පැවති සියයට 7.9 සිට 2017 වසරේදී සියයට 7.7 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ප්‍රධාන වශයෙන්ම ණය පැහැරහැරීමේ ගාස්තු හා වෙනත් සේවා ගාස්තු වල වර්ධනය හේතුවෙන් පොලී නොවන ආදායම් සියයට 20.3 කින් වර්ධනය වූ අතර ප්‍රධාන වශයෙන්ම සේවක පිරිවැය ඉහළ යාම හේතුවෙන් පොලී නොවන වියදම් සියයට 21.9 කින් ඉහළ යෑම, ලාභදායීත්වය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. අක්‍රිය ණය සඳහා කරන ලද ණය අලාභ වෙන්කිරීම් ප්‍රමාණය 2016 වසරේදී පැවැති රුපියල් බිලියන 7.6 හා සැසඳීමේදී 2017 වසරේදී රුපියල් බිලියන 13.5 ක් දක්වා රුපියල් බිලියන 6 කින් වැඩිවිය. ප්‍රධාන වශයෙන්ම ඉහළ ගිය අරමුදල් සපයා ගැනීමේ පිරිවැය සහ ඉහළ ණය අලාභ සඳහා වෙන්කිරීම් හේතුවෙන් 2016 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 31.5 ක ලාභයට සාපේක්ෂව 2017 වසරේදී ලාභය සියයට 18.0 ක අඩුවීමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 25.8 ක බදු පසු ලාභයක් වාර්තා කරන ලදී. ලාභදායීත්වය කෙරෙහි අහිතකර තත්ත්වයක් පෙන්නුම් කරමින් වසර තුළ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය පදනම් අංක 80 කින් අඩුවී සියයට 3.2 ක් ලෙස වාර්තා

**8.12 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ලාභදායීත්ව දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වූ අතර හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය ආසන්න වශයෙන් පදනම් අංක 700 කින් අඩුවී සියයට 16.1 ක් ලෙස වාර්තා විය.

(ආ) ප්‍රාග්ධනය: මෙම අංශය තුළ ඇතිවිය හැකි ඕනෑම අහිතකර කම්පනයකට සාර්ථකව මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කරගනිමින්, වසර තුළදී එහි සමස්ත ප්‍රාග්ධන මට්ටම අවම අවශ්‍යතාවයට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වා ගන්නා ලදී. ප්‍රධාන වශයෙන්ම, 2018 ජනවාරි 01 දිනට නියම කර ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාව වන රුපියල් බිලියන 1 දක්වා ප්‍රාග්ධන ප්‍රමාණය වැඩිකර ගැනීමට සමාගම් විසින් ගන්නා ලද උත්සාහයත්, රඳවාගත් ඉපැයුම් වල වර්ධනයත් හේතුවෙන් සමස්ත නියාමන ප්‍රාග්ධනය රුපියල් බිලියන 145.3 දක්වා සියයට 25.1 කින් වර්ධනය විය.

මූලික ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත පිළිවෙළින් 2016 වසරේදී වාර්තා වූ සියයට 11.3 ක සහ 11.7 ක සිට 2017 වසරේදී පිළිවෙළින් සියයට 12.4 ක් සහ 13.1 ක් දක්වා වර්ධනය වීමෙන් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයන්හි ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කල අතර ඒවා අවම අවශ්‍යතා මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතිණි. නියාමන ප්‍රාග්ධනය, පළමුපෙළ ප්‍රාග්ධනයෙන් සහ දෙවන පෙළ ප්‍රාග්ධනයෙන් සමන්විත වූ අතර සමස්ත නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 95.9 ක් සඳහා පළමු පෙළ ප්‍රාග්ධනය දායක විය. පළමු පෙළ ප්‍රාග්ධනය ප්‍රධාන වශයෙන්ම සමන්විත වන්නේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය, ව්‍යවස්ථාපිත සංචිත අරමුදල සහ ප්‍රකාශිත රඳවාගත් ලාභයෙනි. දෙවන පෙළ

**8.13 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම මත බර තැබූ වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.12 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) | 2016 (අ) | 2017 (ආ) |
| **පළමු පෙළ: මූලික ප්‍රාග්ධනය** | **113.0** | **139.3** | **100.0** | **100.0** |
| නිකුත්කළ සහ ගෙවානිමි සාමාන්‍ය කොටස්/මහජන කොටස් (මුදල්) | 63.4 | 65.9 | 56.2 | 47.3 |
| අසමුච්චිත, නිදහස්කළ නොහැකි වරණීය කොටස් | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| කොටස් අධිමිල | 0.6 | 0.5 | 0.5 | 0.4 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 15.6 | 19.1 | 13.8 | 13.7 |
| සාමාන්‍ය සහ අනෙකුත් නිදහස් සංචිත | 24.0 | 28.0 | 21.2 | 20.1 |
| වෙනත් | 9.3 | 25.7 | 8.2 | 18.5 |
| **දෙවන පෙළ: අතිරේක ප්‍රාග්ධනය** | **14.1** | **17.1** | **100.0** | **100.0** |
| යෝග්‍ය ප්‍රත්‍යාගණන සංචිත | 2.3 | 2.3 | 16.0 | 13.4 |
| පොදු වෙන් කිරීම් | 0.4 | 0.5 | 2.5 | 2.9 |
| යෝග්‍ය අනුමත සුරැකුම් රහිත උපකාරක ණය | 11.7 | 14.6 | 82.8 | 85.1 |
| වෙනත් | -0.2 | -0.2 | -1.4 | -1.4 |
| **නියාමන ගැලපීම්** | **-10.9** | **-11.1** | | |
| **මුළු නියාමන ප්‍රාග්ධන පදනම** | **116.2** | **145.3** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාග්ධනයෙන් සියයට 82.8ක් උපකාරක ණය වලින් සමන්විත වන අතර ප්‍රත්‍යාගණන සංචිත සියයට 16.0 ක් නියෝජනය කරයි. කෙසේවෙතත්, දුර්වල මූල්‍ය තත්වයන් හේතුවෙන් සමාගම් කිහිපයක අවම ප්‍රාග්ධන අවශ්‍යතා ප්‍රමාණයට වඩා අඩු ප්‍රාග්ධනයක් පවතින අතර දැනට ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටියි.

## අධීක්ෂණ සහ නියාමන සංවර්ධනයන්

2017 වසර තුළදී මෙම අංශයේ ස්ථායීතාවය හා ශක්තිමත්භාවය වර්ධනය කිරීමේ සහ අංශය කෙරෙහි පවතින මහජන විශ්වාසය වැඩි කිරීමේ අරමුණින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවිධ විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2017 වසර සඳහා වන ජාතික අයවැය යෝජනා අනුව, ණය පහසුකම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාතය සංශෝධනය කිරීම සඳහා නව විචක්ෂණශීලී විධානයක් නිකුත් කරන ලදී. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම් වල ප්‍රාග්ධන තත්ත්වය ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තර හා බාහිර අනපේක්ෂිත කම්පනයන්ට සාර්ථකව මුහුණ දීම වර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් වල අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව අදියරෙන් අදියර වැඩි වන ලෙස ඉහළ නංවන ලදී. ඒ

8

විශේෂ සටහන 11

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවක් හඳුන්වා දීම

**1. හැඳින්වීම**

මූල්‍ය සේවා වෙළඳපොලක දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය, වර්ධනය, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය යන ගුණාංගයන් ප්‍රවර්ධනය කරනු ලබන ප්‍රධානතම සාධක වනුයේ, ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා පැහැදීමයි. එබැවින්, නීතිරීති බලාත්මක කිරීම, මූල්‍ය සාක්ෂරතාවය දියුණු කිරීම හරහා ගනුදෙනුකරුවන්ගේ දැනුම වර්ධනය කිරීම, හෙළිදරව් කිරීමේ අවශ්‍යතා දියුණු කිරීම, ගනුදෙනුකරුවන් හා සේවා සපයන්නන් යන දෙපාර්ශ්වයේම වගකීම් සහගත හැසිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඵලදායි පැමිණිලි හැසිරවීමේ ක්‍රමවේදයන් සඳහා ප්‍රවිශ්ඨ වීමට ඇති ඉඩකඩ පුළුල් කිරීම තුළින් මූල්‍ය සේවා සපයන්නන්ගේ අසාධාරණ, රැවටිලි සහගත හෝ අනිසි හැසිරීම් ඉවත් කිරීම ඉතා වැදගත් වේ.

**2. මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින වත්මන් තත්වය**

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා ඇත. එමගින් භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලතල පැවරී ඇති නමුත්, ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා පරිභෝජනය කරන්නන් සඳහා ලැබී ඇති සුරක්ෂිතභාවය සීමිතය. විශේෂයෙන්ම මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා 2003 මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය පිහිටුවන ලදි. එසේම, මූල්‍යමය වශයෙන් පීඩාවට පත් පුද්ගලයන් හට උපදේශන සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය විසින් 2009 ජනවාරි මස 'උපදේශන' නමින් ණය උපදේශන කේන්ද්‍රය පිහිටුවන ලදි. ඉහත සඳහන් ආයතන හැර මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලද විධිමත් පාරිභෝගික ආරක්ෂණ අධිකාරියක් නොමැත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ගනුදෙනුකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා 2011 දෙසැම්බර් මාසයේදී බලපත්‍රලාභී බැංකුවල ගනුදෙනුකරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්බන්ධ විධානය නිකුත් කර ඇත. ගනුදෙනුකරුවන් හා බලපත්‍රලාභී බැංකු අතර යහපත් සම්බන්ධතාවයක් ගොඩනැගීම සහ එමගින් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා බැංකු අංශයෙහි ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා එය සකස් කර ඇත. එමෙන්ම, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කරන්නන්ගේ අපේක්ෂාවන් සපුරාලීමේ අරමුණින්, ප්‍රාථමික අලෙවිකරුවන් හා ඒවායේ ගනුදෙනුකරුවන් අතර පවතින සම්බන්ධතාවය පාලනය කිරීම සඳහා ගනුදෙනුකරු ප්‍රඥප්තිය සම්බන්ධ විධානය 2013 නොවැම්බර් මස නිකුත් කරන ලදි.

**3. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය**

දළ වශයෙන් 1,360 ක් පමණ වන ශාඛා ජාලයකින් සමන්විත බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය රටපුරා ආසන්න වශයෙන් මිලියන 3ක පමණ ණය ගනුදෙනුකරුවන් සහ මිලියන 4ක පමණ තැන්පතුකරුවන් සඳහා සේවා සපයයි. රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය සඳහා මෙම අංශය පහසුකම් සැපයූවද පසුගිය වසර කිහිපය තුළ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහ ගනුදෙනුකරුවන්ගේ අයිතීන්ට දැඩි ලෙස හානිදායක වන ව්‍යාපාරික හැසිරීම්ද වාර්තා විය. බහු ණය ප්‍රධානය, ප්‍රමාණවත් නොවන ණය ඇගයීම්, සදාචාර නොවන ණය අයකරගැනීමේ ක්‍රියාමාර්ග සහ ගනුදෙනුකරුවන්ගේ අධික ණයගැතිබව සඳහා මුල්වන අසීමාන්තික පොලී අයකිරීම් මෙයට ඇතුළත් වේ. මෙම පසුබිම සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදුකිරීම හා සම්බන්ධ ගැටළු විසඳීමේ අරමුණින් මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා අනුකූලතා රාමුවක් නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන ලදි.

**4. මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ නව අනුකූලතා රාමුව**

මූල්‍ය සේවාවන් පරිභෝජනය කරනු ලබන ගනුදෙනුකරුවෙකුට ඇතිවිය හැකි හානිය අවම කිරීම සඳහා මූල්‍ය ආයතන අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග/රීති සමූහයක් 2018 අප්‍රේල් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවෙහි අන්තර්ගත වේ. G-20 මුදල් අමාත්‍යවරුන් හා මහ බැංකු වල අනුමැතිය යටතේ ආර්ථික සහයෝගිතාවය හා සංවර්ධනය සඳහා වන සංවිධානය (OECD), මූල්‍ය ස්ථායිතා මණ්ඩලය (FSB) සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමග ඒකාබද්ධව වැඩිදියුණු කර ඇති මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ පිළිගත් මූලික මූලධර්ම වලට අනුකූලව මෙම අනුකූලතා රාමුව පිළියෙල කර ඇත.

**5. මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුවේ ප්‍රධාන ලක්ෂණ**

5.1. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය හා වගකීම

බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනුදෙනුකරුවන් නිසි ලෙස දැනුම්වත් වීම හා ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා වීම තහවුරු කිරීම සඳහා වගකීමෙන් බැඳී සිටී. මෙය සමාගමෙහි සංස්කෘතිය, ආයතනික යහපාලනය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය අංගයක් විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල විසින් සමාගමේ සියලුම සේවකයන් හා පත්කරන ලද නියෝජිතයන් මෙම විධානයෙහි ඇතුළත් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අවම ප්‍රමිතීන් පිළිපැදීම විධිමත් නිරීක්ෂණ ක්‍රමවේදයක් මගින් සහතික කල යුතුය.

5.2. ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධ අවම ප්‍රමිතීන්

i. **හෙළිදරව් කිරීම් සහ විනිවිදභාවය**

මූල්‍ය සේවාවන් සම්බන්ධ සම්පූර්ණ, පැහැදිලි, සංක්ෂිප්ත, නිවැරදි සහ නොමග නොයවන සුළු ආකාරයේ තොරතුරු ගනුදෙනුකරුවන්ට ලබාදීම, හෙළිදරව් කිරීම සහ විනිවිදභාවය යන මූලධර්මයන් හරහා සහතික කර ඇති අතර එය ගනුදෙනුකරුවන්ගේ අභිමතාර්ථය සඳහා වඩාත් වැදගත් වේ. සම්මත හා නියමිත ආකෘතින්ට අදාල තොරතුරු හෙළිදරව් කිරීම ඉටු කරගැනීම සඳහා විධානය මගින් අනුබල ලබා දී ඇති අතර එමගින් ගනුදෙනුකරුවන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහය වන අතර ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවාවන් සම්බන්ධ සාධනීය තීරණයක් ගැනීම සඳහා අවකාශ හිමිවේ. මෙම විධානය මගින් සම්මත ප්‍රමිතීන්ට අනුව තොරතුරු සැපයීමට පෙළඹවීම හරහා විවිධ මූල්‍ය සේවාවන් එකිනෙක සංසන්දනය කර ගනුදෙනුකරුවන්ට තීරණ ගැනීමට මග පෑදීම තුළින් ඔවුන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරයි.

මෙම නියෝගය මගින් ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවාවන් සඳහා ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ, අවදානම සහ නියමයන් හා කොන්දේසි යන මූලික තොරතුරු ගනුදෙනුකරුවන් කැමති භාෂාවකින් එනම් සිංහල, දෙමල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගැනීමේ අයිතිය හිමි වේ.

- **වෙළඳ දැන්වීම් අවධිය**

ඕනෑම මාධ්‍යයක් මගින් සිදුකරනු ලබන සියලුම වෙළඳ දැන්වීම් වල මූල්‍ය සේවාවන් සම්බන්ධ නිවැරදි, තේරුම්ගත හැකි සහ සත්‍ය තොරතුරු අන්තර්ගත විය යුතුය. තවද, අදාල මූල්‍ය සේවාවන් පිළිබඳ අත්‍යාවශ්‍ය සියළු තොරතුරු අන්තර්ගත වීම සිදුවිය යුතු අතර එම දැන්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ දැන්වීම් සම්බන්ධව කලින් කලට නිකුත් කරනු ලබන නියමයන් හා මාර්ගෝපදේශයන් වලට අනුකූල විය යුතුය.

- **පූර්ව ගිවිසුම් අවධිය**

සියලුම ආයතන තම ණය සහ තැන්පතු සේවාවන් සම්බන්ධව එනම් මූල්‍ය සේවාවේ ස්වභාවය, මූල්‍ය සහ අනෙකුත් ප්‍රතිලාභ, ගාස්තු හා අයකිරීම්, කොමිස්, පොලී අනුපාත, මූල්‍ය සේවාව ලබාගැනීම සඳහා ගනුදෙනුකරු අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටිය, මූලික නියමයන් හා කොන්දේසි, පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය, ගිණුම් සහ ගනුදෙනු සම්බන්ධ සීමාවන් ආදිය ඇතුලත් සරල භාෂාවෙන් සකස් කරන ලද මූලික තොරතුරු ලේඛනයක් එහි අපේක්ෂිත ගනුදෙනුකරුවන්ට ලබාදීම සඳහා පවත්වා ගත යුතුය.

- **ගිවිසුම් අවධිය**

මූල්‍ය සේවාවන් සම්බන්ධ නියමයන් හා කොන්දේසි සම්පූර්ණයෙන් අවබෝධ කරගැනීම සඳහා අවස්ථාව ලබාගැනීම ගනුදෙනුකරුවන්ගේ අයිතිවාසිකමකි. ගනුදෙනුකරුවන් හට අපක්ෂපාති තොරතුරු ලබාදිය යුතු අතර තොරතුරු ලබා දීමේදී, මූල්‍ය සේවාවේ ඇති සංකීර්ණ බව, එම සේවාව සමග බැඳී ඇති අවදානම, ගනුදෙනුකරුගේ මූල්‍ය අවශ්‍යතා, දැනුම, හැකියාවන් හා අත්දැකීම් සමග ගැලපිය යුතුය.

- **ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම පරිදි**

වාර්තාකරන කාලපරිච්ඡේදය සඳහා ගනුදෙනුවල සඵල පොලී අනුපාතිකය, කාලපරිච්ඡේදය සඳහා අයකල යුතු ගාස්තු සහ හිඟ හිටි ශේෂය ඇතුළත් සවිස්තරාත්මක තොරතුරු සේවා ප්‍රකාශයක් ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි සැපයිය යුතුය.

- **පොදු හෙළිදරව් කිරීම්**

සියලුම සමාගම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය සහ කල්බදු මූල්‍යකරණ බලපත්‍රය, විගණනය කරන ලද නවතම මූල්‍ය ප්‍රකාශන කට්ටලය, ණය ශ්‍රේණිය, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ කර ගත හැකි තොරතුරු, ව්‍යාපාර ගනුදෙනුකරන වේලාවන් සහ නිවාඩු දැන්වීම් යන තොරතුරු සියලුම ව්‍යාපාර ස්ථානවල ප්‍රදර්ශනය කල යුතුය.

ii. **ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීම**

සාපේක්ෂව අඩු මූල්‍ය සාක්ෂරතාවයක් සහිත ග නුදෙනුකරුවන්ගෙන් සමන්විත අංශයකට සේවය කිරීමේදී එම ගනුදෙනුකරුවන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කාර්යයකි. ඒ අනුව, මූල්‍ය සේවා හා සම්බන්ධ ගනුදෙනු වලදී අවදානම් පිළිබඳව අර්ථාන්විතව අවබෝධ කර ගැනීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ විශ්වාසය යන සාධක සිය වර්තමාන මෙන්ම අනාගත ග නුදෙනුකරුවන් තුළ වර්ධනය කිරීමට උපකාරි වන

8

යාන්ත්‍රණයක් පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් කටයුතු කළ යුතුය. තවද, විශේෂයෙන්ම ඉහළ ණයගැතිභාවය, බහු ණය ලබාගැනීම සහ ආපසු ගෙවීම් ප්‍රමාදවීම් යනාදියේ ආදීනව සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන් දැනුම්වත් කල යුතුය.

iii. **වගකීම් සහගත ව්‍යාපාර හැසිරීම**

මූල්‍ය සේවා සපයන්නන් හා ඔවුන්ගේ නියෝජිතයන් ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීමේදී සාධාරණව, අවංකව, වෘත්තිමය කුසලතා හා අවධානය යනාදී කරුණු වලින් සමන්විත වීම වගකිව යුතු ව්‍යාපාරික කටයුතු වලදී මූලික මූලධර්මයන් වේ. යම් මූල්‍ය සේවාවක් හෝ මූල්‍ය උපදේශනයක් ලබාදීම සඳහා ගිවිසුමකට එළඹීමට පෙර එම ගනුදෙනුවේ ස්වභාවය සහ ඒ පිළිබඳව ගනුදෙනුකරු ලබාදෙන මූලික තොරතුරු අනුව ගනුදෙනුකරුගේ මූල්‍ය ශක්‍යතාවය මෙන්ම අවශ්‍යතාවය මෙහිදී මූල්‍ය සේවා සපයන්නා විසින් තක්සේරු කල යුතුය. විශේෂයෙන්ම එම මූල්‍ය සේවාව ආශ්‍රිත අවදානම දැරීමේ හැකියාවක් ගනුදෙනුකරු සතුව පවතීද යන්න කෙරෙහි අවධානය යොමු කල යුතුය. සියලු මූල්‍ය සේවා සපයන්නන් ගනුදෙනුකරුවන් අධික ණයගැතිභාවයෙන් වලක්වා ගැනීම සඳහා ඔවුන්ට ණයලැබීමට ඇති සුදුසුකම නිවැරදිව අගය කිරීම සඳහා සිය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව මනාව විශ්ලේෂණය කල යුතුය.

මූල්‍ය ආයතන වල විශේෂයෙන්ම ගනුදෙනුකරුවන් සමග සෘජුවම සම්බන්ධ වන සේවකයින් සුදුසුකම්ලත් සහ පුහුණු අය විය යුතුය. එසේම, මූල්‍ය සේවා සපයන්නන්ගේ සහ පත්කල නියෝජිතයන්ගේ වගකීම් සහගත ව්‍යාපාර හැසිරීම, සියලු ගනුදෙනුකරුවන්ට සාධාරණව සැලකීම සහ අයුතු අවදානම් ගැනීම වැළැක්වීම යන කරුණු ඉටු වන පරිදි ඔවුන්ගේ දීමනා ව්‍යුහය සකස් කල යුතුය.

මූල්‍ය සේවා ආයතන වල සේවකයින් සහ පත්කරන ලද නියෝජිතයින් විසින්, ණය අයකර ගැනීමේදී ගනුදෙනුකරුවන්ට සිදුකරන ලද හිරිහැර කිරීම්, අපවාදාත්මක ලෙස ණය එක්රැස් කිරීම් සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබාදීම සහ මූල්‍ය සේවා සඳහා සම්බන්ධ කරගැනීමේ අරමුණින් ගනුදෙනුකරුවන්ට හෝ මහජනතාවට මූල්‍ය සේවා සම්බන්ධව වැරදි සහගත හෝ නොමග යවන සුළු තොරතුරු ලබා දීම සහ අනවශ්‍ය බලපෑම් සිදු නොකල යුතුයි. සේවකයන්ගේ සහ පත්කරන ලද නියෝජිතයන්ගේ මනා ව්‍යාපාරික හැසිරීම අඛණ්ඩව අධීක්ෂණය කිරීමට මූල්‍ය සේවා සපයන්නන් පියවර ගත යුතුය.

iv. **පැමිණිලි හැසිරවීම සහ සහන සැලසීම**

මූල්‍ය සේවා සපයන්නන්, නියාමන ආයතන සහ අනෙකුත් ස්වාධීන ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායි පැමිණිලි හැසිරවීමේ සහ සහන සැලසීමේ යාන්ත්‍රණ මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීමේ කේන්ද්‍ර ලෙස කටයුතු කරයි.

ප්‍රවේශ වීමට පහසු, දැරිය හැකි, ස්වාධීන, සාධාරණ, වගකීම් සහගත, කාලීන සහ කාර්යක්ෂම පැමිණිලි හැසිරවීමේ සහ සහන සැලසීමේ යාන්ත්‍රණයන් වෙත පිවිසීමට සියලු ගනුදෙනුකරුවන්ට හැකියාව තිබිය යුතුය. මෙම යාන්ත්‍රණයන් ප්‍රමාදවීම් හෝ ගනුදෙනුකරුවන් මත අයුතු ලෙස ගාස්තු අයකිරීම හෝ අනිසි බර පැටවීම නොකල යුතුය. මෙහිදී පළමුවෙන්ම පැමිණිලි හැසිරවීමේ අභ්‍යන්තර යාන්ත්‍රණය හරහා ගැටළු විසඳා ගැනීමට ගනුදෙනුකරුවන් උනන්දු කල යුතු අතර මූල්‍ය සේවා සපයන්නා මගින් කාර්යක්ෂමව නොවිසඳෙන පැමිණිලි සඳහා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ නියාමන ආයතන වැනි ස්වාධීන සහන සැලසීමේ ක්‍රමවේද මගින් ගැටලු නිරාකරණය කරගැනීමට ගනුදෙනුකරුවන් පෙළඹවිය යුතුය.

v. **අපක්ෂපාතිව සහ සාධාරණව සැලකීම**

සාධාරණ සහ අපක්ෂපාති අයුරින් ගනුදෙනුකරුවන් සමග කටයුතු කිරීම, මූල්‍ය සේවා සපයන්නන් සහ පත් කරන ලද නියෝජිතයන් විසින් සිය ව්‍යාපාර සංස්කෘතියේ කොටසක් සේ සලකනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගනුදෙනුකරුවන්ගේ කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භාවය යනාදි භේදයකින් තොරව සෑම අවස්ථාවකදීම සමානාත්මකව, අවංකව සහ සාධාරණව සැලකීමට මූල්‍ය සේවා සපයන්නන් පියවර ගැනීමට කටයුතු කිරීම මෙම විධානයේ දක්වා ඇති අවශ්‍යතාවයකි. වයස්ගත, ආබාධිත හෝ අඩු මූල්‍ය සාක්ෂරතාවයකින් හෙබි ගනුදෙනුකරුවන්ට මූල්‍ය සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීමට විශේෂ අවධානයක් ලබා ගැනීමේ අයිතියක්ද ඇත.

vi. **ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම.**

නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අවශ්‍ය පියවර ගත යුතුය. ණය තොරතුරු කාර්යාංශය වැනි ආයතන සමග පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීමේදී මෙන්ම ගනුදෙනුකරුවන්ගේ තොරතුරු එක්රැස් කිරීම, සකස් කිරීම හා හුවමාරු කර ගැනීම යනාදි කාර්යයන්හිදී එහි නිශ්චිත අරමුණ සහ කොන්දේසි සහ තොරතුරු වල ආරක්ෂාව සඳහා ආයතන විසින් පනවා ඇති නීතිරීති පිළිබඳව ගනුදෙනුකරුවන් සම්පූර්ණයෙන් දැනුම්වත් කිරීමේ වගකීම මූල්‍ය සේවා සපයන්නන් වෙත පැවරී ඇත.

8

**6. සාරාංශය**

මූල්‍ය සේවාවන්හි සංකීර්ණත්වය ඉහළයාම, තාක්ෂණයේ සීඝ්‍ර වෙනස්වීම් සහ මූල්‍ය වෙළඳපොළ සංවර්ධනයන් හා නවෝත්පාදනයන් හේතුවෙන් අඩු ආදායම්ලාභී සහ අත්දැකීම් අඩු ගනුදෙනුකරුවන්ට වෙළඳපොළ තුළ නිතර අභියෝගයන්ට මුහුණ පෑමට සිදුවේ. මූල්‍ය සේවාවන් අලෙවිකරණය හා සම්බන්ධ ගනුදෙනුවලදී ගනුදෙනුකරුවන්ගේ අවදානම් කලින් හඳුනා ගැනීමට හා ඒවා අවම කිරීමට අපොහොසත් වීම, මූල්‍ය ආයතනයේ කීර්තිය කෙරෙහි අනවශ්‍ය අවදානමක් ඇති කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා පැහැදීම හානි වී යා හැක. මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුව ක්‍රියාත්මක කිරීමෙන් මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ශක්තිමත් බව තහවුරු කිරීම සඳහා ගනුදෙනුකරුවන්ගේ අයිතීන් ආරක්ෂා වීමත් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ශක්තිමත් වීමත් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ.

අනුව, රුපියල් මිලියන 400 ක්වූ අවම මූලික ප්‍රාග්ධනය 2018 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 1.0 ක් දක්වාද, 2019 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 1.5 ක් දක්වාද, 2020 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 2.0 ක් දක්වාද, 2021 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 2.5 ක් දක්වාද වැඩි කරන ලදී.

**වසර තුළදී දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නියාමන ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී.** අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව සමඟ අනුකූල නොවූ සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා තැන්පතු හා ණය ගැනීමේ සීමාවන් පනවන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වල අධීක්ෂණය හරහා හඳුනාගත් අනුකූල නොවීම් සඳහා දඩ පමුණුවන ලදී. තවද, අධීක්ෂණයේදී හඳුනාගත් නැවත නැවතත් සිදුකල අනුකූල නොවීම් හේතුවෙන් එක් බලපත්‍රලාභී මුදල් සමාගමක ණයදීම් සම්බන්ධව ද සීමාවක් පනවන ලදී. ප්‍රධාන වශයෙන්, ඒකාබද්ධ කිරීම් සහ උපාය මාර්ගික ආයෝජකයින් හරහා නව ප්‍රාග්ධන ආයෝජන කිරීම මගින් පීඩාවට පත් මුදල් සමාගම්වල ගැටලු නිරාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මෙම නියාමන ක්‍රියාමාර්ග විධිමත් කිරීම සඳහා අලුතින් පිහිටුවන ලද නිරාකරණය කිරීමේ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව හා එක්ව මූල්‍ය පද්ධතිය සඳහා ගැටලු නිරාකරණය කිරීමේ රාමුවක් හඳුන්වා දීමට නියමිතය.

**ගංවතුර, අහිතකර කාලගුණික තත්වයන් සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවන්ගේ අහිතකර බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර වල සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත්කිරීම සඳහා පහසුකම් සැලසීමේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස පොදු යහපත සඳහා එවන් ණය ගනුදෙනුකරුවන් වෙත සහන ලබාදීමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවසර ලබාදෙමින්** 2017 මැයි මාසයේදී චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

## රජයේ සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන්

**ප්‍රාථමික අලෙවිකාර අංශය එහි ක්‍රියාකාරකම්වල ක්‍රමානුකූල සාමාන්‍ය වර්ධනයක් වසර තුළදී වාර්තා කරන ලදී.** බලපත්‍රලාභී වාණිජ බැංකුවල අලෙවිකාර ඒකක 7 කින් සහ බැංකු නොවන

**8.13 සංඛ්‍යා සටහන**

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරිත්වය**

රු. බිලියන

| අයිතමය | 2016 | 2017 (අ) | වාර්ෂික වර්ධනය (%) 2016 | වාර්ෂික වර්ධනය (%) 2017 (අ) |
|---|---|---|---|---|
| **සමස්ත වත්කම්** | **260.0** | **337.2** | **-2.3** | **29.7** |
| සමස්ත ආයෝජන කළඹ | 222.7 | 314.2 | -3.9 | 41.0 |
| වෙළඳ සුරැකුම් | 96.6 | 127.6 | -26.0 | 32.1 |
| කල් පිරීම තෙක් තබා ගන්නා | 106.8 | 107.8 | 123.7 | 1.0 |
| විකිණීම සඳහා පවතින | 19.3 | 78.7 | -63.9 | 308.2 |
| ප්‍රතිවිකුණුම් | 21.5 | 17.5 | -27.9 | -18.8 |
| **හිමිකම් සහ වගකීම්** | **260.0** | **337.2** | **-2.3** | **29.7** |
| සමස්ත ප්‍රාග්ධනය | 45.4 | 53.3 | 43.3 | 17.5 |
| ප්‍රතිමිලදී ගැනුම් | 124.0 | 59.1 | -24.4 | -52.3 |
| ප්‍රධාන කාර්යාලයට ගෙවීම් (ආ) | 85.3 | 200.6 | 68.7 | 135.2 |
| **බදු පෙර ලාභය** | **15.2** | **15.1** | **70.8** | **-0.1** |
| බදු පසු ලාභය | 14.7 | 13.4 | 73.0 | -8.9 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%) | 5.8 | 5.1 | 1.7 | -0.7 |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (%) (ඇ) | 52.1 | 12.9 | 3.7 | -39.2 |
| **අවදානම් මත බරතැබූ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය (%) (ඇ)** | **61.5** | **55.9** | **33.5** | **-5.6** |
| තෝලන කාලය (ඇ) | 2.6 | 2.3 | -1.4 | -0.3 |
| ගනුදෙනු | 22,073.7 | 17,085.8 | 35.6 | -22.6 |
| ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු | 1,508.2 | 1,660.0 | -20.4 | 10.1 |
| ද්විතියික වෙළඳපොළ ගනුදෙනු | 20,565.5 | 15,425.8 | 42.9 | -25.0 |
| එකවර මිලදී ගැනුම් | 1,184.8 | 824.2 | -12.9 | -30.4 |
| එකවර විකුණුම් | 1,687.5 | 1,178.5 | -21.0 | -30.2 |
| ප්‍රතිමිලදී ගැනුම්, ප්‍රතිවිකුණුම් | 17,693.2 | 13,423.1 | 62.4 | -24.1 |

(අ) තාවකාලික

(ආ) බැංකුවල ප්‍රාථමික අලෙවිකාර ඒකක පමණි.

(ඇ) බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් පමණි.

සටහන: එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. සමාගමේ මූල්‍ය දත්ත ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාථමික අලෙවිකරුවන්[1] 8 දෙනෙකුගෙන් සමන්විත ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අංශයේ සමස්ත වත්කම්, සමස්ත ප්‍රාග්ධනය සහ සමස්ත ආයෝජන කළඹෙහි සැලකිය යුතු වර්ධනයක් සටහන් වුවද, ලාභදායීත්වයෙහි ආන්තික පහළ යාමක් පෙන්නුම් කෙරිණි.

### වත්කම් හා වගකීම්

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සමස්ත වත්කම් ප්‍රමාණය 2016 වසරේදී පැවති රුපියල් බිලියන 260.0 සිට 2017 වසර තුළදී රුපියල් බිලියන 337.2 ක් දක්වා සියයට 29.7 කින් වැඩි විය.** ප්‍රාථමික අලෙවිකාර අංශයේ සමස්ත වත්කම් වලින් සියයට 93.2 ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනවලින් සමන්විත විය. වෙළෙඳ කළඹ, අලෙවිය සඳහා පවතින කළඹ සහ කල්පිරීම තෙක් තබා ගන්නා කළඹ යනාදියෙන් සමන්විත මෙම රජයේ සුරැකුම්පත්හි සමස්ත ආයෝජන කළඹ 2016 වසර සමඟ සැසඳීමේදී 2017 වසර අවසානය වනවිට රුපියල් බිලියන 314.2 ක් දක්වා සියයට 41.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී. රජයේ සුරැකුම්පත් වල පැවති වෙළෙඳ කළඹ සහ අලෙවිය සඳහා පැවති කළඹේ සිදුවූ සැලකිය යුතු වැඩිවීම් මෙම වෙනස සඳහා හේතු විය. 2016 වසර අවසානයේදී රුපියල් බිලියන 96.6 ක්ව පැවති වෙළෙඳ කළඹ, 2017 වසර අවසානය වන විට රුපියල් බිලියන 127.6 ක් දක්වා වැඩි වූ අතර, 2016 වසර අවසානයේදී රුපියල් බිලියන 19.3 ක් වූ අලෙවිය සඳහා පැවති කළඹ 2017 වසර අවසානය වන විට රුපියල් බිලියන 78.7 ක් දක්වා වැඩි විය. 2016 වසර අවසානයේ වාර්තා වූ බිලියන 106.8 ක කල්පිරීම තෙක් තබා ගන්නා කළඹ 2017 වසර අවසානය වන විට රුපියල් බිලියන 107.8 ක් දක්වා ආන්තික වශයෙන් වර්ධනය විය.

### ප්‍රාථමික අලෙවිකරු අංශයේ අවදානම්

**(අ) වෙළෙඳපොළ අවදානම:** ප්‍රාථමික අලෙවිකාර අංශයෙහි විය හැකි වෙළෙඳපොළ අවදානමට විශාල වශයෙන් නිරාවරණය වීම අවම කරමින් වෙළෙඳ කළඹ, සමස්ත ආයෝජන කළඹෙහි අනුපාතිකයක් ලෙස 2016 වසර අවසානයේ පැවති සියයට 43.4 සිට 2017 වසර අවසන් වන විට සියයට 40.6 ක් දක්වා අඩු විය.

1 පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සහ පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි ප්‍රාථමික අලෙවිකාර ඒකකය වෙත ප්‍රාථමික අලෙවිකාර ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් හි නියැලීම මාස 6ක කාලයක් සඳහා අත්හිටුවන ලදී. මූලික වශයෙන් 2017 ජූලි 06 වන දින පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේත්, 2017 අගෝස්තු 15 වන දින සිට පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි ප්‍රාථමික අලෙවිකාර ඒකකයේත් ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සිදුකරන ලද අතර, 2018 ජනවාරි 05 දින සිට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීම තවදුරටත් මාස 6 කින් දීර්ඝ කරන ලදී. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී ආයතනය 2017 ජූලි 24 දින සිට රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගි වීමෙන් ඉවත් විය.

**(ආ) ද්‍රවශීලතා අවදානම:** 2017 වසර අවසානය වන විට දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් සහ වගකීම් වල ඍණ නොගැළපීම අඩුවීම, ප්‍රාථමික අලෙවිකාර අංශයේ සමස්ත ද්‍රවශීලතා අවදානම සඳහා නිරාවරණය අඩු වීමට හේතු විය. 2016 වසර අවසානය වන විට පැවති දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් හා වගකීම් වල ඍණ නොගැළපීම රුපියල් මිලියන 2,671.8 ක් හෝ එක් දිනක් සඳහා වන වගකීම් වලින් සියයට 15.7 ක සිට 2017 වසර අවසානය වන විට රුපියල් මිලියන 1,077.4 දක්වා හෝ එක් දිනක් සඳහා වන වගකීම් වලින් සියයට 9.5 දක්වා සැලකිය යුතු ලෙස අඩුවිය. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අවදානම් රහිත රාජ්‍ය සුරැකුම්පත් විශාල ප්‍රමාණයක් පවත්වාගෙන යැම සහ එවැනි රාජ්‍ය සුරැකුම්පත් අනපේක්ෂිත ද්‍රවශීලතා පරතර පියවා ගැනීම සඳහා අරමුදල් සපයාගැනීමේ සුරැකුමක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව හේතුවෙන් 2015 හතරවන කාර්තුවේ සිට ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දුන් එක් ප්‍රාථමික අලෙවිකරුවෙකු හැර අනෙකුත් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ද්‍රවශීලතා අවදානම් මට්ටම වසර පුරා පහළ මට්ටමක පැවතුණි. ඊනැම ද්‍රවශීලතා පරතරයක් පියවා ගැනීම සඳහා පෙර සූදානම් කරගත් හදිසි අරමුදල් විධිවිධාන ප්‍රාථමික බොහොමයක් අලෙවිකරුවන් සතුව පැවතිණි.

### ලාභදායීත්වය සහ ප්‍රාග්ධනය

**2017 වසරේදී ප්‍රාථමික අලෙවිකරුවන් වාර්තා කල බදු පසු ලාභය, 2016 වසරේදී එම අගය වූ රුපියල් බිලියන 14.7 ට එරෙහිව රුපියල් බිලියන 13.4 ක් ලෙස වාර්තා විය.** 2016 වසරේදී රුපියල් බිලියන 8.8 ක් ලෙස වාර්තා කරන ලද ශුද්ධ පොලී ආදායම, 2017 වසර තුළදී රුපියල් බිලියන 14.1 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වුවද, 2016 වසරේදී රුපියල් බිලියන 8.4 ක්වූ ප්‍රාග්ධන ප්‍රතිලාභ 2017 වසරේදී රුපියල් බිලියන 2.1 ක් දක්වා විශාල වශයෙන් පහත වැටීම, ප්‍රාථමික අලෙවිකාර අංශයේ ලාභ අඩුවීමට ප්‍රධානවම දායක විය. කෙසේ වුවත්, 2016 වසරේදී වාර්තා වූ අධික ප්‍රාග්ධන ප්‍රතිලාභ, එක් ප්‍රාථමික අලෙවිකරුවකු විසින් සිදු කළ රාජ්‍ය සුරැකුම්පත් අලෙවියෙහි ප්‍රතිඵලයකි. ඒ අනුව, සමස්ත අංශය සඳහා වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් 2016 වසරේදී පැවති සියයට 5.8 සහ සියයට 52.1 සිට 2017 වසර අවසානය වින විට සියයට 5.1 ක් සහ සියයට 12.9 ක් දක්වා පහළ ගියේය.

**අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් මිලියන 350 ක සිට රුපියල් මිලියන 1,000 ක් දක්වා වැඩි කිරීම, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කොටස් හිමිකම සියයට 17.5 කින් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.**

2017 වසර අවසානය වන විට එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී හැරුණු විට සියලු බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ මූලික ප්‍රාග්ධනය, අවම අවශ්‍යතාවය වූ රුපියල් මිලියන 1,000 කට වඩා ඉහළ අගයක පවත්වා ගන්නා ලදී. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය අවම අනුපාතය වන සියයට 10.0 ට වඩා වැඩි අගයක පැවතුණ අතර එම අනුපාතය 2016 වසර අවසානයේදී වාර්තා වූ සියයට 61.5 ක සිට 2017 වසර තුළදී අවම මූලික ප්‍රාග්ධන මට්ටම වැඩි වීමෙන් පසුව සියයට 55.9 ක් දක්වා අඩුවිය.

### වෙළෙඳපොළ සහභාගිත්වය

**ප්‍රාථමික වෙළෙඳපොළ ක්‍රියාකාරකම්**: භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසි සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහභභාගීත්වය මිශ්‍ර කාර්ය සාධනයක් පිළිබිඹු කරන ලදී. 2017 වසරේදී පවත්වන ලද සමස්ත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි (52) මගින් පිළිගන්නා ලද සමස්ත ලංසු ප්‍රමාණයන් සඳහා බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය පිළිවෙළින් සියයට 66.6, සියයට 26.7 සහ සියයට 6.7 ක් විය. කෙසේ වෙතත්, 2017 වසරේදී පැවැත්වූ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 16 ක් තුළ පිළිගත් බැඳුම්කර වෙත සියයට 37.6 ක ඉහළම දායකත්වයක් දැක්වීමට බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සමත් වූ අතර බැංකු ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය පිළිවෙළින් සියයට 30.5 ක් සහ සියයට 31.9 ක් වශයෙන් වාර්තා විය.

**ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරකම්**: 2016 වසර හා සැසඳීමේදී 2017 වසර තුළදී රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු රුපියල් බිලියන 22,073.7 සිට රුපියල් බිලියන 17,085.8 ක් දක්වා සියයට 22.6 කින් සැලකිය යුතු ලෙස අඩු විය. 2017 වසර තුළදී සිදුකරන ලද සමස්ත ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 87.0 ක් ප්‍රතිමිළදී ගැනුම් ගනුදෙනු විය. එකවර මිළදී ගැනුම් සහ එකවර විකුණුම්, 2016 වසරේදී පැවති අගයන් සමග සැසඳීමේදී 2017 වසර තුළදී පිළිවෙළින් සියයට 30.4 කින් සහ සියයට 30.2 කින් අඩු විය.



### ඒකක භාර

**2017 වසර තුළදී, නව අරමුදලක් ස්ථාපනය වීම හා අරමුදල් හතරක් මෙහෙයුම් කටයුතුවලින් ඉවත්වීම නිසා ඒකක භාර ගණන තුනකින් පහළ යනු ලැබිණි.** 2016 වසරේ ආරම්භ වූ නව අරමුදල් 4 ට සාපේක්ෂව 2017 වසරේදී අලුතින් ස්ථාපනය කරන ලද ඒකක භාර අරමුදල් ගණන අඩු අගයකි. ඒකක භාර කළමනාකරණ සමාගම් ගණන නොවෙනස්ව 14 ක් පැවති අතර, 2016 වසර අවසානයේ 77 ක්ව පැවති ඒකක භාර ගණනට සාපේක්ෂව 2017 වසර අවසානයේදී ඒකක භාර ගණන 74 ක් දක්වා පහළ ගියේය. මෙම සමස්ත ඒකක භාර 74 අතරින් 71 ක් විවෘත අරමුදල් ද, 2 ක් සංවෘත අරමුදල් ද වූ අතර එක් ඩොලර් බැඳුම්කර අරමුදලක් විය. මෙම විවෘත අරමුදල්, මුදල් වෙළෙඳපොළ අරමුදල් 18 කින්ද, ගිල්ට් එජ්ඩ් (gilt edged) අරමුදල් 13 කින්ද, ආදායම් අරමුදල් 14 කින්ද, හිමිකම් වර්ධන අරමුදල් 8 කින්ද, සමතුලිත අරමුදල් 8 කින්ද, ෂරියා අරමුදල් 5 කින්ද, දර්ශක අරමුදල් 4 කින් හා මූලික හිමිකම් නිකුතු අරමුදලකින් සමන්විත විය.

### ව්‍යාපාර වර්ධනය

**ඒකක භාර අංශයෙහි සමස්ත වත්කම් 2016 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 103.1 සිට 2017 වසර අවසානයේදී රුපියල් බිලියන 128.8 ක් දක්වා සියයට 23.8 (රුපියල් බිලියන 24.8) කින් වර්ධනය වන ලදී.** නිකුත් කළ සමස්ත ඒකක ගණන ද, 2016 අවසානයේ දී පැවති 7,141 සිට 2017 වසර අවසානයේදී 7,638 ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වුවද, සමස්ත ඒකක හිමියන් ගණන 2016 වසර අවසානයේදී වාර්තා වූ 41,154 සිට 2017 වසර අවසානයේ දී 41,037 ක් දක්වා පහත වැටුණි. ඒකකයක් සඳහා ශුද්ධ වත්කම් වටිනාකම 2016 වසරේ අවසානයට පැවති රුපියල් 14.44 හා සසඳන විට, 2017 වසර අවසානයේදී රුපියල් 16.71 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

### ආයෝජනය

**ඒකක භාර විසින් රාජ්‍ය සුරැකුම්පත් හා හිමිකම් කොටස් යන දෙකෙහිම සිදු කරන ලද ආයෝජන සමස්ත වත්කම්වලට දරන ප්‍රතිශතය 2017 වසරේදී**

**8.14 සංඛ්‍යා සටහන**

**ඒකක භාර අංශයේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | 2016 | 2017 |
|---|---|---|
| ඒකක භාර සංඛ්‍යාව | 78 | 79 |
| සමස්ත ඒකක හිමියන්ගේ සංඛ්‍යාව | 41,154 | 41,037 |
| ඒකක නිකුතුන් ගණන (මිලියන) | 7,141 | 7,638 |
| සමස්ත වත්කම් (රු. බිලියන) | 104.0 | 128.8 |
| ශුද්ධ වත්කම් අගය (රු. බිලියන) | 103.1 | 127.6 |
| කොටස්වල ආයෝජන (රු. බිලියන) | 13.9 | 13.0 |
| සමස්ත ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%) | 13.5 | 10.2 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (රු. බිලියන) | 49.6 | 22.5 |
| සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%) | 48.1 | 17.7 |

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

**8.14 රූප සටහන**
**ශුද්ධ වත්කම් වටිනාකම අනුව ඒකක භාර අංශයේ අරමුදල් වර්ගීකරණය**




* වෙනත්: ෂරියා අරමුදල්, 0.7% දර්ශක අරමුදල් 0.1% මූලික හිමිකම් නිකුතු අරමුදල් සහ ඩොලර් අරමුදල්

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

**සැලකිය යුතු ලෙස පහළ යන ලදී.** රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය 2016 වසර අවසානයට පැවති රුපියල් මිලියන 49,632.4 සිට 2017 වසර අවසානයේදී රුපියල් මිලියන 22,543.3 ක් දක්වා සියයට 54.5 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. හිමිකම්වල ආයෝජනය 2016 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 13,923.4 සිට 2017 වසර අවසානයට රුපියල් මිලියන 13,011.6 ක් දක්වා සියයට 6.5 කින් පහළ ගියේය.

## රක්ෂණ අංශය

**2017 වසර තුළදී රක්ෂණ අංශයේ වත්කම් පදනමෙහි වර්ධනයක් වාර්තා කළ අතර, ඉපයීම් පහත වැටුණි.** 2017 වසර අවසානය වනවිට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් 27 ක් මෙහෙයුම් කටයුතුවල නිරත වූ අතර, එයින් සමාගම් 13 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල පමණක් ද, සමාගම් 12 ක් ජීවිත රක්ෂණ ව්‍යාපාරවල පමණක් ද, සමාගම් 2 ක් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙකෙහිමද නිරත විය. රක්ෂණ සමාගම් 9 ක් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත වී ඇත. තවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල පමණක් හෝ සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ යන ව්‍යාපාර දෙකෙහිම ද නිරතවූ රක්ෂණ තැරැව්කාර සමාගම් 61 ක් පැවතුණි.

**රක්ෂණ වාරික ආදායම, පවතින වෙළෙඳපොළ මිල ගණන් අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කරනු ලබන ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාප්තිය, 2017 වසරේදී සියයට 1.2 ක අගයක පැවතුණි.** මෙම අගය කලාපීය රටවල්වලට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයක් වන අතර එය ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. 2017 වසර තුළදී, දිගුකාලීන රක්ෂණ අංශයේ ව්‍යාප්තිය සියයට 0.5 ක් ද, සාමාන්‍ය රක්ෂණ අංශයේ ව්‍යාප්තිය සියයට 0.7 ක් ද විය. කෙසේ වෙතත්, රක්ෂණ ඝනත්වය 2016 වසරේදී වාර්තා වූ පුද්ගලයෙකුට රුපියල් 6,743 සිට පුද්ගලයෙකුට රුපියල් 7,482 ක් දක්වා 2017 වසරේදී සුළු වශයෙන් ඉහළ ගියේය.

## ව්‍යාපාර වර්ධනය

**සාමාන්‍ය රක්ෂණ අංශයෙහි වත්කම් පහළ ගිය ද, ප්‍රධාන වශයෙන්ම දිගුකාලීන රක්ෂණ අංශයෙහි වර්ධනය නිසා 2017 වසර තුළදී රක්ෂණ අංශයෙහි සමස්ත වත්කම් වර්ධනය විය.** 2017 වසර තුළදී, රක්ෂණ අංශයේ වත්කම් වර්ධනය සියයට 7.2 ක් වූ අතර, එය රක්ෂණ අංශයේ වත්කම් පදනම 2016 වසර අවසානයට පැවති රුපියල් බිලියන 521.4 ට සාපේක්ෂව 2017 වසර අවසානයට රුපියල් බිලියන 559.2 ක් දක්වා වර්ධනය කිරීමට හේතු විය. දිගුකාලීන රක්ෂණ අංශයේ වර්ධනය මෙම ව්‍යාප්තියට දායක විය. මෙම උප අංශය 2016 වසර අවසානය වනවිට පැවති රුපියල් බිලියන 345.7 ක සිට රුපියල් බිලියන 394.2 ක් වාර්තා කරමින් වසර තුළදී සියයට 14.0 කින් වර්ධනය විය. දිගුකාලීන රක්ෂණ අංශය, රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වලට දක්වන අනුපාතයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්වමින්, දිගුකාලීන වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය 2016 වසරේ වාර්තා කල සියයට 66.3 ට සාපේක්ෂව 2017 වසරේ සියයට 70.5 ක් වාර්තා කළේය. කෙසේ වුවද, සමස්ත සාමාන්‍ය රක්ෂණ උප අංශය එහි වත්කම් පදනමෙහි පහත යෑමක් වාර්තා කරමින්, 2016 වසර අවසානයට පැවති රුපියල් බිලියන 175.7 ට සාපේක්ෂව 2017 වසර අවසානයේදී බිලියන 165.1 ක් වාර්තා කළේය. ඒ අනුව, මෙම අංශයේ වත්කම්, රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ගත් කල 2016 වසරේ පැවති සියයට 33.7 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 29.6 ක් දක්වා පහත වැටුණි.

**රක්ෂණ අංශයෙහි දළ ලියාහළ වාරික ආදායමෙහි වර්ධනයට සාමාන්‍ය හා දිගුකාලීන යන රක්ෂණ අංශ දෙකම දායකත්වය සැපයීය.** රක්ෂණ අංශයෙහි දළ ලියාහළ වාරික ආදායම 2017 වසරේදී සියයට 12.2 කින් වර්ධනය විය. දිගුකාලීන රක්ෂණ උප අංශය, රක්ෂණ අංශයේ සමස්ත වත්කම් පදනමට දක්වන දායකත්වය අඩුවීමක් පෙන්නුම් කළද, සමස්ත දළ ලියාහළ වාරිකයේ ප්‍රතිශතයක් ලෙස සියයට 55.4 ක් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ උප අංශය දළ ලියාහළ වාරිකයට

8

### 8.15 සංඛ්‍යා සටහන
### රක්ෂණ අංශයේ ක්‍රියාකාරිත්වය

රු. බිලියන

| අයිතමය | 2016 (අ) | 2017 (ආ) |
|---|---|---|
| සමස්ත වත්කම් | 521.4 | 559.2 |
| රජයේ සුරැකුම්පත් | 202.3 | 218.0 |
| හිමිකම් කොටස් | 51.4 | 49.2 |
| අතැති මුදල් හා තැන්පතු | 44.2 | 65.2 |
| සමස්ත ආදායම | 184.4 | 201.6 |
| වාරික ආදායම | 143.0 | 160.4 |
| අයෝජන ආදායම | 41.5 | 41.1 |
| බදු පෙර ලාභය | 25.6 | 24.7 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%) (ඇ) | | |
| - දිගු කාලීන රක්ෂණය | 307.0 | 336.0 |
| - සාමාන්‍ය රක්ෂණය | 180.6 | 175.7 |
| රඳවා ගැනීම් අනුපාතය (%) | | |
| - දිගු කාලීන රක්ෂණය | 96.1 | 95.9 |
| - සාමාන්‍ය රක්ෂණය | 81.4 | 77.9 |
| හිමිකම් අනුපාතය (%) | | |
| - දිගු කාලීන රක්ෂණය | 37.4 | 29.8 |
| - සාමාන්‍ය රක්ෂණය | 64.8 | 64.3 |
| ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%) | | |
| - දිගු කාලීන රක්ෂණය | 84.9 | 80.0 |
| - සාමාන්‍ය රක්ෂණය | 100.2 | 102.7 |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | | |
| - දිගු කාලීන රක්ෂණය | 3.2 | 4.5 |
| - සාමාන්‍ය රක්ෂණය | 9.4 | 4.7 |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) | | |
| - දිගු කාලීන රක්ෂණය | 19.7 | 28.6 |
| - සාමාන්‍ය රක්ෂණය | 18.1 | 9.9 |
| ප්‍රාරක්ෂණ අනුපාතය (%) | | |
| - සාමාන්‍ය රක්ෂණය | 21.6 | 17.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) නුබුන්වත් ආන්තික අනුපාතය වෙනුවට 2016 වසරේ දී හඳුන්වාදෙන ලදී.

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

ප්‍රධානම ආයකත්වය දැක්වීය. සාමාන්‍ය රක්ෂණ අංශය 2017 වසරේදී සියයට 11.9 ක වර්ධනයක් දක්වමින් රුපියල් බිලියන 88.9 ක් වාර්තා කළේය. 2017 වසර තුළදී සියයට 9.1 ක වර්ධනයක් වාර්තා කළ රථවාහන රක්ෂණය, සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික සඳහා ප්‍රධාන ආයකත්වය සැපයීය. රථවාහන රක්ෂණ ක්ෂේත්‍රය සාමාන්‍ය රක්ෂණ අංශයෙහි දළ ලියාහළ වාරිකයෙන් සියයට 60.5 කට ආයකත්වයක් දැක්වීය. දිගුකාලීන රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකය ද සියයට 12.6 ක වර්ධන වේගයක් වාර්තා කරමින් රුපියල් බිලියන 71.5 ක් දක්වා ඉහළ ගියේය.

#### ඉපයීම්

**දිගු කාලීන රක්ෂණ අංශයෙහි ඉපයීම් වර්ධනය වුව ද, සාමාන්‍ය රක්ෂණ අංශයෙහි ඉපයීම් ශීඝ්‍ර පහළ යෑම නිසා රක්ෂණ අංශයෙහි සමස්ත ඉපයීම් පහළ ගියේය.** රක්ෂණ අංශය විසින් උපයන ලද සමස්ත ලාභය 2016 වසරේදී වාර්තා කරන ලද සියයට 67.5 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී සියයට 3.6 ක පහත යෑමක් වාර්තා කරන ලදී. සාමාන්‍ය රක්ෂණ අංශයේ කාර්ය සාධනයේ පහතවැටීම මෙම ශීඝ්‍ර වෙනසට ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, එක් සමාගමක අතිරික්ත හුවමාරුවක ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීන රක්ෂණ අංශයේ මෙම සැලකිය යුතු වර්ධනය නිරීක්ෂණය විය. ප්‍රාරක්ෂණ ලාභ, 2016 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 13.5 ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 11.4 ක් දක්වා සියයට 15.9 කින් පහත වැටුණි.

### 8.15 රූප සටහන
### රක්ෂණ අංශයේ දළ ලියාහල වාරික අදායම




මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

**රක්ෂණ අංශයේ සමස්ත හිමිකම්පෑම් 2016 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 63.6 ක සිට 2017 වසරේදී රුපියල් බිලියන 62.6 ක් දක්වා සියයට 1.7 කින් පහළ ගියේය.** සාමාන්‍ය රක්ෂණ අංශයේ හිමිකම්පෑම් 2016 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 41.0 සිට 2017 වසරේදී රුපියල් බිලියන 42.1 ක් දක්වා සියයට 2.7 ක සුළු වර්ධනයක් දැක්වීය. එමෙන්ම, දිගුකාලීන රක්ෂණ අංශයේ හිමිකම්පෑම් 2016 වසරේ පැවති රුපියල් බිලියන 22.6 සිට 2017 වසරේ රුපියල් බිලියන 20.4 දක්වා සියයට 9.6 කින් පහළ ගියේය.

**රක්ෂණ අංශයේ සමස්ත ආයෝජන ආදායම 2016 වසරේ පැවති රුපියල් බිලියන 41.5 ක සිට 2017 වසරේදී රුපියල් බිලියන 41.1 ක් දක්වා සියයට 1 කින් ආන්තිකව පහළ ගියේය.** දළ ලියාහළ වාරිකය ඉහළ යෑම සහ ආයෝජන ආදායම සුළු වශයෙන් පමණක් පහළ යෑම නිසා රක්ෂණ අංශයේ සමස්ත ආදායම 2016 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 184.5 සිට 2017 වසරේදී රුපියල් බිලියන 201.5 ක් දක්වා සියයට 9.2 කින් ඉහළ ගියේය.

**සාමාන්‍ය රක්ෂණ අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2016 වසරේ වාර්තා වූ සියයට 18.1 සිට 2017 වසරේ සියයට 9.9 ක් දක්වා පහළ ගිය අතර, දිගු කාලීන රක්ෂණ අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2016 වසරේ පැවති සියයට 19.7 සිට 2017 වසරේදී සියයට 28.6 ක් දක්වා ඉහළ ගියේය.** වත්කම් මත ප්‍රතිලාභය සැලකූ කල, සාමාන්‍ය රක්ෂණ අංශය 2016 වසරේ වාර්තා වූ සියයට 9.4 සිට 2017 වසරේදී සියයට 4.7 ක් දක්වා පහළ ගිය අතර, දිගුකාලීන රක්ෂණ අංශය 2016 වසරේ වාර්තා වූ සියයට 3.2 සිට 2017 වසරේදී සියයට 4.5 ක් දක්වා ඉහළ ගියේය.

## ප්‍රාග්ධනය සහ ආයෝජනය

**වසර තුළදී, රක්ෂණ සමාගම් දෙකක් හැර අනෙකුත් සියලුම රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා සපුරන ලදී.** තවද, 2017 වසරේදී එක් සමාගමක ලියාපදිංචිය අත්හිටුවා ඇති අතර, තවත් සමාගමක් නව රක්ෂණ බාරගැනීම අත්හිටුවන ලදී. සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වලට ප්‍රාග්ධන අනුපාතය 2016 වසරේ පැවති සියයට 49.1 සිට 2017 වසරේදී සියයට 48.5 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණු අතර, දිගුකාලීන රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වලට ප්‍රාග්ධන අනුපාතය 2016 වසරේ වාර්තා වූ සියයට 14.8 සිට 2017 වසරේදී සියයට 16.6 ක් දක්වා ඉහළ ගියේය.

**සාමාන්‍ය රක්ෂණ අංශයේ හා දිගුකාලීන රක්ෂණ අංශයේ ආයෝජන ප්‍රධාන වශයෙන් ණය සුරැකුම්පත්වලින් සමන්විත විය.** රජයේ සුරැකුම්පත්වල දිගුකාලීන රක්ෂණ අංශයේ වත්කම් 2017 වසරේදී සියයට 46.9 ක් වූ අතර එය 2016 වසරේ වාර්තා වූ සියයට 46.5 ට සාපේක්ෂව සුළු අඩුවීමකි. ඒ හා සමානව, රජයේ සුරැකුම්පත්වල සාමාන්‍ය රක්ෂණ අංශයේ වත්කම් 2016 දී වාර්තා වූ සියයට 22.8 ට සාපේක්ෂව 2017 දී සියයට 21.0 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි. හිමිකම්වල සිදු කළ ආයෝජනයේ ප්‍රමාණය සලකා බැලීමේදී, දිගුකාලීන රක්ෂණ අංශයේ සමස්ත ආයෝජනයෙන් හිමිකම්වල සිදු කළ ආයෝජනය 2016 වසරේ වාර්තා කළ සියයට 9.8 ක සිට 2017 වසරේදී සියයට 8.2 ක් දක්වා පහත වැටුනු අතර, සාමාන්‍ය රක්ෂණ අංශයේ එම අනුපාතය 2016 වසරේ වාර්තා කළ සියයට 10.0 ක සිට 2017 වසරේදී සියයට 10.2 ක් දක්වා ඉහළ ගියේය. සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත ආයෝජනවලින් සාංගමික ණය සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන 2016 වසරේ පැවති සියයට 6.6 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 7.6 ක ප්‍රතිශතයක් වාර්තා කරන ලදී. 2017 වසරේදී සාංගමික ණය සුරැකුම්පත්වල දිගුකාලීන රක්ෂණ අංශයේ වත්කම් සියයට 18.5 ක්වූ අතර 2016 වසරේදී එය සියයට 20.6 ක් විය.

## අධීක්ෂණ සහ නියාමන සංවර්ධනයන්

**රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් සුරක්ෂිත කරන අතරම, රක්ෂණ අංශයේ වෘත්තීයමය බව ප්‍රවර්ධනය කිරීමේ සහ කීර්තිනාමය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පවතින නියාමන ව්‍යුහය සඳහා සංශෝධන සිදු කිරීම හා මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කිරීම සිදු කරන ලදී.** රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ තැරැව්කාර කටයුතු හැරුණු විට වෙනත් උපයෝගී සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු බවට විධානයක් නිකුත් කරන ලදී. සියලුම රක්ෂණ තැරැව්කරුවන්ට වෙනත් ඕනෑම රක්ෂණ තැරැව්කරුවකු හෝ උප තැරැව්කරුවකු හෝ විදේශ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් වෙනුවෙන් අලෙවිකරණය සහ/හෝ විකුණුම් සඳහා පෙළඹවීම තහනම් කරමින් විධානයක් නිකුත් කරන ලදී. තවද, සියලුම රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වගකීම් නිශ්චිතව දක්වන ලද පරිදි, වරලත් රක්ෂණ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඒ හා සමාන සුදුසුකම් ලත් එක් පුද්ගලයෙකු හෝ අවම වශයෙන් විශේෂිත නිලධාරියෙකු ලෙස සේවයේ යෙදවීම අවශ්‍ය වේ.

## විශ්‍රාම අරමුදල්

**විශ්‍රාම අරමුදල් අංශය, සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යන රාජ්‍ය ආයතන විසින් කළමනාකරණය කරන අරමුදල් 3 කින් සහ පෞද්ගලික කළමනාකාරීත්වයෙන් යුතු අර්ථසාධක සහ විශ්‍රාම අරමුදල් 149 කින් සමන්විත විය.** 2017 වසර අවසානයට, මෙම අංශයේ වත්කම් මූල්‍ය අංශයේ සමස්ත වත්කම් පදනමින් සියයට 16.6 ක් විය. විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් 2016 වසර අවසානයේ වූ රුපියල් බිලියන 2,537.2 සිට 2017 වසර අවසානයේදී රුපියල් බිලියන 2,836.5 ක් දක්වා වර්ධනය විය. සේවක අර්ථසාධක අරමුදල සතු වත්කම්, විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් වලින් සියයට 72.8 ක් විය.

## සේවක අර්ථසාධක අරමුදල

**1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සේ. අ. අ.) පනත යටතේ අරමුදලේ භාරකාරීත්වය මුදල් මණ්ඩලය වෙත පවරා ඇති අතර, එහි පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස් වෙත පවරා ඇත.**

සේ. අ. අ. පනතේ විධිවිධානවලට අනුව මුදල් මණ්ඩලයට එහි භාරකාරිත්ව බලතල, වගකීම් හා කාර්යය ඉටු කිරීම සඳහා පහසුකම් සැපයීම සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

**සාමාජිකත්වය, සාමාජික ශේෂ සහ ප්‍රතිලාභ ගෙවීම්:** අරමුදලේ මුළු වටිනාකම 2016 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 1,841.5 ට සාපේක්ෂව 2017 වසර අවසානය වනවිට සියයට 12.2ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 224.8 කින් රුපියල් බිලියන 2,066.3 දක්වා වර්ධනය විය. මෙම වර්ධනය, සාමාජිකයන්ගේ ශුද්ධ දායක මුදල් ලැබීම් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) සහ ඵලදායී හා විචක්ෂණශීලී අරමුදල් ආයෝජනය තුළින් උපයාගත් ආදායම්වල සමස්ත ප්‍රතිඵලය වේ. සාමාජික ශේෂ සඳහා පොලිය ද ඇතුළත්ව, සාමාජිකයින් සඳහා වූ මුළු වගකීම 2017 වසර අවසානය වන විට රුපියල් බිලියන 2,020.8 ක් වූ අතර, එය 2016 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 1,810.6 ට සාපේක්ෂව සියයට 11.6 ක වර්ධනයකි. 2017 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 133.4 ක් දක්වා සියයට 12.8 කින් වර්ධනය විය. 2017 වසරේදී සාමාජිකයන් හා ඔවුන්ගේ නීතිමය උරුමක්කරුවන් හට, රුපියල් බිලියන 117.5 ක් මුළු ප්‍රතිලාභ ගෙවීම් සිදු කළ අතර, එය 2016 වසරට සාපේක්ෂව සියයට 8.4 ක වර්ධනයකි. ඒ අනුව, 2017 වසරේ පැවති ශුද්ධ දායක මුදල් ලැබීම් පෙර වසරේ පැවති රුපියල් බිලියන 9.9 හා සසඳන කළ රුපියල් බිලියන 15.9 ක් විය. 2017 වසරේ අරමුදලේ ශුද්ධ ආදායම රුපියල් බිලියන 202.9 ක් වූ අතර, එය පෙර වසරේ ශුද්ධ ආදායම වූ රුපියල් බිලියන 175.9 හා සසඳන විට සියයට 15.3 ක වර්ධනයකි.

**8.16 සංඛ්‍යා සටහන**
**සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | සේවක අර්ථසාධක අරමුදල | | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | |
|---|---|---|---|---|
| | 2016 (අ) | 2017 (ආ) | 2016 (අ) | 2017 (ආ) |
| සමස්ත වත්කම් (රු. බිලියන) | 1,841.5 | 2,066.3 | 248.9 | 279.0 |
| සමස්ත නොපියවූ සාමාජික ගිණුම් ශේෂය (රු. බිලියන) | 1,810.6 | 2,020.8 | 245.6 | 274.2 |
| සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 17.3 | 17.3 | 12.5 | 12.6 |
| ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 2.6 | 2.6 | 2.5 | 2.6 |
| දායකවන්නා වූ සේවාදායකයින් සංඛ්‍යාව | 73,479 | 75,756 | 77,842 | 81,515 |
| සමස්ත දායකත්වය (රු. බිලියන) | 118.3 | 133.4 | 20.3 | 22.8 |
| සමස්ත ප්‍රතිගෙවුම් (රු. බිලියන) | 108.4 | 117.5 | 13.9 | 17.2 |
| සමස්ත ආයෝජන කළඹ (රු. බිලියන) | 1,772.2 | 1,992.4 | 234.7 | 262.5 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 93.1 | 91.3 | 85.2 | 78.2 |
| දළ ආදායම (රු. බිලියන) | 193.1 | 223.2 | 24.6 | 29.0 |
| බෙදාහැරීම සඳහා පවත්නා ලාභය (රු. බිලියන) | 176.1 | 203.1 | 17.0 | 20.3 |
| ආයෝජනය මත ප්‍රතිලාභය (%) | 11.4 | 11.8 | 9.1 | 11.0 |
| සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%) | 10.5 | 10.5 | 9.0 | 9.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

**ආයෝජන කළඹ :** අරමුදලේ සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) 2016 වසරේ පැවැති රුපියල් බිලියන 1,772.2 ට සාපේක්ෂව 2017 වසරේ දී රුපියල් බිලියන 1,992.4 ක් දක්වා සියයට 12.4 කින් වර්ධනය විය. අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබා දීම ඉලක්ක කරගෙන අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 2017 වසර අවසානය වන විට අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 91.3 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 4.2 ක් ද සාංගමික ණය හා භාරකාර සහතිකපත්වල සියයට 2.1 ක් ද ඉතිරි සියයට 2.4 ක් ස්ථාවර තැන්පතුවල ද ආයෝජනය කර තිබුණි.

**ආයෝජන ආදායම:** අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2017 වසරේ දී රුපියල් බිලියන 222.6 ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසර හා සැසඳීමේදී සියයට 15.4 ක වැඩිවීමකි. ආයෝජන ආදායමින් සියයට 84.6 ක් වූ පොලී ආදායම, අඛණ්ඩව අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස පවත්වාගෙන යාමට හැකිවූ අතර, එය 2016 වසරේ උපයන ලද රුපියල් බිලියන 165.5 ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 188.3 ක් දක්වා සියයට 13.8 කින් වර්ධනය විය. කල්පිරෙන තෙක් තබාගෙන ඇති මූල්‍ය සුරැකුම්පත් මත ක්‍රමක්ෂය ලාභ 2016 වසරේ උපයන ලද රුපියල් බිලියන 28.2 ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 31.3 දක්වා සියයට 11.0 කින් වර්ධනය විය. එසේ වුවද, 2017 වසරේ ලාභාංශ ආදායම රුපියල් බිලියන 3.0 ක්වූ අතර, එය 2016 වසරේ දී වූ රුපියල් බිලියන 4.3 ට සාපේක්ෂව සියයට 30.2 ක පහත වැටීමකි. 2017 වසරේ දී ලාභ හෝ අලාභ තුළින් වෙළෙඳපොළ පවතින අගයට ඇති මූල්‍ය වත්කම්වලින් ලත් ශුද්ධ ලාභය රුපියල් බිලියන 1.5 ක් වූ අතර එය 2016 වසරේ ලත් ශුද්ධ අලාභය වූ රුපියල් බිලියන 0.8 ට සාපේක්ෂව සියයට 287.5 ක වර්ධනයකි. 2017 වසරේ හඳුනාගත් කොටස් ආයෝජනය මත හානිකරණ අලාභය රුපියල් බිලියන 1.5 ක් වූ අතර එය සියයට 71.2 ක අඩුවීමකි.

**අරමුදලේ සමස්ත ප්‍රතිලාභය:** 2017 වසරේදී අරමුදලේ සමස්ත දළ ආදායම රුපියල් බිලියන 223.2 ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසර හා සැසඳීමේදී සියයට 15.6 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. සාමාජික ශේෂ මත සියයට 10.5 ක පොලී අනුපාතය අඛණ්ඩව

8

සිව්වන වසරටත් ගෙවීමට සේ. අ. අ. ට හැකිවූ අතර අරමුදලේ දළ ආදායමට මෙහෙයුම් වියදම් අනුපාතය 2016 වසරේ දී සියයට 0.77 ක් ද 2017 වසරේ දී සියයට 0.60 ක් වශයෙන් ද පවත්වා ගෙන යෑමට හැකිවිය.

### සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

**විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් පදනමින් සියයට 9.8 ක දායකත්වයක් දක්වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සාමාජිකයින් සංඛ්‍යාවේ සහ සමස්ත වත්කම්වල වර්ධනයක් වාර්තා කරන ලද අතර ශුද්ධ දායකත්වයෙහි අඩුවීමක් පෙන්වීය.** සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සතුව ගිණුම් මිලියන 12.6 ක් පැවති අතර එයින් මිලියන 2.6 ක් සක්‍රීය ගිණුම් විය. අරමුදල සඳහා දායකත්වය දක්වන සාමාජිකයින් සංඛ්‍යාව 81,515 ක් විය. 2017 වසර අවසානයට සමස්ත නොපියවූ සාමාජික ශේෂවල වටිනාකම රුපියල් බිලියන 274.2 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. වසර තුළදී සමස්ත දායකත්වය සියයට 12.0 කින් බිලියන 22.8 ක් දක්වා වර්ධනය වූ අතර, ගෙවන ලද සමස්ත ප්‍රතිලාභ රුපියල් බිලියන 17.2 ක් දක්වා සියයට 24.3 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ අරමුදල් ගලා ඒම් සියයට 14.3 ක සැලකිය යුතු අඩුවීමක් පෙන්වීය. 2017 වසර අවසානයේදී සියයට 12.1 ක වර්ධනයක් වාර්තා කරමින් අරමුදලේ සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 279.0 ක් විය. එමෙන්ම, එම කාල පරිච්ඡේදය තුළදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමස්ත ආයෝජන රුපියල් බිලියන 262.5 ක් දක්වා සියයට 11.8 කින් ඉහළ යන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, සේවක අර්ථසාධක අරමුදල හා සමානව රජයේ සුරැකුම්පත් වල බහුතර ආයෝජනයක් සහිතව සමස්ත ආයෝජන කළඹ පවත්වා ගෙන යන ලදී. කෙසේ වුවද, රජයේ සුරැකුම්පත්වල ආයෝජන 2016 වසර අවසානයට වාර්තා කළ සියයට 91.2 ක සිට 2017 වසර අවසානයට සියයට 78.2 ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි. රජයේ සුරැකුම්පත් වල ආයෝජනවලින් ඉවත් වීම තුළින් ලැබුණු මුදල් කාලීන තැන්පතුවල නැවත ආයෝජනය කිරීම සඳහා අරමුදල විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. වසර තුළදී සමස්ත ආයෝජනවලින් සමාගම් කොටස්වල හා සාංගමික ස්ථාවර ඉපයීම් සුරැකුම්පත්වල සිදුකරන ලද ආයෝජන පිළිවෙළින් සියයට 2.7 ක් හා සියයට 1.4 ක් විය. ආයෝජන මත වන ඵලදායී පොලී අනුපාතිකය සියයට 9.6 ක පවත්වා ගැනීමට අරමුදල සමත් විය.

### අනෙකුත් විශ්‍රාම අරමුදල්

**ශ්‍රී ලංකාවේ විශ්‍රාම අරමුදල් අංශයට සියයට 15.4 ක දායකත්වයක් දක්වන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සාමාජිකයන් සංඛ්‍යාව සහ ශුද්ධ දායකත්වය අතින් අඩුවීමක් පෙන්වුවද, වසර තුළදී වත්කම්වල වර්ධනයක් පෙන්වීය.** විශ්‍රාම වැටුපක් නොලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තයන්ට ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් පිහිටුවන ලද මෙම අරමුදලෙහි සමස්ත සාමාජිකයින් සංඛ්‍යාවේ සුළු අඩුවීමක් වාර්තා විය. කෙසේ වුව ද, 2017 වසර අවසානයට අරමුදලේ සාමාජිකයින් සක්‍රිය වූ අතර, එම සංඛ්‍යාව 239,184 ක් විය. 2016 වසරේදී වාර්තා කළ රුපියල් මිලියන 909.3 ක ශුද්ධ ධනාත්මක දායකත්වය ට සාපේක්ෂව 2017 වසරේදී එය රුපියල් මිලියන 843.8 ක් විය. අරමුදලෙහි සමස්ත වත්කම් පදනම රුපියල් බිලියන 55.4 ක් දක්වා සියයට 16.2 කින් වර්ධනය විය. තවද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි ආයෝජන 2016 වසර අවසානයට වාර්තා කළ රුපියල් බිලියන 46.2 සිට 2017 වසර අවසානයට රුපියල් බිලියන 52.9 ක් දක්වා වර්ධනය විය. මෙම ආයෝජන වැඩි වශයෙන් රාජ්‍ය සුරැකුම්පත් වල වූ අතර එය සමස්ත ආයෝජන වලින් සියයට 94.5 ක් විය. 2017 වසරේදී සාමාජික ශේෂ මත ඵලදායී පොලී අනුපාතිකය සියයට 13.0 ක් විය.

**විශ්‍රාම අරමුදල් අංශයට සියයට 1.9 ක දායකත්වයක් දක්වන අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්, සාමාජිකයින් සංඛ්‍යාව, සමස්ත වත්කම් සහ ආයෝජන අනුව ගත්කල වර්ධනය විය.** කෙසේ වුවද, 2016 වසර අවසානයේදී අනුමත විශ්‍රාම අරමුදල් 152 ක් පැවති අතර 2017 වසර අවසානයේදී එය 149 ක් දක්වා පහත වැටුණි. මෙම පෞද්ගලික අර්ථසාධක අරමුදල් සාමාජිකයින් 169,301 ක් ආවරණය කරන ලදී. 2017 වසර අවසානයේදී අනුමත විශ්‍රාම අරමුදල් වල සමස්ත වත්කම් රුපියල් බිලියන 437.3 ක් විය. මෙය 2017 වසරේ පැවති රුපියල් බිලියන 398.6 ක වත්කම් පදනමින් සියයට 9.7 ක වර්ධනයකි. මෙම අරමුදල්වල ආයෝජන කළඹ සියයට 9.5 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 267.1 ක පැවතුණි.

## 8.4 මූල්‍ය වෙළෙඳපොළවල කාර්ය සාධනය

### මුදල් වෙළෙඳපොළ

**බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, අගෝස්තු මස මුල් භාගය දක්වා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙන් සැදුම්ලත් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව සමීපයෙහි පවත්වා ගන්නා ලදී.** එම අනුපාතිකය ඉන්පසුව අඩු කර ගනිමින්, සැප්තැම්බර් මැද භාගයේ සිට වසර අවසානය දක්වා නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යයට ආසන්න මට්ටමක පවත්වා ගන්නා ලදී. 2016 වසර අවසානයේදී සියයට 8.42 ක්වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අඩුවී 2017

8

පෙබරවාරි මැද භාගයේදී ද්‍රවශීලතා හිඟයක් බවට පත්වූ පසුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව දක්වා ගෙන යන ලදී. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම තවදුරටත් සිදුකරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 බැගින් ඉහළ දැමීමෙහි ප්‍රතිඵලයක් ලෙස නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.25 ක් සහ සියයට 8.75 ක් දක්වා ඉහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් ඉහළ ගිය අතර, 2017 අගෝස්තු මස මුල් කාලය දක්වා නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව සමීපයෙහි පවත්වා ගන්නා ලදී. මේ අතර, 2017 වසරේ ජූලි මස මැද භාගයේ සිට මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවතීම හේතුවෙන්, මහ බැංකුව විසින් පවත්වනු ලැබූ දෛනික ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසීන්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීම තුළින්, වසර අවසාන භාගයේදී නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාවෙහි පවත්වා ගැනුණි. එම අනුපාතිකය 2017 දෙසැම්බර් අවසානයේදී සියයට 7.25 ක් විය. මෙම ප්‍රවණතාව අනුව යමින්, 2017 සැප්තැම්බර් මස මැද භාගය වනවිට, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද සියයට 8.00 ක් දක්වා පහළ ගිය අතර, ඉන්පසුව සුළු වශයෙන් ඉහළ ගොස් 2017 දෙසැම්බර් අවසානය වනවිට සියයට 8.15 ක් ලෙස පැවතුණි. ඒක්ෂණ මුදල් අනුපාතික අනුව යමින්, වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය අගෝස්තු මස මුල් කාලය දක්වා නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව සමීපයෙහි පැවති අතර, ඉන්පසුව ක්‍රමයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට වඩා වැඩි ප්‍රමාණයකින් අඩුවී 2017 දෙසැම්බර් අවසානයේදී සියයට 8.52 ක් ලෙස පැවතුණි.

**2017 වසර ආරම්භයේ දී දේශීය මුදල් වෙළෙඳපොළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව ශීඝ්‍රයෙන් ඉහළ යන ලදී.** පෙබරවාරි මස මුල් කාලයේ දී ද්‍රවශීලතා හිඟයක් බවට පත්වුව ද, ඉන්පසුව වෙළෙඳපොළ ද්‍රවශීලතාව ජූලි මැද භාගය දක්වා හිඟ සහ අතිරික්ත ද්‍රවශීලතා මට්ටම් අතර විචලනය විය. ජූලි මස මැද සිට මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව අතිරික්ත ද්‍රවශීලතා මට්ටමක පැවතුණි. මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම මෙන්ම තාවකාලික අත්තිකාරම් තුළින් රජයට ලබාදුන් ණය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2016 වසර අවසානයේ රුපියල් බිලියන 39.2 ක් ලෙස පැවති අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව 2017 වසර ආරම්භයේ දී රුපියල් බිලියන 100 ඉක්මවිය. කෙසේ වෙතත්, ඉන්පසුව වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාව අඩු වූ අතර, ප්‍රධාන වශයෙන් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් පරිණත වීමට සැලසීම සහ විවට වෙළෙඳ කටයුතු හරහා ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම හේතුකොටගෙන පෙබරවාරි මස මැද භාගයේ සිට ජූලි මාසයේ මැද භාගය දක්වා වරින් වර රුපියල් ද්‍රවශීතාව හිඟයක් බවට පත්විය. අප්‍රේල් මාසයේ දී උත්සව සමය නිසා බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් ආපසු ගැනීම් ද හේතුකොටගෙන රුපියල් ද්‍රවශීතාව අඩු විය. මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළින් විදේශ විනිමය මිලදී ගැනීම (ශුද්ධ පදනමින්) හේතුකොටගෙන වසරේ දෙවන භාගයේ දී වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාව අතිරික්තයක් බවට පත්විය. මුදල් වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාව ජූලි මස මැද භාගයේ සිට අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවති අතර, 2017 වසර අවසානයේදී අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව රුපියල් බිලියන 18.3 ක් විය.

**විවට වෙළෙඳ කටයුතු හරහා භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත විකිණීම හා පරිණත වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවිය.** ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2017 වසර ආරම්භයේදී පැවති රුපියල් බිලියන 331.4 ට සාපේක්ෂව 2017 වසර අවසානයේදී රුපියල් බිලියන 9.9 ක් විය. වෙළෙඳපොළ ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණවත් නොවූ බැවින්, වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමට විකල්ප උපකරණ භාවිත කිරීමට අවශ්‍ය විය. ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි සඳහා සුරැකුම් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික ආයෝජකයන්ගෙන් භාණ්ඩාගාර බැඳුම්කර ණයට ගැනීම සඳහා වූ බැඳුම්කර ණයට ගැනීමේ වැඩසටහන, 2017 නොවැම්බර් මස යළි ක්‍රියාත්මක කරන ලදී.

**2017 වසරේදී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ගැටලු කිහිපයකට මුහුණ දීමට සිදුවිය.** රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ගනුදෙනු මත බදු

**8.17 සංඛ්‍යා සටහන**

**මුදල් වෙළෙඳපොළ ගනුදෙනු**

| වෙළෙඳපොළ | පරිමාව (රු. බිලියන) | | බරතැබූ සාමාන්‍ය පොලී අනුපාතිකය (අවම-උපරිම)% | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| ඒක්ෂණ මුදල් | 3,493.4 | 3,900.4 | 6.43-8.44 | 7.95 - 8.75 |
| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 6,572.5 | 4,205.6 | 6.29-9.15 | 7.50 - 9.14 |
| මහ බැංකු ප්‍රතිමිලදී ගැනුම් | 251.9 | 3,327.7 | 6.29-7.50 | 7.25 - 7.75 |
| මහ බැංකු ප්‍රතිවිකුණුම් | 3,937.7 | 1,049.6 | 6.59-8.50 | 8.47 - 8.75 |
| නිත්‍ය තැන්පතු පහසුකම් | 5,572.7 | 3,954.9 | - | - |
| නිත්‍ය ණය පහසුකම් | 3,208.3 | 2,129.5 | - | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.16 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, විවට වෙළඳ කටයුතු වෙන්දේසියෙහි එළදා අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ වෙළෙඳපොළ ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.17 රූප සටහන**

**මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවට බලපෑ මහ බැංකු ශේෂපත්‍රයෙහි අයිතමවල වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගැළපීම හේතුවෙන් ඒක්ෂණ සහ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකවල සිදුවූ අක්‍රමිකතා 2017 වසරේ දී, මුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික කෙරෙහි බලපෑම් ඇති කළේය. කෙසේ නමුත්, යෝජිත නව දේශීය ආදායම් පනත 2018 වසරේ අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වීමත් සමග රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනුවලට අදාළ පොලී ආදායම මත බදු ගැළපීම තවදුරටත් නොපවතින බැවින් මෙම ගැටලුවට විසඳුමක් ලැබෙනු ඇත.

**මුදල් වෙළෙඳපොළ තුළ මිල අනාවරණය වීමේ කාර්යය දිරිගැන්වීම, වෙළෙඳපොළ සහභාගීවන්නන් විසින් තම තීරණ ගැනීම මනා තොරතුරු පදනම්ව සිදු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ විවට වෙළෙඳ කටයුතු තුළින් වෙළෙඳපොළට සංඥා නිකුත් කිරීමේ කාර්යය වැඩිදියුණු කිරීම යනාදිය අරමුණු කරගනිමින්, 2017 අගෝස්තු මාසයේ සිට විවට වෙළෙඳ කටයුතු වලට අදාළ තොරතුරු වලින් වැඩි ප්‍රමාණයක් වෙළෙඳපොළට නිකුත් කිරීම ආරම්භ කරන ලදී.** කෙටි කාලීන පොලී අනුපාතික සඳහා අපේක්ෂිත මට්ටම් සංඥා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවට වෙළෙඳ කටයුතු වෙන්දේසීන්හි උපරිම සහ අවම අනුපාතික ප්‍රකාශයට පත් කිරීම ආරම්භ ලදී. තවද, දෛනික ද්‍රවශීලතා පුරෝකථනය ද වෙළෙඳපොළට ලබා දෙන ලදී.

## දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ

**වෙළෙඳපොළ ද්‍රවශීලතාව :** ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේ විනිමය අනුපාතිකය තීරණය කිරීම සම්බන්ධයෙන් වැඩි නම්‍යශීලීතාවයක් ලබාදෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2016 දෙසැම්බර් අවසානයේ වූ රුපියල් 149.80 ක සිට 2017 දෙසැම්බර් අවසානයේ දී රුපියල් 152.85 ක් දක්වා සියයට 2.00 ක ප්‍රමාණයකින් අවප්‍රමාණය විය. අමෙරිකානු එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් මාර්තු මාසයේ පොලී අනුපාත ඉහළ දැමීම සම්බන්ධයෙන් පැවති අපේක්ෂාවත් සමග රජයේ භාණ්ඩාගාර සුරැකුම්පත්වල සිදුකර තිබූ විදේශීය ආයෝජන රටින් ඉවතට ගලා යෑම, 2017 වසරේ මුල් කාලයේදී සිදුවූ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට හේතුවිය. 2017 වසරේ පළමු කාර්තුව තුළදී ණය සේවා වාරික ගෙවීම සහ ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යාම හේතුකොට ගෙන විනිමය අනුපාතිකය මත වූ පීඩනය තවදුරටත් තීව්‍ර විය. කෙසේ වුවද, අපනයන ආදායම් ලැබීම තුළින් සහ අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි තෙවන සහ සිව්වන වාරිකයන් ලැබීමත් සමග ඇතිවූ ධනාත්මක තත්ත්වය හේතුකොට ගෙන විනිමය අනුපාතිකය මත ඇතිවූ පීඩනය 2017 වසර අවසානය වන විට ක්‍රමයෙන් අඩුවිය. එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ සමස්ත අවප්‍රමාණයට අනුගාමීව වාණිජ බැංකු වල විදුලි පැවරුම් සඳහා වූ එ.ජ.ඩොලර් මිලදී ගැනීමේ හා විකිණීමේ සාමාන්‍ය අනුපාතිකය, 2017 වසරේදී පිළිවෙළින් රුපියල් 151.31 ක් සහ රුපියල් 155.15 ක් ලෙස වාර්තා වූ අතර, 2016 වසරේදී එය පිළිවෙළින් රුපියල් 147.84 ක් සහ රුපියල් 151.66 ක් විය.

**අනෙකුත් ප්‍රධාන විදේශ විනිමය අනුපාතික හා ඒවායේ විචල්‍යතාවට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගයෙහි හැසිරීම :** වසර තුළදී, ශ්‍රී ලංකා රුපියල

8

අනෙකුත් ප්‍රධාන මුදල් ඒකක වලට එරෙහිව අවප්‍රමාණය විය. යුරෝපීය මහ බැංකුව විසින් බැඳුම්කර මිලදීගැනීම සීමා කිරීමේ හැකියාව හා එංගලන්ත මහ බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ නැංවීම හේතුකොටගෙන 2017 වසරේදී ශ්‍රී ලංකා රුපියල, යුරෝවට එරෙහිව සියයට 13.49 කින් හා බ්‍රිතාන්‍ය පවුමට එරෙහිව සියයට 10.46 කින් අවප්‍රමාණය විය. වසර තුළදී ඇතිවූ අන්තර්ජාතික දේශපාලනික බල තුලන හා එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය හේතුකොට ගෙන 2017 වසර තුළදී ශ්‍රී ලංකා රුපියල ජපාන යෙන් හා ඉන්දියානු රුපියලට එරෙහිව පිළිවෙළින් සියයට 5.08 කින් සහ සියයට 7.54 කින් අවප්‍රමාණය විය.

**2017 වසර තුළදී දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ අන්තර් බැංකු ගනුදෙනු පරිමාව, පසුගිය වසර හා සසඳන කල සියයට 11.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.** දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2016 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 14,769.5 සිට 2017 වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 16,451.1 ක් දක්වා ඉහළ ගොස් ඇත. ඊට සමගාමීව, විදේශ විනිමය වෙළෙඳපොලේ අන්තර් බැංකු දෛනික ගනුදෙනු පරිමාවේ සාමාන්‍යය ද 2016 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 61 සිට 2017 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 68 ක් දක්වා ඉහළ යෑමක් වාර්තා විය.

**ශ්‍රී ලංකා මහ බැංකුව, අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළින් විදේශ විනිමය මිලදී ගැනීම මගින් ණය නොවන ප්‍රභව වලින් රැස්කල විදේශ සංචිත ප්‍රමාණය ගොඩ නැංවුණු අතර අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් (IMF-EFF) යටතේ දෙසැම්බර් මස අවසානයට ලබාදී තිබූ ශුද්ධ විදේශ සංචිත ඉලක්කය ද සපුරා ගතහැකි විය.** 2017 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 2,214.1 ක් වෙළෙඳපොළෙන් මිලදී ගන්නා ලද අතර එ.ජ. ඩොලර් මිලියන 549.8 ක් වෙළෙඳපොළට මුදා හරින ලදී. එහි ප්‍රතිපලයක් වශයෙන් ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 1,664.4 ක් වූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත ප්‍රමාණය, ණය නොවන ප්‍රභව හරහා වර්ධනය කිරීමට දායක විය.

## භාණ්ඩාගාර සුරැකුම්පත් වෙළෙඳපොළ

**2017 වසරේ මාර්තු මස, ප්‍රතිපත්ති අනුපාතිකයන් පදනම් අංක 25 කින් ඉහළ නැංවීම අනුව යමින්, 2017 වසරේ අප්‍රේල් මාසය දක්වා භාණ්ඩාගාර සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ඉහළ යෑම සිදු විය.** කෙසේ වෙතත්, 2017 වසරේ පළමු භාගයේ අවසන් කාලයේදී එම ඉහළ යෑමේ ප්‍රවණතාවය අඩු විය. 2017 වසරේ මැයි මස සිට, භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික සමස්තයක් වශයෙන් පහළ යනලදී. විශේෂයෙන්ම, අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළට පිවිසීම පිළිබඳ අපේක්ෂා සාර්ථක සංචිත ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් සහ 2017 වසරේ හඳුන්වා දුන් නව භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි ක්‍රමය තුළ වැඩිදියුණු වූ පුරෝකථනය කිරීමේ හැකියාව සහ විනය යන කරුණු තුළින් ගොඩනැගුණු ධනාත්මක වෙළෙඳපොළ ගම්‍යතාවය යනාදිය හේතුවෙන් වසරේ දෙවන අර්ධය තුළ අඩු සහ ස්ථායි පොලී අනුපාතික වාතාවරණයක් පවත්වාගෙන යෑම වැනි ණය කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට ඉවහල් විය. හඳුන්වාදෙන ලද භාණ්ඩාගාර බැඳුම්කර නව වෙන්දේසි ක්‍රමය තුළින් පැවැති සම්පූර්ණයෙන්ම වෙන්දේසි තුළින් හා බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමය අහෝසි වූ අතර, එහි ප්‍රධාන පරමාර්ථය වූයේ විනිවිදභාවය පවත්වා ගන්නා අතරම රජයේ අරමුදල් අවම පිරිවැයක් යටතේ සපයා දීමයි. එ.ජ. ඩොලර් මිලියන 1,500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 2017 වසරේ මැයි මාසයේදී නිකුත් කළ අතර, 2017 වසරේ දෙවැනි භාගයේ දී භාණ්ඩාගාර බැඳුම්කර මගින් සංචිත තොග ගොඩනැංවීම ආරම්භ කරන ලදී. මෙම උපායමාර්ග, දේශීය වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන් මත වූ පීඩනය අඩු කිරීමට හේතු විය. මීට අමතරව, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ඉදිරි දැක්මෙහි වසර තුළ සිදු වූ ධනාත්මක වෙනස්කම් සහ හිතකර ආයෝජන වටපිටාව, වසර තුළ විදේශ විනිමය ගලා ඒම් ඉහළ යෑමට හිතකර ලෙස දායක වීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 වසර අවසානයේ වාර්තා වූ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල විදේශීය හිමිකම්, 2016 වසර අවසානයේ වාර්තා කළ අගයට වඩා ඉහළ අගයක පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, දින 364 සඳහා වූ ඵලදා අනුපාතිකය 2016 වසරට සාපේක්ෂව 2017 වසර අවසානයේ දී පදනම් අංක 127 කින් පහළ ගියේය. 2017 වසරේ දෙසැම්බර් අවසානයට දින 91, දින 182 සහ දින 364 කල්පිරීම් සඳහා වන ඵලදා අනුපාතික පිළිවෙළින් සියයට 7.69, සියයට 8.30 සහ සියයට 8.90 ක් ලෙස වාර්තා විය. කෙටිකාලීන පොලී අනුපාතිකයන්ගේ අඩුවීම, 2017 වසරේ අවසාන කාලයේදී භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතිකයන්ගේ අඩුවීම තුළින් ද පිළිබිඹු විය.

**8.18 සංඛ්‍යා සටහන**
**භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ප්‍රාථමික වෙළෙඳපොළ නිකුතු**

| වසර | නිකුත් කළ වටිනාකම (රු. බිලියන) | | |
|---|---|---|---|
| | වෙන්දේසිගත | සෘජු නිකුතුන් | මුළු වටිනාකම |
| 2015 | 712 | 158 | 870 |
| 2016 | 654 | 9 | 663 |
| 2017 | 536 | 13 | 549 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.19 සංඛ්‍යා සටහන**

**භාණ්ඩාගාර බිල්පත්හි වාර්ෂික ප්‍රාථමික වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික**

වාර්ෂික ප්‍රතිශතය

| වසර | පරිණත කාලය | | | සමස්ත සාමාන්‍යය |
|---|---|---|---|---|
| | දින 91 | දින 182 | දින 364 | |
| 2013 | 7.54 | 7.85 | 8.29 | 8.20 |
| 2014 | 6.58 | 6.57 | 6.73 | 6.68 |
| 2015 | 6.32 | 6.50 | 6.60 | 6.46 |
| 2016 | 8.26 | 9.23 | 10.20 | 9.38 |
| 2017 | 9.01 | 9.80 | 10.07 | 9.77 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2017 වසර තුළ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය ආයෝජනයන්හි **සමස්ත ශුද්ධ ගලා ඒම්, එ. ජ. ඩොලර් මිලියන 440.6 ක් වූ අතර එයින් එ. ජ. ඩොලර් මිලියන 80.5 ක් භාණ්ඩාගාර බිල්පත්වලින් හා එ. ජ. ඩොලර් මිලියන 360.1 ක් භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත විය.** 2017 වසර අවසානය වන විට භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල නොපියවූ විදේශීය හිමිකම් රුපියල් බිලියන 322.6 ක්වූ අතර එය 2016 වසරේ අවසානය වනවිට පැවති රුපියල් බිලියන 260.0 ට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 24.1 ක සැලකිය යුතු ඉහළ යෑමකි.

**වෙළෙඳපොළ තත්ත්වයන්ගෙන් වාසි ලබාගනු පිණිස, 2017 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල කල්පිරීම් වටිනාකම වූ එ. ජ. ඩොලර් මිලියන 1,878.0 ට එරෙහිව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එ. ජ. ඩොලර් මිලියන 2,231.4 ක් රැස් කරන ලදී.** මෙමගින් දේශීය රුපියල් වෙළෙඳපොළ මූල්‍යකරණය සහ දේශීය පොලී අනුපාතික පවත්වා ගැනීම මත වූ පීඩනය අඩු කරන ලදී.

2017 වසර තුළදී සමස්ත දේශීය රාජ්‍ය ණය කළඹෙහි සාමාන්‍ය කල්පිරීමේ කාලය අඩු වූ අතර 2016 වසරේ වාර්තා වූ වසර 5.98 ක අගය සමඟ සසඳන විට 2017 වසර අවසානයට එය වසර 5.78 ක් ලෙස වාර්තා විය. 2016 වසර අවසානයේ වසර 7.07 ක්වූ, නොපියවූ භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි සාමාන්‍ය කල්පිරීමේ කාලය, 2017 වසර අවසානය වනවිට වසර 6.72 ක් දක්වා පහළ යන ලදී. 2017 මුල් භාගයෙහි පැවති සාපේක්ෂ ඉහළ අගයක් වූ පොලී අනුපාතික සහ සැලකිය යුතු ඉහළ මට්ටමක වූ මූල්‍යකරණ අවශ්‍යතාවය, පරිණතියට ගතවන සාමාන්‍ය කාලය අඩුවීම සඳහා දායක විය.

## සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ

**පසුගිය වසර සමග සැසඳීමේදී 2017 වසරේදී සාංගමික පත්‍ර සඳහා වූ වෙළෙඳපොළෙහි ක්‍රියාකාරීත්වය සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි.** 2017 වසර තුළදී

**8.20 සංඛ්‍යා සටහන**

**රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික**

වාර්ෂික ප්‍රතිශතය

| අයිතමය | ප්‍රාථමික වෙළෙඳපොළ | | ද්විතීයික වෙළෙඳපොළ | |
|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 |
| භාණ්ඩාගාර බිල්පත් | | | | |
| දින 91 | 6.45 - 9.04 | 7.69 – 9.73 | 6.43 - 9.04 | 7.65 - 9.70 |
| දින 182 | 6.83 - 9.94 | 8.30 – 10.79 | 6.72 - 9.91 | 8.30 - 10.68 |
| දින 364 | 7.30 - 10.75 | 8.90 – 11.11 | 7.18 -10.72 | 8.89 – 11.03 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | |
| වසර 2 | 10.00 - 11.83 | 9.83 – 12.30 | 7.52 - 11.63 | 9.33 – 11.98 |
| වසර 3 | 11.51 - 11.75 | - | 8.76 - 11.97 | 9.59 – 12.44 |
| වසර 4 | 10.61 - 12.78 | 11.13 – 11.94 | 9.31 - 12.38 | 9.81 – 12.69 |
| වසර 5 | 11.42 - 13.00 | 10.09 – 12.89 | 9.49 - 12.56 | 9.96 – 12.73 |
| වසර 6 | 11.98 - 12.03 | 11.21 – 11.49 | 9.69 - 12.67 | 10.01 – 12.84 |
| වසර 10 | 11.05 - 13.93 | 9.90 - 12.21 | 10.01 - 13.07 | 10.14 – 12.94 |
| වසර 15 | 11.46 - 14.23 | - | 10.35 - 13.24 | 10.32 – 13.07 |
| වසර 30 | - | - | 11.05 - 13.58 | 10.62 - 13.33 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බලපත්‍රලාභී බැංකුවල සහයෝගය ඇතිව නිකුත් කළ සාංගමික පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 6.5 ක් වූ අතර එය 2016 වසරේදී වූ රුපියල් බිලියන 7.0 සමග සසඳන කළ සුළු අඩුවීමකි. සාංගමික පත්‍රවලට අදාළ පොලී අනුපාතික 2017 වසරේදී සියයට 13.75 ත් සියයට 16.50 ත් අතර පරාසයක විචලනය වූ අතර, එය 2016 වසරේදී සියයට 8.70 ත් සියයට 14.80 ත් අතර පරාසයක විචලනය විය. වසර තුළදී නිකුත් කළ සාංගමික පත්‍ර අඩු කල්පිරීම් කාලයක් සහිත විය. මාස 3 ක් හෝ ඊට අඩු කල්පිරීම් කාලයක් සහිත සාංගමික පත්‍රවල දායකත්වය සමස්ත නිකුතු වලින් සියයට 95.9 ක් වූ අතර, ඉතිරි සියයට 4.1 මාස 6 ක කල්පිරීම් කාලයක් සහිත විය. නොපියවූ සමස්ත සාංගමික පත්‍රවල වටිනාකම 2016 වසර අවසානයේදී වූ රුපියල් බිලියන 2.2 ට සාපේක්ෂව 2017 වසර අවසානයේදී රුපියල් බිලියන 1.7 ක් දක්වා අඩු විය.

**නිකුත් කරන්නන් සහ ආයෝජක පදනම පහළ මට්ටමක පැවතීම පිළිබිඹු කරමින් සාංගමික ණයකර වෙළෙඳපොළ කටයුතු සීමාසහිත විය.** කොළඹ කොටස් හුවමාරුවට අනුව 2017 වසර තුළදී සමාගම් 6ක් විසින් මූලික මහජන නිකුතුන් 5 ක් සහ එක් හඳුන්වා දීමක් මගින් ණයකර නිකුත් කළ අතර ඒ හා සසඳන කළ 2016 වසරේදී සමාගම් 14 ක් විසින් මූලික මහජන නිකුතුන් 17 ක් මගින් ණයකර නිකුත් කරන ලදී. ඒ අනුව, සාංගමික ණයකර වල සමස්ත වටිනාකම පසුගිය වසරේ වාර්තා කළ රුපියල් බිලියන 78.0 ට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 22.8 ක් දක්වා සියයට 70.8 කින් සැලකිය යුතු ලෙස පහළ යන ලදී. 2017 වසරේදී නිකුත් කළ ණයකර ස්ථාවර සහ විචල්‍ය අනුපාතික වලින් සමන්විත විය. මෙම බැඳුම්කර වලට අදාළ

ස්ථාවර පොලී අනුපාතික 2017 වසරේදී සියයට 11.95 ත් සියයට 15.00 ත් අතර පරාසයක විචලනය වූ අතර 2016 වසරේදී සියයට 9.60 ත් 13.75 ත් අතර පරාසයක විචලනය විය. 2017 වසරේදී ලැයිස්තුගත සමාගම් වල ණයකර වලින් ඉහළම අගය වූ රුපියල් බිලියන 8.0 ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද අතර දෙවන විශාලතම නිකුතුව වූ රුපියල් බිලියන 7.0 සම්පත් බැංකුව විසින් නිකුත් කරන ලදී.

## කොළඹ කොටස් වෙළෙඳපොළ

**2017 වසරේදී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි සමස්ත කොටස් මිල දර්ශකය හා එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය වර්ධනය විය.** 2017 වසර අවසානයේදී සමස්ත කොටස් මිල දර්ශකය සියයට 2.3 කින් ඉහළ ගිය අතර, එය පසුගිය වසරේ වාර්තා වූ සියයට 9.7 ක පහත වැටීමට සාපේක්ෂව හිතකර වර්ධනයක් විය. ඒ අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ සියයට 3.6 ක පහළ යෑමට සාපේක්ෂව 2017 වසරේදී සියයට 5.0 කින් ඉහළ යන ලදී. කෙසේ වුවද, ආසියානු කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි මිල දර්ශක අඩු වර්ධනයක් පෙන්වීය. සම්මත අපගමනය මගින් ගණනය කරනු ලබන සමස්ත කොටස් මිල දර්ශකයේ විචලනය පසුගිය වසරේ අනුරූප අගයන් සමග සසඳන කල සාපේක්ෂව පහළ අගයක් ගත් අතර එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයේ විචලනය සුළු වශයෙන් ඉහළ අගයක පැවතුණි.

**පසුගිය වසරට සාපේක්ෂව 2017 වසරේදී බොහෝ උප අංශ වල මිල දර්ශක වඩා යහපත් කාර්ය සාධනයක් පෙන්වන ලදී.** ප්‍රධාන උප අංශ අතුරින් බැංකු, මූල්‍ය හා රක්ෂණ: පාන වර්ග, ආහාර හා දුම්කොළ සහ විවිධාංගික සමාගම්වල මිල දර්ශක පිළිවෙළින් සියයට 5.1, සියයට 8.8 හා සියයට 8.0 කින් ඉහළ ගිය අතර, හෝටල් හා සංචාරක සහ නිෂ්පාදන යන අංශ පිළිවෙළින් සියයට 6.8 සහ සියයට 9.1 කින් පහළ යන ලදී. කුඩා උප අංශ අතුරින් වැවිලි අංශය සියයට 51.7 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. තවද, විශාලතම සමාගම් පහ හා සමාගම් දහය වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් පිළිවෙළින් සියයට 27.4 ක් සහ සියයට 42.1 ක් සඳහා දායක වේ.

**තවමත් විශාලත්වය අනුව ආසියානු කලාපීය රටවල් සමග සසඳන කළ කුඩා පරිමාණයක පවතින කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව 2017 වසර අවසානය වනවිට ලැයිස්තුගත සමාගම් 296 ක් හා එ. ජ. ඩොලර් බිලියන 18,959.5 ක වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයකින් සමන්විත විය.** කෙසේ නමුත් 2016 වසරේදී සිදුවූ

**8.21 සංඛ්‍යා සටහන**

**කොටස් වෙළෙඳපොළ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 | 2017 |
|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) (අ) | 6,228.3 | 6,369.3 |
| වාර්ෂික වෙනස (%) | -9.7 | 2.3 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004=1000) (අ) | 3,496.4 | 3,671.7 |
| වාර්ෂික වෙනස (%) | -3.6 | 5.0 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) (අ) | 2,745.4 | 2,899.3 |
| ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස (%) | 23.2 | 24.5 |
| වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය (අ) | 12.4 | 10.6 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය හා පිරිවැටුම අතර අනුපාතය (%) | 6.2 | 7.6 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම (රු. මිලියන) | 737.2 | 915.3 |
| වෙළඳාම් කළ කොටස් වටිනාකම (රු. බිලියන) | 176.9 | 220.6 |
| වෙළඳාම් කළ කොටස් ගණන (මිලියන) | 7,195.8 | 8,468.3 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 295 | 296 |
| කොටස් හඳුන්වාදීම් (ආ) | 1 | 1 |
| ආරම්භක මහජන අර්පණයන්/විකිණීම සඳහා වන අර්පණයන් සංඛ්‍යාව (ආ) | 3 | 2 |
| හිමිකම් නිකුතු ගණන | 6 | 15 |
| හිමිකම් නිකුතුන්ගෙන් සහ මූලික මහජන නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) | 4.4 | 51.6 |

(අ) වසර අවසානයට

(ආ) සමාගම් ලැයිස්තුගත කිරීමෙහි ක්‍රම 3 ක් ඇත. මහජන නිකුතුවක් අවශ්‍ය නොවන හඳුන්වා දීමක්, දැනටමත් තිබෙන කොටස් නිකුත් කිරීම සඳහා මහජනයාට කරන අර්පණයක් සහ මහජනයාට දායකවීම සඳහා නව කොටස් නිකුත් කිරීමක් වශයෙනි.

මූලය: කොළඹ ව්‍යාපාර වස්තු කොටස් හුවමාරුව

සියයට 6.6 ක (රුපියල් බිලියන 193 ක) පහත වැටීමට සාපේක්ෂව 2017 වසරේදී වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සියයට 5.6 කින් (රුපියල් බිලියන 154 කින්) ඉහළ යන ලදී. වෙළෙඳපොළ මිල ඉපැයීම් අනුපාතය 2016 දෙසැම්බර් අවසානයේදී වාර්තාකළ 12.4 ට සාපේක්ෂව 2017 දෙසැම්බර් අවසානයේදී 10.6 ක අඩු අගයක් පෙන්වීය. 2017 අප්‍රේල් මාසයේදී මෙම අනුපාතය එහි ඉහළම අගය වූ 12.9 ට ළඟාවූ අතර 2017 අගෝස්තු මාසයේදී එහි පහළම අගය වූ 10.4 ක් දක්වා පහත වැටුණි. 2017 වසර තුළදී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව විසින් එක් මූලික මහජන නිකුතුවක් මගින් රුපියල් බිලියන 14.1 ක අරමුදල් ප්‍රමාණයක් රැස් කරගත් අතර එක් විකිණීමක් සඳහා වන අර්පණයක් වාර්තා විය. තවද, හිමිකම් නිකුතු 19 ක් මගින් රුපියල් බිලියන 51.5 ක අරමුදල් ප්‍රමාණයක් රැස් කර ගන්නා ලදී.

**ද්විතීයික වෙළෙඳපොළෙහි, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ශුද්ධ පදනම මත විදේශ ආයෝජන 2016 වසරේ පැවති රුපියල් මිලියන 383.5 ක සිට 2017 වසරේදී රුපියල් බිලියන 17.7 ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය.** ඉහළ වත්කම් පදනමක් සහිත කොටස් අඩුමිලට පැවතීම මේ සඳහා අර්ධ වශයෙන් හේතු විය. විදේශ සහභාගීත්වයට විදේශ සමාගම් විසින් ප්‍රධාන වශයෙන් දායක විය. සමස්ත විදේශ මිලදී

**8.18 රූප සටහන**

**කොළඹ කොටස් වෙළෙඳපොළ සමස්ත කොටස් මිල දර්ශකය, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සහ දෛනික පිරිවැටුම**




මූලය: කොළඹ කොටස් හුවමාරුව

ගැනුම්වලින් සියයට 97.7 ක් විදේශ සමාගම් විසින් අත්කර ගත් අතර සියයට 2.3 ක් පමණක් විදේශීය පුද්ගලයින් විසින් අත්කර ගන්නා ලදී. සමස්ත වෙළෙඳපොළ පිරිවැටුමට විදේශ ආයෝජකයින්ගේ දායකත්වය 2016 වසරේ පැවති සියයට 42.0 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 46.9 ක සුළු වැඩිවීමක් පෙන්වීය.

2017 වසර තුළදී සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ විශ්වාසය ඉහළ නැංවීම සඳහා වෙළෙඳපොළ යටිතල පහසුකම් වර්ධනයට විවිධ නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් 2017 මාර්තු මාසයේදී කොටස් තැරැව්කරුවන් සඳහා අවම ප්‍රාග්ධන

**8.19 රූප සටහන**

**කොළඹ කොටස් වෙළෙඳපොළ විදේශීය සහභාගීත්වය**




මූලය: කොළඹ කොටස් හුවමාරුව

ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයක් හඳුන්වා දුන් අතර, මෙය අනෙකුත් පාර්ශවයන් සඳහාද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. වෙළෙඳපොළ යටිතල පහසුකම් සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාමාර්ග අතර ගෙවීමට එරෙහිව පැවරීමේ පද්ධතියක් (Delivery Vs Payment) සහ මධ්‍යම හුවමාරු (Centre Counterpart) යාන්ත්‍රණයක් හඳුන්වා දීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව බලාපොරොත්තු වේ. මීට අමතරව, කොළඹ කොටස් හුවමාරුව විසින් වෙනත් රටක ලයිස්තුගත සමාගමක් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ද්විතීයිකව ලයිස්තුගත කිරීමේ පහසුකම සලසමින් බහු ව්‍යවහාර මුදල් පුවරුවක් (Multicurrency Board) ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටී. තවද, විකුණුම්කරුවන්ට තමන්ට අයත් නොවන වත්කමක් විකිණීමේ හැකියාව (Short Selling) හඳුන්වාදීම, කොළඹ කොටස් හුවමාරුවේ කටයුතු අසමූහීකරණය සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව නියාමන රාමුව වැඩිදියුණු කිරීම අනෙකුත් අපේක්ෂිත සංවර්ධනයන් අතර වේ.

## 8.5 සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

**තුලිත සහ සහභාගීත්ව ආර්ථික වර්ධනයක් කරා ළඟා වීමටත් සඵලදායී අයුරින් දරිද්‍රතාවයට එරෙහිව නැගී සිටීමටත් අවශ්‍ය වන්නා වූ ප්‍රබල සාධකයක් ලෙස සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය හඳුනාගෙන ඇත.** ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ගණනාවක් විසින් රටපුරා සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ සහනදායී සංවර්ධන ණය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එසේම මෙම වැඩසටහන් මගින් සහනදායී ණය මුදල් සැපයීම පමණක් නොව, සමාජයේ අඩු වරප්‍රසාද ලත් අංශ වලට ණය හැර ඒ හා සම්බන්ධ වෙනත් පහසුකම් ලබා දීමටද කටයුතු කරනු ලබයි.

2017 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ප්‍රතිමූල්‍ය හා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම 15 ක් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් රුපියල් මිලියන 19,251.0 ක ණය ප්‍රමාණයක් දිවයින පුරා ප්‍රතිලාභීන් 126,742 ක් අතරේ මුදා හරින ලදී. මෙම යෝජනා ක්‍රම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, ආධාර ලබාදෙන විදේශීය නියෝජිත ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් අරමුදල් සපයන ලදී.

තවදුරටත්, ආපදා වලින් හානියට පත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත අරඹන කිරීම සඳහා සහාය දීමේ ජාතික වගකීමට උරදෙමින්, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ආපදා වලින් පසු 'ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම' සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) සහ 'අත්වැල' ණය යෝජනා ක්‍රමය නමින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම දෙකක් ශ්‍රී ලංකා

8

මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රම සඳහා පිළිවෙළින් කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සහ ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයන ලදී. රටේ නව සහ පවත්නා ව්‍යවසායකයන්ගේ මූල්‍යමය, තාක්ෂණික, අලෙවිකරණ සහ ව්‍යවසායකත්ව අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ ප්‍රමුඛතා යාන්ත්‍රණයක් පැවතීමේ ඇති වැදගත්කම හඳුනා ගනිමින්, ජාතික සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා එක්ව 2017 වසරේදී 'ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා' නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් තරුණ තරුණියන්, තරුණ උපාධිධාරීන්, කාන්තාවන් සහ විවිධ හැකියාවන් ගෙන් යුතු ආබාධිත පුද්ගලයින් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වේ. ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මූලික අරමුණ වනුයේ ඉදිරි පස් වසර තුළදී නව රැකියා දස ලක්ෂයක් ජනනය කිරීමේ රජයේ පුළුල් ප්‍රතිපත්තිමය අරමුණට දායක වීමයි.

2017 වසරේදී ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් අරමුදල් සපයන ලද ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියෙහි ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාකරන ලදී. කෘෂි ඵලදායීතාව ඉහළ නැංවීම, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, වෙළෙඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ කෘෂි කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියෙහි සියලුම පාර්ශවකරුවන් විසින් කරන ලද එකතු කල වටිනාකම ඉහළ නැංවීම සඳහා සහාය දැක්වීම අරමුණු කර ගනිමින් ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යන ආයතන දෙක මඟින් කෘෂි කාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියෙහි සමස්ත ප්‍රතිපත්ති අධීක්ෂණය, මාර්ගෝපදේශ සැපයීම සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පිහිටුවා ඇති මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුව මඟින් සිදු කෙරෙනු ඇත. 2017 වසරේදී, කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ මහ බැංකුව විසින් ආංශික ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. එමඟින් කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතියෙහි සංවර්ධන අරමුණට සහාය දක්වන අතරම මූල්‍ය අතරමැදිකරුවන්ගේ වත්මන් හා වෙනස්වන අවශ්‍යතා සපුරාලන නව්‍ය අවදානම් බෙදා ගැනීමේ මෙවලමක් ලෙසද ක්‍රියාත්මක වීම මෙම යෝජනා ක්‍රමය මඟින් අපේක්ෂා කරනු ලබයි. ගොවීන්ට අරමුදල් සැපයීමේ ක්‍රියාවලියේදී, සහභාගීත්ව ආයතන වල සුරැකුම් සම්බන්ධයෙන් මුහුණ පාන ගැටලු අවශ්‍යතා සඳහා ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය තුළින් විසඳුම් ලැබෙනු ඇත.

ජනතාව මූල්‍ය අන්තර්ගතභාවයෙන් බැහැර වීමට එරෙහිව අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් සහ විවිධ හේතූන් නිසා විධිමත් මූල්‍ය අංශයට ප්‍රවේශ වීමට අවස්ථාවක් නොමැති පුද්ගලයන් වෙත විශේෂ අවධානයක් යොමු කරමින් 2017 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කුසලතා සංවර්ධන වැඩසටහන් 150 ක් පවත්වන ලදී. මූල්‍ය අංශයෙන් බැහැර වීම හේතුවෙන් ඇති වන අවාසි සහ විධිමත් මූල්‍ය අංශය සමඟ සම්බන්ධ වීමෙන් ඇති ප්‍රයෝජන පිළිබඳව සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය ඇති කරලීම සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කරන ලදී. යහපත් බැංකුකරණය සහ මූල්‍ය පුරුදු, මූල්‍ය විනය සහ විධිමත් අංශයේ පවතින නව මූල්‍ය උපකරණ සහ සේවාවන් පිළිබඳව දැනුම් හුවමාරු කර ගැනීමේ පොදු වේදිකාවක් ලෙස ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක විය. වසර තුළදී, සාමාන්‍ය ජනතාව අතර දැනුම්වත්භාවය ඇති කරලීම සඳහා මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඵලදායී ලෙස යොදා ගැනීමට මහ බැංකුව සමත් විය.

සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය පහසුකම් සඳහා ඉඩ ප්‍රස්තා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මඟින් අඛණ්ඩව දරන ලද ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයක් ලෙස රට තුළ නව රැකියා අවස්ථා 50,000 ක් ජනනය කිරීමේ අරමුණ පෙරදැරිව 2017 මාර්තු මාසයේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පහත දක්වා ඇති සහනදායී ණය යෝජනා ක්‍රම 8 ක් ආරම්භ කර ඇත.

1. රන් අස්වැන්න ණය යෝජනා ක්‍රමය
2. ගොවි නවෝදා ණය යෝජනා ක්‍රමය
3. දිරි සවිය ණය යෝජනා ක්‍රමය
4. ජය ඉසුර ණය යෝජනා ක්‍රමය
5. රිවි බල සවි ණය යෝජනා ක්‍රමය
6. සොඳුරු පියස ණය යෝජනා ක්‍රමය
7. රිය ශක්ති ණය යෝජනා ක්‍රමය
8. මාධ්‍ය අරුණ ණය යෝජනා ක්‍රමය

ඒක පුද්ගල අදායම එ. ජ. ඩොලර් 5,000 ක් දක්වා ඉහළ නංවා ගැනීම, නව රැකියා අවස්ථා දස ලක්ෂයක් ජනනය කිරීම සහ 2020 වන විට අපනයන දෙගුණ කිරීම මෙන්ම ආර්ථික වර්ධනය සියයට 5 කට වඩා වැඩි මට්ටමකට ගෙන ඒම වැනි ශ්‍රී ලංකා රජයේ මධ්‍ය කාලීන අරමුණු ළඟා කර ගනිමින් සියලුම ශ්‍රී ලාංකිකයින් නිෂ්පාදන ආර්ථිකයක් තුළ පාර්ශවකරුවන් බවට පත් කිරීම සඳහා 'ව්‍යවසායී ශ්‍රී ලංකාවක්' (Enterprise Sri Lanka) යන ශ්‍රී ලංකා රජයේ වැඩසටහනට සමගාමීව මෙම පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලදී.

වාණිජකරණය කරන ලද කෘෂිකර්මාන්තයක් සඳහා පහසුකම් සැලසීම තුළින් කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය වැඩි කිරීම 'රන් අස්වැන්න' ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වී ඇත. සුළු පරිමාණ ගොවීන් මූල්‍යමය වශයෙන් බලගැන්වීම තුළින් අස්වැන්න ඉහළ නැංවීම සහ පිරිවැය අවම කිරීම 'ගොවි නවෝදා' ණය යෝජනා ක්‍රමය තුළින් අපේක්ෂා කරනු ලබයි. අනෙක් අතට, ගුණාත්මකතාවයෙන් යුතු කුකුළු පාලන නිෂ්පාදන බෙදා හැරීම ඉහළ නැංවීමේ අරමුණින්, ස්වයංරැකියාලාභීන්ට අධි ශීතකරණ ලබා ගැනීම සඳහා 'දිරි සවිය' ණය යෝජනා ක්‍රමය මගින් සහනදායී ණය පහසුකම් සපයනු ලබයි.

රට තුළ වඩාත් ඵලදායී පාසල් ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කරමින් පාසල් දරුවන්ට ආරක්ෂිත පාසල් ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 'රිය ශක්ති' ණය යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදී. මේ අතර, කෘෂි කර්මය, ධීවර කර්මාන්තය, පශු සම්පත්, විසිතුරු මල් හා පැළ වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, අත්කම්, ඇගලුම්, තොරතුරු තාක්ෂණ හා නිෂ්පාදන කර්මාන්ත යනාදී අංශයන් ඇතුළු වෙනත් අංශයන්හි නියැලී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය මුදල් සැපයීම අරමුණු කර ගනිමින් 'ජය ඉසුර' ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2017 වසරේදී 'රිවි බල සවි' ණය යෝජනා ක්‍රමය ද හඳුන්වාදෙන ලද අතර මෙමගින් නිවාස හිමියන්ට අඩු වියදමෙන් තම බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වන අතරම ඔවුන්ගේ අතිරික්ත බලශක්ති නිෂ්පාදනය ජාතික විදුලි බල පද්ධතියට සැපයීමට ද හැකි වනු ඇත. තවද, 'රිවි බල සවි' ණය යෝජනා ක්‍රමය මගින් නිවාස හිමියන්ට ප්‍රතිලාභ හිමි වන අතරම දැනටමත් ඉදිකිරීම් ආරම්භ කර ඇති එහෙත් තම නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා මූල්‍යාධාර අවශ්‍ය වන පුද්ගලයින්ට අලුතෙන් හඳුන්වාදෙන ලද 'සොඳුරු පියස' ණය යෝජනා ක්‍රමය මගින් මූල්‍ය පහසුකම් සැලසෙනු ඇත. එසේම, ලියාපදිංචි මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය හා සම්බන්ධ පුද්ගලයින්ට කිසිදු බාධාවකින් තොරව සිය කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මාධ්‍ය උපකරණ මිලදී ගැනීමට සහ තමන් සතුව පවතින මාධ්‍ය උපකරණ වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් 'මාධ්‍ය අරුණ' ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

රටපුරා විසිරී සිටින නව සහ දැනටමත් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම සඳහා කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයත් අඛණ්ඩවම ක්‍රියාත්මක වෙමින් 'කුඩා හා ක්ෂුද්‍ර කර්මාන්ත ප්‍රමුඛතා සහ ව්‍යවසාය ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර III - චක්‍රීය අරමුදල' (SMILE III-RF) හඳුන්වා දෙන ලදී. මෙය, 'සාමාන්‍ය' සහ 'තාක්ෂණික හුවමාරු සහායක' යන ණය යෝජනා ක්‍රම දෙකෙන් සමන්විත වේ. මෙම ණය යෝජනා ක්‍රම මගින් ක්ෂුද්‍ර හෝ කුඩා පරිමාණ නිෂ්පාදන හෝ කාර්මික ව්‍යාපාර සඳහා සහනදායී අරමුදල් සැපයීම සිදු කරනු ලබයි.

ප්‍රතිමූල්‍ය සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ඉහත දක්වන ලද ආයතන හැරුනු විට 2017 වසරේදී, රටේ සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් තවත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ගණනාවක්ම මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. මෙම උත්සාහයන්, ඒවායෙහි පරිමාණයන් නොතකා, රටේ මූල්‍ය ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා වෙන් වෙන්ව ප්‍රයත්න දැරීමකි. එබැවින්, 2017 වසරේදී මේ සම්බන්ධව ජාතික මට්ටමේ සාර්ව ප්‍රවේශයක ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ පුළුල් ජාතික උපායමාර්ගයක් සැකසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මුල පුරන ලදී. ඒ අනුව 2018 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයක් සැකසීම සඳහා තාක්ෂණික සහය ලබා ගැනීමට ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් කරන ලදී. රටේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන් එක් දිශානතියකට යොදා ගැනීම සඳහා සම්මත ප්‍රවේශයක් ලෙස මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයක් තිබීම වැදගත් වනු ඇත. අනාගතයේදී ඉහළ මට්ටමේ මූල්‍ය අන්තර්ගතභාවයක් කරා ලඟා වීමේ ජාතික ප්‍රයත්නය තව දුරටත් තීව්‍ර කිරීම සඳහා සහාය දැක්වීම ද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය මගින් සිදු කළ හැකිය.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ආර්ථික බලපෑම විවිධාකාර වේ. යටිතල පහසුකම් පුළුල් කිරීම, ඉලෙක්ට්‍රොනික ගනුදෙනු උපයෝගී කර ගැනීම සඳහා වඩාත් පහසු ප්‍රවේශයක් ලබාදීම සහ විවිධාකාර මූල්‍ය සේවා භාවිතය දිරිමත් කිරීම, කෙටි කාලීනව මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම ජාතික උපායමාර්ගය මගින්, දැරිය හැකි මූල්‍ය සේවාවක් සැපයීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරන අතරම සියලුම මූල්‍ය සේවා පාරිභෝගිකයන් ප්‍රමාණවත් තරම් උගත්, දැනුවත්, සුරක්ෂිත හා සමානව සැලකුම් ලැබූවන් බවට පත් කරමින් ඔවුන්ගේ ගැටලු වලට සඵලදායී සහ කාර්යක්ෂම විසඳුම් ද ලබා දෙනු ඇත. රටේ සෑම වැඩිහිටියෙකුටම සහ ව්‍යවසායකයෙකුටම ඉඩ සලසන

පුළුල් වශයෙන් අන්තර්ගත මූල්‍ය පද්ධතියක් ලඟා කර ගැනීම මධ්‍ය හා දිගු කාලීනව අපේක්ෂා කෙරෙන අතර මෙම අන්තර්ගත මූල්‍ය ක්‍රමය මගින් එහි සහභාගී වන්නන්ට කිසිදු බාධාවකින් හෝ ප්‍රමාදයකින් තොරව ප්‍රමාණවත්, ගුණාත්මක සහ දැරිය හැකි මූල්‍ය සේවාවන් භුක්ති විඳීමට ද ඉඩ සලසනු ඇත.

## 8.6 මූල්‍ය යටිතල පහසුකම්

### ගෙවීම් සහ පියවීම් පද්ධති

**රටෙහි ආර්ථික කටයුතුවලට එලදායී ලෙස පහසුකම් සැලසීම සඳහා ගෙවීම්වල කාර්යක්ෂමතාව, පහසුව සහ සුරක්ෂිත බව වැඩිදියුණු කිරීමට යොමු වන අතර පුද්ගලයින්ගේ සහ ආයතනවල ගෙවීම් අවශ්‍යතා සපුරාලීම, ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් මගින් තවදුරටත් සිදු කරන ලදී.** මුදල් අවම වශයෙන් භාවිතා වන සමාජයක් කරා යොමුවීම සඳහා වූ දැක්ම තුළින් මග පෙන්වීම් ලද ශ්‍රී ලංකා මහ බැංකුව විද්‍යුත් ගෙවීම් ක්‍රමවේද ප්‍රවර්ධනය සහ එවන් ක්‍රමවේදවල සුරක්ෂිත බව තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන ලදී. ගෙවීම් සහ පියවීම් පද්ධතීන් හා සම්බන්ධ අවදානම් අවම කිරීම තුළින් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව සහ ශක්තිමත් බව තහවුරු කිරීම අරමුණු කරගනිමින්, ජාතික ගෙවීම් පද්ධතිය නියාමනය කරන්නා ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව නියාමන හා අධීක්ෂණ කටයුතු තවදුරටත් පුළුල් කරන ලදී.

**ඉහළ යමින් පවතින ගනුදෙනු ප්‍රමාණය සඳහා පහසුකම් සලසමින් 2017 වසරේදී විශාල වටිනාකම් සහිත ගෙවීම් පද්ධතිය සහ සුළු පරිමාණ ගෙවීම් පද්ධති සුමට ලෙස ක්‍රියාත්මක විය.** ලංකාසෙට්ල් පද්ධතියෙහි උප පද්ධතීන් දෙක වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය පිළිවෙළින් විශාල වටිනාකම් සහිත හා කාල සංවේදී අරමුදල් පැවරීම් සහ රජයේ සුරැකුම්පත් ගනුදෙනු සිදුකිරීම සඳහා විද්‍යුත් ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් සපයමින්, එවන් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම තවදුරටත් සිදුකරන ලදී. සලකා බලන කාලය තුළදී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා රුපියල් බිලියන 92,303 ක වටිනාකමකින් යුත් ගනුදෙනු 377,312 ක් සිදු කෙරිණි. පසුගිය වසර සමඟ සැසඳීමේදී, 2017 වසර තුළදී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ගනුදෙනු ප්‍රමාණය සියයට 3.1 ක වර්ධනයක් වාර්තා කළ අතර ගනුදෙනුවල මුළු වටිනාකම ආන්තික වශයෙන් සියයට 1.2 කින් පහත වැටුණි. මුදල් භාවිතයෙන් තොරව සිදු කරන ගනුදෙනු සඳහා වැඩිම දායකත්වයක් දක්වන පද්ධතිය ලෙස තත්කාලීන දළ පියවීම් පද්ධතිය තවදුරටත් පැවති අතර 2017 වසරේදී තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා සිදු කළ ගනුදෙනුවල මුළු වටිනාකම, රටෙහි මුදල් භාවිතයෙන් තොරව සිදු කළ ගනුදෙනුවල වටිනාකමින් සියයට 86.3 ක් විය. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහාය දැක්වීමෙන් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ද්‍රවශීලතා අවදානම අවම කර ගැනීම සඳහා රජයේ සුරැකුම්පත් ඇපයට තබාගෙන පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වෙත පොලී රහිත එක්දින ද්‍රවශීලතා පහසුකම සැපයීම, එම පද්ධතියෙහි ක්‍රියාකරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් සිදු කරන ලදී. 2017 වසරේදී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන විසින් භාවිතා කළ එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි දෛනික සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 47.4 ක් ලෙස වාර්තා විය.

**2017 වසර අවසානයේ දී, ලංකාසෙක්‍යු පද්ධතියෙහි පැවති මුළු නිර්ලේඛන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 4,912.2 ක්වූ අතර, එය වටිනාකම රුපියල් බිලියන 724.7 ක්වූ භාණ්ඩාගාර බිල්පත්වලින් ද, වටිනාකම රුපියල් බිලියන 4,187.5 ක්වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් ද සමන්විත විය.**

**සළකා බලන වසර තුළදී, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය සුමට ලෙස ක්‍රියාත්මක වූ අතර චෙක්පත් නිෂ්කාශන පද්ධතිය හරහා නිෂ්කාශනය කළ මුළු චෙක්පත් ප්‍රමාණය 2017 වසරේදී රටෙහි මුදල් භාවිතයෙන් තොරව සිදු කළ ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 24.3 ක් විය.** 2016 වසර සමඟ සැසඳීමේදී, 2017 වසර තුළදී චෙක්පත් නිෂ්කාශන පද්ධතිය හරහා නිෂ්කාශනය කළ මුළු චෙක්පත් ප්‍රමාණය සියයට 0.1 ක පහත වැටීමක් වාර්තා කළ අතර චෙක්පත්වල මුළු වටිනාකම සියයට 9.2 කින් වර්ධනය විය.

**පසුගිය වසර හා සැසඳීමේදී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය මගින් සිදුකළ ගනුදෙනු ප්‍රමාණය හා වටිනාකම ඉහළ යෑමත් සමඟ එම පද්ධතියෙහි මෙහෙයුම් කටයුතුවල වර්ධනාත්මක උපනතිය සළකා බලන වසර තුළදී ද තවදුරටත් දක්නට ලැබිණ.** ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මගින් සිදු කළ මුළු ගනුදෙනු ප්‍රමාණය හා වටිනාකම පිළිවෙළින් සියයට 12.7 කින් මිලියන 30 ක් දක්වා සහ සියයට 18.4 කින් රුපියල් බිලියන 1,725 ක් දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා කඩිනමින් ගනුදෙනු සිදු කිරීම සහ පියවීම සඳහා 2017 සැප්තැම්බර් මාසයේ සිට වැඩ කරන දිනකදී ක්‍රියාත්මක වන නිෂ්කාශන චක්‍ර සංඛ්‍යාව දෙකේ සිට තුන දක්වා ඉහළ නංවන ලදී.

### 8.22 සංඛ්‍යා සටහන
### ගෙවීම් පද්ධති මගින් සිදු වූ ගනුදෙනු

| ගෙවීම් පද්ධති | 2016 (අ) | | 2017 (ආ) | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය ('000) | වටිනාකම (රු. බිලියන) | ප්‍රමාණය ('000) | වටිනාකම (රු. බිලියන) |
| **විශාල පරිමාණයේ ගෙවීම් පද්ධති** | | | | |
| තත්කාලීන දළ පියවීම් පද්ධතිය | 366 | 93,378 | 377 | 92,303 |
| **සුළු පරිමාණයේ ගෙවීම් පද්ධති** | | | | |
| ප්‍රධාන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය | 51,996 | 9,601 | 51,963 | 10,482 |
| ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) | 26,647 | 1,458 | 30,018 | 1,725 |
| ණය කාඩ්පත් | 31,858 | 182 | 36,964 | 199 |
| හර කාඩ්පත් | 38,083 | 108 | 46,964 | 135 |
| අන්තර්ජාල බැංකු කටයුතු | 18,164 | 1,589 | 23,066 | 2,101 |
| දුරකථන බැංකු කටයුතු | 3,444 | 16 | 3,809 | 32 |
| තැපැල් උපකරණ | 1,244 | 7 | 1,308 | 7 |
| **එකතුව** | **171,802** | **106,338** | **194,494** | **106,983** |
| **එක්සත් ජනපද ඩොලර් නිෂ්කාශන පද්ධතිය** | **59** | **39** | **56** | **74** |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

'ලංකාපේ' (LankaPay) යන සන්නාම නාමය **යටතේ ක්‍රියාත්මක වන ගෙවීම් කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් පිළිබඳ වූ පොදු යාන්ත්‍රණය (CCAPS), එහි මේ වන විට හඳුන්වා දී ඇති උප යාන්ත්‍රණ තුන වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණයෙහි (SAS) මෙහෙයුම් කටයුතුවල වර්ධනයත් සමග 2017 වසරේදී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලදී.** ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය එහි සාමාජික මූල්‍ය ආයතනවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අතර අන්තර්සම්බන්ධතාව ගොඩනැගීම තුළින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයට සම්බන්ධ ඕනෑම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් සාමාජික මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන් හට මුදල් ආපසු ගැනීමේ හා ශේෂය පරීක්ෂා කිරීමේ හැකියාව ලබා දෙයි. පසුගිය වසර හා සැසඳීමේදී, 2017 වසරේදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණය හරහා සිදු කළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු ප්‍රමාණය හා වටිනාකම පිළිවෙළින් සියයට 44.4 කින් මිලියන 32.9 ක් සහ සියයට 52.6 කින් රුපියල් බිලියන 264.1 ක් දක්වා වර්ධනය විය. සලකා බලන කාලය අවසන් වන විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ස්වකීය යාන්ත්‍රණ සහිත සියලුම බලපත්‍රලාභී බැංකු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ වී තිබූ අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ සමස්ත මූල්‍ය ආයතන සංඛ්‍යාව 27 ක් ලෙස වාර්තා විය. ඊඑම්වී (EMV) තාක්ෂණය යොදාගැනීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජික ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුබල දෙන ලද අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය ඊඑම්වී තාක්ෂණය වෙත යොමු වීමට අදාළ වගකීම් පැවරෙන දිනය (liability shift date) 2018 වසරේ ජනවාරි මස 01 දින ලෙස තීරණය කරන ලදී. ඊඑම්වී යන්නෙන් යුරෝපේ (EuroPay), මාස්ටර්කාඩ් (Master Card) සහ වීසා (Visa) අදහස් කෙරෙන අතර එය චිප් කාඩ්පත් (Chip Card) තාක්ෂණය යොදාගෙන ගනුදෙනු සත්‍යාපනය කිරීම තුළින් ගෙවීම් කාඩ්පත් ගනුදෙනුවල සුරක්ෂිත බව ඉහළ නැංවීම සඳහා යොදා ගන්නා අන්තර්ජාතික ප්‍රමිතියකි. ඊඑම්වී තාක්ෂණය යොදා නොගන්නා සාමාජික ආයතන වෙත වගකීම දැරීමට සිදුවීමේ නැඹුරුතාව නිසා වගකීම් පැවරෙන දිනෙන් පසු ඊඑම්වී තාක්ෂණය යොදා නොගත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජික ආයතනවලට වංචාවන්ට අදාළ වගකීම දැරීමට සිදුවීමේ වැඩි ඉඩකඩක් පවතී. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු යොමු කිරීම සඳහා ස්වකීය යාන්ත්‍රණ සහ ස්වකීය ගෙවීම් කාඩ්පත් කළමණාකරන පද්ධතීන් මෙහෙයවීමේ හැකියාවක් නොමැති මූල්‍ය ආයතන වෙත ගෙවීම් කාඩ්පත් කළමණාකරන පද්ධති සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු යොමු කිරීමේ සේවා සැපයීම සඳහා 2015 වසරේදී හඳුන්වා දෙන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණයෙහි කටයුතු සළකා බලන කාලය තුළදී තවදුරටත් සුමට ලෙස සිදු විය.

**කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දෙවන අදියර ලෙස තත්කාලීන පදනමින් සාමාජික ආයතන අතර සුළු පරිමාණ අරමුදල් පැවරීම් සඳහා පහසුකම් සැලසීමට 2015 වසරේදී විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.** සලකා බලන කාලය තුළදී, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලද අතර එම ප්‍රගතිය එම යාන්ත්‍රණය මගින් සිදු කල ගනුදෙනු ප්‍රමාණය හා වටිනාකම ඉහළ යෑමෙන් නිරූපණය විය. පසුගිය වසර හා සැසඳීමේදී, 2017 වසරේදී විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කළ ගනුදෙනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස සියයට 253.6 කින් මිලියන 3.2 ක් දක්වා ඉහළ ගිය අතර ගනුදෙනුවල මුළු වටිනාකම සියයට 294.5 කින් රුපියල් බිලියන 273.7 ක් දක්වා වර්ධනය

8

විය. තවද, රටෙහි අරමුදල් පැවරීමේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා මනා ලෙස පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වැඩිදියුණුකිරීම් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය ආයතන වෙත තත්කාලීන මංගත ගෙවීම් සිදුකිරීමට පහසුකම් සැලසීම සඳහා විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධව ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform) ක්‍රියාත්මක කිරීම සඳහා ලංකාක්ලියර් පුද්ගලික සාමාගමට අවසර ලබා දෙන ලදී. 2017 ජූලි මස මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව ප්‍රථමයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීන ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම ආරම්භ කරන ලද අතර අනාගතයේදී මෙම ගෙවීම් වේදිකාව අනෙකුත් රාජ්‍ය ආයතන වෙත පහසුකම් සැලසීමට යොදා ගැනෙනු ඇත. රජයේ ආදායම් එක්රැස් කිරීමේ ක්‍රමවේද විධිමත් කිරීමට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව දායකත්වය ලබාදෙන අතර රාජ්‍ය ආයතන වෙත පහසුවෙන් ගෙවීම් සිදු කිරීමේ ප්‍රතිලාභ පුද්ගලයින්ට හා ආයතනවලට අත්කර දෙනු ඇත. තවද, වෙනත් ආයතනයන්ට සිදු කරනු ලබන ගෙවීම් සඳහා පහසුකම් සැලසීමේ හැකියාව ලංකාපේ මංගත ගෙවීම් වේදිකාවට ඇති බැවින් එවැනි ආයතනවලට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාවෙහි ප්‍රතිලාභ අත්කර ගැනීමේ හැකියාව ඇත. 2017 වසර අවසානයේදී, බලපත්‍රලාභී වාණිජ බැංකු හතක් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හා සම්බන්ධ වී තිබූ අතර මෙහෙයුම් කටයුතු සිදු කළ මාස කිහිපය තුළ ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා රුපියල් මිලියන 514 ක මුළු වටිනාකමකින් යුත් ගනුදෙනු 1,276 ක් සිදු කෙරිණි. ශ්‍රී ලංකා රේගුව වෙත කෙරෙන තීරුබදු ගෙවීම් වටිනාකම්වල සාමාන්‍ය අගයන් සැලකිල්ලට ගනිමින්, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ගනුදෙනුවල වටිනාකම සඳහා පනවා ඇති උපරිම සීමාව නිසා ලංකාපේ මංගත ගෙවීම් වේදිකාවේ මෙහෙයුම් කටයුතුවලට බාධා සිදුවීම වළක්වාලීම සඳහා ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සඳහා වෙන්කළ ගනුදෙනු කේතය හරහා සිදුකරන ගනුදෙනුවල වටිනාකමට අදාළ උපරිම සීමාව ඉහළ නැංවීමට 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කර 2017 අංක 08 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. මෙයට අමතරව, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි අරමුදල් පැවරීම් සඳහා ගිණුම් අංකය වෙනුවට අරමුදල් ලබන්නාගේ ජංගම දුරකථන අංකය හා අදාළ ගිණුමට සම්බන්ධිත අන්වර්ථ නාමයක් (Nickname) යොදා ගන්නා "ගෙවීම් හුවමාරු නාම" (Payment Exchange Name) සංකල්පය හඳුන්වා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුමැතිය ලබා දෙන ලදී. ගෙවීම් හුවමාරු නාම සංකල්පය මගින් වැරදි ලෙස ගිණුම් අංක ඇතුළත් කිරීම නිසා විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ගනුදෙනු ප්‍රතික්ෂේප වීම වැළැක්වීමත් සහ ගනුදෙනුකරුවන්ගේ පහසුව තවදුරටත් ඉහළ නැංවීමටත් අපේක්ෂිතය.

**රට තුළ සිදුවන ගෙවීම් කාඩ්පත් ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියන්ට සහ වෙළෙඳුන්ට දැරීමට සිදුවන පිරිවැය අවම කිරීමේ අරමුණින් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ලංකාක්ලියර් පුද්ගලික සමාගම වෙත අනුමැතිය ලබාදෙන ලදී. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය, ජාත්‍යන්තර ගෙවීම් කාඩ්පත් ජාලයක් සමඟ හවුල්ව ක්‍රියාත්මක කෙරෙනු ඇති අතර එමගින් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන කාඩ්පත් ජාත්‍යන්තරව පිළිගැනෙනු ඇත.** ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ කාඩ්පත් නිකුත් කිරීම 2018 වසරේදී ආරම්භ කිරීමට ලංකාක්ලියර් පුද්ගලික සමාගම සැලසුම් කර ඇත. තවද, කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සිව්වන අදියර ලෙස ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයට සමගාමීව, එම කාඩ්පත් ක්‍රමය යටතේ නිකුත් කරන කාඩ්පත් යොදාගෙන විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර මගින් සිදු කරන ගනුදෙනු සඳහා නිෂ්කාශන පහසුකම් සැලසීමට විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය ලංකාක්ලියර් පුද්ගලික සමාගම විසින් ක්‍රියාත්මක කරනු ඇත.

**ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි අවදානම් අවම කිරීම සඳහා රටෙහි ගෙවීම් සහ පියවීම් පද්ධතීන් නියාමනය කරන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව නියාමන රාමුව සහ අධීක්ෂණ පරිචයන් වඩාත් ශක්තිමත් කිරීමෙහි තවදුරටත් නිරත වුණි.** 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ බලපත්‍ර ලබා තිබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගමකට පිළිවෙළින් ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පදනම් කරගත් ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතියක් ක්‍රියාකරවීමට සහ ණය කාඩ්පත් නිකුත් කරන්නෙකු ලෙස කටයුතු කිරීමට 2017 වසරේදී අවසර දෙන ලදී. මෙයට අමතරව, ගෙවීම් පද්ධතීන්හි වැඩිදියුණුවීම් සැලකිල්ලට ගනිමින් ණය කාඩ්පත් මෙහෙයුම් මාර්ගෝපදේශ සංශෝධනය කිරීමට සහ සේවා සපයන්නන් මගින් ගෙවීම් කාඩ්පත් යොදාගෙන සිදුකරන විද්‍යුත් වාණිජ්‍යය ගනුදෙනු අත්පත් කර ගැනීම සහ ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම අයදුම් මෘදුකාංගවලට අදාළව රෙගුලාසි නිකුත් කිරීම තුළින් නියාමන රාමුව පුළුල් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, ගෙවීම් සහ පියවීම් පද්ධති

සඳහා පහසුකම් සැලසීමේ කාර්යයෙහි නිරත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතියේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය සඳහා සහයෝගය දැක්වීමට ප්‍රතිපත්ති සම්පාදනයෙහි තවදුරටත් නිරත වුණි. ගෙවීම් සහ පියවීම් පද්ධතීන් සඳහා වන උපදේශක කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය, ගෙවීම් ක්ෂේත්‍රයෙහි සිදුවන වැඩිදියුණු වීම් සැලකිල්ලට ගනිමින් මූල්‍ය තාක්ෂණ (FinTech) ක්ෂේත්‍රය සහ බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) හා සම්බන්ධ වැඩිදියුණු වීම් අධ්‍යයනය කිරීමට කමිටු දෙකක් පත්කරන ලදී.

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

රජයේ ප්‍රතිපත්තිය හා අනුකූලව, 2017 නොවැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1953 අංක 24 දරන විනිමය පාලන පනත ඉවත් කර 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හඳුන්වා දීමෙන් විදේශ විනිමය මෙහෙයුම් කටයුතු සඳහා නව නෛතික හා ප්‍රතිපත්තිමය රාමුවක් ක්‍රියාත්මක කරන ලදී. නව පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙනුවට විදේශ විනිමය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

රෙගුලාසි සහ සීමා කිරීම් ලිහිල් කිරීම තුළින් ප්‍රාග්ධන ප්‍රවාහයන් තවදුරටත් ලිහිල් කිරීමේ හා විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ ක්‍රියාවලීන් සරල කිරීමේ අරමුණින් නව රෙගුලාසි ක්‍රියාත්මක කරන ලදී. නව විදේශ විනිමය තන්ත්‍රය, විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීමෙහි ලා වඩාත් පහසුකම් සපයනු ඇත. එබැවින්, මෙම රෙගුලාසි මගින් අදාළ පාර්ශවයන්ගේ හා විභව ආයෝජකයන්ගේ අපේක්ෂාවන් සපුරාලනු ඇති බවට අපේක්ෂා කෙරේ.

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

රටක මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම අවම කිරීම සඳහා වන නීතිමය රාමුව සහ ක්‍රියාමාර්ග ඉතා වැදගත් වේ. 2017 වසරේදී ද ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව තම මෙහෙයුම් නොකඩවා සිදු කරගෙන යන ලදී. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට අදාළ වැරදි වළක්වාගැනීම, හඳුනාගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම යන කටයුතු පහසු කරලීම සඳහා සැක කටයුතු ගනුදෙනු පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ මූල්‍ය ආයතන හා මූල්‍ය නොවන ආයතනයන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් කටයුතු කිරීමේ ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් වන රීති නිකුත් කිරීම මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

### තොරතුරු එක්රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 6 වන වගන්තියට අනුව වාර්තාකරණ ආයතනයන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, කොටස් තැරැව්කරුවන්, රක්ෂණ ආයතන සහ මුදල් හා මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු අවම අගය වන රුපියල් මිලියනයක් හෝ ඊට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු (ආමුඛ සහ ප්‍රතිමුඛ) හෝ ඒ හා සමාන අගයකින් යුත් විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත නොකඩවා වාර්තා කරන ලදී. ඒ අනුව, මෙම කාලය තුළදී වාර්තාකරණ ආයතනයන් විසින් පිළිවෙළින් මුදල් ගනුදෙනු මිලියන 4.5 ක් ද, මුදල් ප්‍රේෂණ ගනුදෙනු මිලියන 4.3 ක් ද වාර්තා කර ඇත.

මීට අමතරව, ඉහත කී වාර්තාකරණ ආයතනයන් විසින්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වන වගන්තියට අනුව යම් නීතිවිරෝධී කටයුත්තකට අදාළ විය හැකි ගනුදෙනුවක් හෝ ගනුදෙනුවක් කිරීමට තැත් කිරීමකට සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු වාර්තාවන් ද මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කරන ලදී. මෙම කාලය තුළදී වාර්තාකරණ ආයතන, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ මහජනතාව විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තා 925 ක් වාර්තා කර ඇති අතර මෙම වසර තුළදී සැක කටයුතු ගනුදෙනු වාර්තා 418 ක් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ නියාමන ආයතනයන් වෙත වැඩිදුර විමර්ශනයන් සඳහා යොමු කර ඇත.

### අනුකූලතාවය අධීක්ෂණය කිරීම

මෙම කාලය තුළදී, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ එම පනත යටතේ නිකුත් කරන ලද රීතිවලට අනුකූල වන අයුරින් මූල්‍ය ආයතනයන් කටයුතු කරන්නේද යන්න අධීක්ෂණය කිරීම සඳහා අවදානම මත පදනම් වූ එතැන් පරීක්ෂාවන් 21 ක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කරන ලදී.

### අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශන සහ නඩු පැවරීම්වලට අවශ්‍ය තොරතුරු හුවමාරු කර

ගැනීම සඳහා තායිලන්තය, භූතානය, චීනය, කටාර් රාජ්‍යය සහ ට්‍රිනිඩෑඩ් හා ටොබැගෝ යන රටවල මූල්‍ය බුද්ධි ඒකකයන් සමග ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අවබෝධතා ගිවිසුම් 5 කට අත්සන් තබන ලදී. ඒ අනුව, මේ වනවිට මූල්‍ය බුද්ධි ඒකකය විදේශීය පාර්ශවයන් සමග අවබෝධතා ගිවිසුම් 37 කට එළැඹී ඇත. තවද, මූල්‍ය බුද්ධි ඒකකයෙහි විශ්ලේෂණ ක්‍රියාවලිය පහසු කරලීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය සමග ද ගිවිසුම් 2 කට අත්සන් තබන ලද අතර ඒ අනුව, මේ වන විට මූල්‍ය බුද්ධි ඒකකය දේශීය පාර්ශවයන් සමඟ එළැඹ ඇති අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 5 ක් දක්වා ඉහළ ගියේය.

### මූල්‍ය කාර්ය සාධක බලකාය මගින් ලැයිස්තුගත කිරීම සහ අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ගෝලීය ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරනු ලබන මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් සිය කලාපීය නිරීක්ෂණ ආයතන හරහා, එක් එක් රටවල් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සාර්ථකව සිදුකිරීම සඳහා ගෙන ඇති පියවර සහ ආයතනික හා නීතිමය රාමුව ඇගයීමට ලක් කිරීම සිදු කරනු ලබයි. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්වන ලද අන්‍යෝන්‍ය ඇගයීමේ දෙවන වටය 2014/15 වසරේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාව පිළිබඳ දෙවන අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව 2015 ජූලි මාසයේදී සම්මත කරගන්නා ලද අතර, අන්‍යෝන්‍ය ඇගයීමේ දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධව හඳුනාගන්නා ලද දුර්වලතාවයන් මග හරවා ගැනීම සඳහා පියවර රැසක් ක්‍රියාත්මක කරන ලෙසට එම වාර්තාව හරහා නිර්දේශ කර ඇත. 2017 ඔක්තෝම්බර් මාසයේ ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හි දී පැවැති මූල්‍ය කාර්ය සාධක බලකායේ සැසිවාරයේදී ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමෝපායයන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර මෙය 'අළු ලේඛනයට' ඇතුළත් වීම ලෙස හඳුන්වයි. මෙසේ ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව, එම හඳුනාගත් ක්‍රමෝපායමය දුර්වලතා මග හරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබාදුන් අතර ලබාදී ඇති එම කාල රාමුව තුළදී අවශ්‍ය පියවර ගෙන මෙම ක්‍රියාකාරී සැලැස්ම සාර්ථක අයුරින් අවසන් කර ශ්‍රී ලංකාවේ අනුකූලතාවය සහ රටේ ශ්‍රේණිගත කිරීම ඉහළ මට්ටමක් දක්වා ගෙන යෑමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මෙන්ම එම ක්‍රියාවලියට අදාල අනෙකුත් පාර්ශ්වයන් කටයුතු කරනු ලබයි.

### නීතිමය ප්‍රවණතා

සියලුම ආයතනයන්ට අදාළ වන පරිදි 2015/56 අංක දරන සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝග - 2017 අති විශේෂ ගැසට් පත්‍රය 2017 අප්‍රේල් 21 දින නිකුත් කරන ලදී.

### ණය තොරතුරු

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් එහි සාමාජික ආයතනවලට ණය ගැනුම්කරුවන් පිළිබඳව තොරතුරු ලබාදීම සිදු කරනු ලබයි. ණය තොරතුරු කාර්යාංශය විසින් 2016 වසරේ දී නිකුත් කළ ණය වාර්තා ගණන 7,948,967 ක් වන අතර, ආර්ථිකයේ ශීඝ්‍රයෙන් වැඩි වන ණය ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුකොටගෙන 2017 වසරේදී ණය වාර්තා 9,096,132 ක් නිකුත් කරන ලදී. මෙය සියයට 14.4 ක වර්ධනයකි. 2017 වසර අවසානය වන විට ණය දෙන ආයතන 85 ක් ණය තොරතුරු කාර්යාංශයේ සාමාජිකත්වය ලබා තිබුණි.

ණය තොරතුරු කාර්යාංශයේ සේවා පුළුල් කිරීමට සහ මෙම කාර්යාංශය මගින් ආවරණය වන ණය ගැනුම්කරුවන් වැඩි කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබේ. තනි පුද්ගලයන්ට සහ ව්‍යාපාර ආයතනවලට ණය වටිනාකමක් ලබා දීමේ අරමුණින් නව කාර්යාංශ පද්ධතියක් කෙටි කලක දී හඳුන්වාදීමට ණය තොරතුරු කාර්යාංශය අපේක්ෂා කරයි. මෙම නව කාර්යාංශ පද්ධතිය හරහා විදුලි සංදේශ, රක්ෂණ සහ සේවා බිල්පත් වැනි මූල්‍ය නොවන ආයතනවල දත්ත ද පවත්වා ගැනීමට සහ ලබාදීමට හැකි වනු ඇත. ණය දීමේ අංශයේ ණය අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම, ණය වෙළෙඳපොළ වර්ධනය කිරීම සහ අඩු වශයෙන් ණය ලබා දුන් අංශවලට වැඩිපුර ණය ලබාදීම ඇතුලුව රටෙහි ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පෙන්වන දර්ශකය වැඩිකර ගැනීම සහ මූල්‍ය ස්ථායිතාව වැඩිදියුණු කිරීම මෙම නව කාර්යාංශ පද්ධතියෙහි විශේෂාංග සහ වාර්තා මගින් සිදු වෙතැයි අපේක්ෂිතය. ණය වෙළෙඳපොළෙහි ණය තොරතුරු කාර්යාංශයේ කාර්යභාරය පිළිබඳව දැනුම්වත් කිරීමට සහ අවදානම් කළමනාකරණය සඳහා ණය වාර්තාවල විචක්ෂණශීලී අර්ථ දැක්වීම පහසු කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශය විසින් ණය දෙන ආයතනවල ණය නිලධාරීන් සහ අනෙකුත් සේවක මණ්ඩලය මෙන්ම මහජනතාව සඳහා දැනුම්වත් කිරීමේ සහ අධ්‍යාපනික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

### 8.23 සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා මෑත කාලීනව ගන්නා ලද ප්‍රධාන විචක්ෂණශීලී ක්‍රියාමාර්ග

| දිනය | විචක්ෂණශීලී ක්‍රියාමාර්ග |
|---|---|
| 2014 ජනවාරි 17 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍ර සඳහා ගෙවිය හැකි උපරිම පොලී අනුපාත සීමාවන් සංශෝධනය කරන ලදී. |
| 2014 මාර්තු 31 | බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව යටතේ මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදය යටතේ අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණය ගණනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2014 ජූනි 05 | තක්සේරුකරුවන්ට අදාළ යෝග්‍යතා නිර්ණායක ද ඇතුළත් කරමින්, නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2014 ජූනි 17 | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සිදු කරන රන් භාණ්ඩ උකස් ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. |
| 2014 ජූනි 26 | ණය පහසුකම් සම්බන්ධ උපරිම සීමා පිළිබඳ විධානයන් සංශෝධනය කරන ලදී. |
| | 2015 ජූලි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වූ මූලික ආරක්ෂණ ප්‍රමිතිය පිළිබඳ වූ විධානයන් බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2014 දෙසැම්බර් 23 | ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙළින් රුපියල් බිලියන 10 ක සහ රුපියල් බිලියන 5 ක අවම මූලික ප්‍රාග්ධනයක් පවත්වාගත යුතු බවට චක්‍රලේඛ 2 ක් නිකුත් කරන ලදී. |
| 2015 ජනවාරි 01 | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ එක් ආයතනයක එක් තැන්පතු හිමියකු සඳහා වන තැන්පතු රක්ෂණ ආවරණය රුපියල් 200,000 සිට රුපියල් 300,000 දක්වා ඉහළ නංවන ලදී. |
| 2015 මාර්තු 31 | 2015 අප්‍රේල් මස 01 දින සිට බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය ක්‍රියාවට නැංවීම පිළිබඳ විධිවිධානයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 14 | මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිත කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම් වෙනුවෙන් 2015 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සියයට 70 ක උපරිම වටිනාකම මත ණය අනුපාතයක් පවත්වා ගෙන යන ලෙස බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට විධානයන් නිකුත් කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 29 | සියයට 70 ක උපරිම වටිනාකම මත ණය අනුපාතයක් පවත්වා ගෙන යෑමේ විධිවිධානය බල පැවැත්වෙනුයේ 2015 දෙසැම්බර් 01 දින සිට බව බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට දැනුම් දීම සඳහා විධානයන් නිකුත් කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 30 | මෝටර් වාහන ආනයනය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේ දී 2015 දෙසැම්බර් 01 දක්වා සියයට 100 ක අවම ආන්තික මුදල් තැන්පතුවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් පනවන ලදී. |
| 2016 ජනවාරි 18 | බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නව ශාඛාවන් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර විවෘත කිරීම, ශාඛාවන් හා වෙනත් ව්‍යාපාර ඒකක වසා දැමීම හා ස්ථාන වෙනස් කිරීම සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ශක්තිමත් හා විධිමත් කිරීම සඳහා විධානයන් නිකුත් කරන ලදී. |
| 2016 ඔක්තෝබර් 28 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ සඳහා  ලබාදිය හැකි උපරිම පොලී අනුපාතික සම්බන්ධ විධානය සංශෝධනය කරන ලදී. |
| 2016 දෙසැම්බර් 29 | 2017 ජූලි මස 01 වන දින සිට සියලුම බලපත්‍රලාභී බැංකු විසින් බාසල් III මාර්ගෝපදේශවලට අනුව ඒ ඒ බැංකුවල අවදානම මත බර තබන ලද වත්කම් ප්‍රමාණයන්ට අනුකූල අවම ප්‍රාග්ධන අනුපාතයන් සහ ස්වාරක්ෂකයන් පවත්වාගෙන යෑම පිළිබඳව විධානය නිකුත් කරන ලදී. |
| 2017 ජනවාරි 13 | 2017 ජනවාරි 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් උපරිම වටිනාකම මත ණය අනුපාතයන් අනුගමනය කරන ලෙස විධාන නිකුත් කරන ලදී. |
| 2017 ජනවාරි 13 | මෝටර් රථ වාහන සඳහා ලබා දෙන ණය පහසුකම් වෙනුවෙන් උපරිම වටිනාකම මත ණය අනුපාත පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කළ විධාන 2017 අයවැය යෝජනාවලට අනුව සංශෝධනය කරන ලදී. |
| 2017 පෙබරවාරි 23 | බලපත්‍රලාභී මුදල් සමාගම් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනය 2021 වසරේ ආරම්භය වන විට රුපියල් බිලියන 2.5 ක් දක්වා  ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මාර්තු 22 | 1998 සැප්තැම්බර් 07 දින නිකුත් කරන ලද උකස් ණය ලබා දීමේ කොන්දේසි සංශෝධනය කරමින් සියලුම බලපත්‍රලාභී බැංකු සඳහා නිර්ණායකයක් නිකුත් කරන ලදී. |
| 2017 ඔක්තෝබර් 26 | බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව තවදුරටත් වැඩිදියුණු කිරීම පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 නොවැම්බර් 29 | 2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම බලපත්‍රලාභී බැංකුවලට මූල්‍ය ව්‍යුත්පන්න පිළිබඳව බැංකු පනත යටතේ විධාන නිකුත් කරන ලදී. |
| 2017 දෙසැම්බර් 12 | 2018 ජනවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීම් සඳහා නව ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳව බැංකු පනත යටතේ විධානයන් සියලුම බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 16 | මූල්‍ය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අනුකූලතා රාමුව සම්බන්ධව මුදල් ව්‍යාපාර පනත යටතේ 2018 අංක 01 දරන විධානය බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නිකුත් කරන ලදී. |
| 2018 පෙබරවාරි 08 | ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් දෙමුහුන් සහ අනෙකුත් ලියාපදිංචි නොකළ මෝටර් රථ සහ මෙරට තුළ ලියාපදිංචි කර වසරකට නොවැඩි වාහන සඳහා ලබාදෙන ණය පහසුකම් මත පනවා ඇති සියයට 70 සිට සියයට 90 දක්වා පරාසයක, වටිනාකම මත ණය අනුපාත පිළිබඳ බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| 2018 මාර්තු 13 | 2018 ඔක්තෝබර් 01 දින වන විට සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් ණය ශ්‍රේණිගත කිරීම් ලබාගැනීමේ අවශ්‍යතාව පනවමින්  මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |

8